# පුස්තකාල ප්‍රවෘත්ති

ශ්‍රී ලංකා ජාතික
පුස්තකාල සේවා මණ්ඩලයේ
ප්‍රවෘත්ති ප්‍රකාශනය

4 වන කලාපය, අංක: 1/2 — 1983 ජනවාරි/ජූනි

පටුන


- කතු වැකිය ... ... 1-3
- Bibliographic Data Formats 4
- විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු 5-8
- Classification Schemes for Geography Materials 9-13
- ජාතික පුස්තකාලයෙන් ... 15-19
- මණ්ඩලීය කටයුතු ... 17-19
- Second International Conference of Directors of National Libraries 23-24
- කුඩා කාර්මික ආයතන පුස්තකාල 25-29
- A Glimpse of Library Services in Soviet Russia 31-33
- පුවත් ලුහුඬින් ... ... 35
- ප්‍රවෘත්ති-News 3,4,20,21,34,37,38,40


## පුස්තකාල අධ්‍යාපනයේ නව පිටුවක්...

— ගරු අධ්‍යාපන සේවා ඇමති

තැපැල් මාර්ගික ඉගැන්වීම් කටයුතු නූතනයේ සෑම රටකම පාහේ අධ්‍යාපන ක්ෂෙත්‍රවල විශේෂ ස්ථානයක් දරන බවත්, ඒ මගින් ඒ ඒ රටවල සම්ප්‍රදායික අධ්‍යාපන කටයුතු වලින් ඉටු කිරීමට අපහසු කාර්යයන් සාර්ථකව ඉටු කරන බව පෙනී ගොස් ඇති බවත්, ඒ නිසා පුස්තකාල හා ප්‍රවෘත්ති විද්‍යාව තැපැල් මාර්ගිකව ඉගැන්වීමට ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය ගෙන ඇති පියවර ගැන තමා ඉතාමත් සතුටු වන බවත්, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මෙහෙයවන පුස්තකාල හා ප්‍රවෘත්ති විද්‍යා තැපැල් මාර්ගික පාඨමාලාව විවෘත කරමින් ගරු අධ්‍යාපන සේවා ඇමති ලයනල් ජයතිලක මැතිතුමා කොළඹ මහජන පුස්තකාලයීය ශ්‍රවණාගාරයේදී පැවති එහි ආරම්භක රැස්වීමේදී ප්‍රකාශ කළේය.

පුස්තකාල සේවාව සංවර්ධනය කරලීම පිළිබඳව වර්තමාන රජය විශේෂ අවධානය යොමු කරන බව සඳහන් කළ ඇමතිවරයා සාර්ථක සංවර්ධන ක්‍රියාවලියක් සඳහා සංවිධානාත්මක පුස්තකාල රටාවක ඇති වැදගත්කම රජය අවබෝධ කරගෙන ඇති බව ප්‍රකාශ කළේය. තවද සාර්ථක පුස්තකාල රටාවක පදනම විධිමත් පුස්තකාල අධ්‍යාපන ක්‍රමයක් බවත් එම නිසා

(3 වන පිටුවට)

# BOOKS ON SRI LANKA FOR YOUR LIBRARY

| | *Soft Cover Rs.* | *Hard Cover Rs.* |
|---|---|---|
| **Sinhalayo**<br>Senerat Paranavitana | 50/- | 75/- |
| **Ceylon : History in Stone**<br>R. Raven-Hart | 100/- | 160/- |
| **Seeing Ceylon**<br>R. L. Brohier | 90/- | 125/- |
| **Discovering Ceylon**<br>R. L. Brohier | 125/- | 150/- |
| **Some Mahavamsa Places**<br>Maureen Seneviratne | 45/- | |
| **Food and the People**<br>R. L. Brohier | 30/- | |
| **Wild Flowers of Ceylon**<br>Dorothy Fernando | 135/- | |
| **Guide to Sri Lanka**<br>H. A. J. Hulugalle | 120/- | |
| **Guide de Sri Lanka** (*French*)<br>H. A. J. Hulugalle | 120/- | |
| **Value Orientations and Nation Building**<br>Padmasiri de Silva | 10/- | |

**AVAILABLE AT ALL LEADING BOOKSELLERS**

Publishers & Distributors

# LAKE HOUSE INVESTMENTS LIMITED

**41, W. A. D. Ramanayake Mawatha,**
**Colombo 2**

(1 වන පිටුවෙන්)

තම අධ්‍යාපන කටයුතු නිසි අන්දමට මෙහෙයවීම පුස්තකාල අධ්‍යාපන කටයුතුවලට සම්බන්ධ දිවයිනේ සියළුම ආයතන සහ සංවිධානවලින් රජය බලාපොරොත්තු වන බවත් එතුමා පැවසීය. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මේ පිළිබඳව අවදියෙන් සිටිනු ඇතැයි රජය බලාපොරොත්තු වන බවත්, පුස්තකාල අධ්‍යාපන කටයුතු ක්‍රමානුකූලව ඉටුකරලීමට අනෙකුත් අධ්‍යාපන ආයතනවලට මග පෙන්වීම පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රධාන වගකීමක් බවත් සිහිපත් කළේය.

දිවයිනේ දුෂ්කර පළාත්වල සේවය කරන වෘත්තීය සුදුසුකම් නොමැති පුස්තකාලයාධිපතීන් පුහුණු කරලීම ඉලක්ක කර ගෙන තැපැල් මාර්ගික පාඨමාලාව ආරම්භ කරලීම උතුම් කාර්යයක් බවත්, මෙබඳු පාඨමාලාවක අවශ්‍යතාවය දැනට වසර ගණනාවක සිට දක්නට ලැබුණ අතර, එය සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවායි තමා ප්‍රාර්ථනා කරන බවද, එතුමා තව දුරටත් පැවැසීය. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, නොමිලේ පාසැල් පොත් බෙදදීම, අති විශාල මුදල් සම්භාරයක් අධ්‍යාපන කටයුතුවලට වැය කිරීම ආදිය මගින් වර්තමාන රජය අපේක්ෂා කරනුයේ ද පහසුකම් නොමැති අය වෙත වැඩි වැඩියෙන් අධ්‍යාපන කටයුතු ව්‍යාප්ත කරලීම වන අතර, තම අමාත්‍යාංශය යටතේ ඇති පුස්තකාල සේවා මණ්ඩලය මගින් එම පරමාර්ථ වලට අනුකූලව මෙබඳු පාඨමාලාවක් ආරම්භ කරලීම ගැන තමා අතිශයින් සතුටුවන බවත් පැවසීය.

ලංකාවේ ප්‍රථම වරට තැපැල් මාර්ගයෙන් පුස්තකාල විද්‍යාව ඉගැන්වීමට සැලසුම් කිරීම මණ්ඩලය විසින් ගත් ඉතා වැදගත් පියවරක් බවත්, එය පුස්තකාල ක්ෂේත්‍රයේ පමණක් නොව අධ්‍යාපන ක්ෂේත්‍රයේද වැදගත් ස්ථානයක් ලෙස සැලකිමු සුදුසු බවත්, පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති එස්. අතුකෝරාළ මහතා ප්‍රකාශ කළේය.

සම්මන්ත්‍රණයේ ආරම්භක දේශනය කළ ජාතික පුස්තකාල සේවා අධ්‍යක්ෂ එන්. අමරසිංහ මහතා කථා කරමින්, ආර්ථික හා සාමාජීය සංවර්ධනය කෙරෙහි රජය මහත් පරිශ්‍රමයක් දරණ මේ යුගයේ පුස්තකාල වලින් ලැබිය යුතු සේවය මෙම ව්‍යාපාරවලට ප්‍රයෝජනවත් වියයුතු අන්දමට සකස් වියයුතු බවත්, ඒ සඳහා නව ආකල්පයකින් පුස්තකාල සේවා සැලසුම් කළ යුතු බවත්, සඳහන් කළේය. මෙතෙක් පොත්ගුල් වශයෙන් පැවැත ආ මෙම ආයතන කාර්‍යශීලී තොරතුරු මධ්‍යස්ථාන ලෙස වෙනස් වියයුතු බවත්, ඒ සඳහා පුස්තකාල ආකල්පය වෙනස් කලයුතු බවත් අවධාරණය කළේය.

පළාත් පාලන කොමසාරිස් පැරකුම් විජේසිංහ මහතා කථා කරමින් තැපැල් මාර්ගික පාඨමාලාව පළාත් පාලන පුස්තකාල සේවාවේ විශාල ඉදිරි පියවරක් ලෙස සැලකිය හැකි බව ප්‍රකාශ කළේය. මෙම පාඨමාලාව පළාත් පාලන පුස්තකාලයාධිපතීනට පමණක් සීමා නොවුව ද, වඩාත් වැඩි ප්‍රයෝජනයක් ලබා ගනුයේ පළාත් පාලන ක්ෂෙත්‍රයේ දුෂ්කර පළාත්වල සේවය කරන පුස්තකාලයාධිපතීන් බවද ඒ නිසා තම දෙපාර්තමේන්තුවේ ස්තුති පූර්වක කෘතඥතාවය පුස්තකාල මණ්ඩලයට හිමි වන බවද, කොමසාරිස්වරයා පැවසීය.

බ්‍රිතාන්‍ය මණ්ඩල පුස්තකාල අධ්‍යාපන උපදේශක ඇන් අර්වින් මහත්මිය කථා කරමින් පුස්තකාල අධ්‍යාපන පහසුකම් සීමිත ශ්‍රී ලංකාව වැනි රටවල් සඳහා තැපැල් මාර්ගික පුස්තකාල අධ්‍යාපන පාඨමාලා හඳුන්වා දීම සාර්ථක පිළියමක් බව තමා විශ්වාස කරන බවත්, මෙම අ රම්භක උත්සවයට සහභාගිවීමට ලැබීම ගැන තමා ඉතාමත් සතුටු වන බවත්, මෙය සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි තමා ප්‍රාර්ථනා කරන බවත් පැවසීය.

අග්‍රාමාත්‍ය කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් බී. ලියනමාන සහ පුස්තකාල අධ්‍යාපන අංශයේ සහකාර අධ්‍යක්ෂ එම්. එස්. යූ. අමරසිරි යන මහත්වරුද මෙහිදී කථා කළහ.

පාඨමාලාව සඳහා තෝරා ගත් ශිෂ්‍යයින් ලියා පදිංචි කරලීමත්, පාඨමාලාව පිළිබඳ තොරතුරු අඩංගු අත්පොත සහ පළමු වාරය සඳහා නියමිත පාඨමාලා හා අතිරේක කියවීම් ද්‍රව්‍ය බෙදා දීමත් මෙදින සිදුකරන ලදී.

# ✶ නව පාසල් පුස්තකාලයක්

**කොළඹ 7, සිරිමා බණ්ඩාරනායක බාලිකා විද්‍යාලීය පුස්තකාලය 83. 05. 11 දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.** ඒ සඳහා අධ්‍යාපන සේවා අමාත්‍යාංශයෙන් රු. 8,000 ක් වටිනා පොත් පත් හා රු. 50,000 ක් වටිනා ලී බඩු උපකරණ ද ලබා දෙනලදී. ශ්‍රී ලංකා පුස්තකාල සේවා මණ්ඩලයෙන් රු. 9,000 ක් පමණ වටිනා පොත් කට්ටලයක් මණ්ඩලයේ සභාපති එස්. අතුකෝරාළ මහතා විසින් මෙදින පරිත්‍යාග කළ අතර, ප්‍රදර්ශනයක් සහ පෝස්ටර් තරඟයක් සංවිධානය කිරීම ශ්‍රී ලංකා පුස්තකාල සේවා මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ නාලිනී ද සිල්වා මෙනෙවිය විසින් සිදු කරන ලදී. විදුහල්පතිනි ආර්. ඇම්. එල්. ජයසේකර මහත්මිය ඇතුළු ආචාර්‍ය මණ්ඩලය සහ ගුරු දෙගුරු සංගමය පුස්තකාලය සඳහා වැදගත් පොත්පත් රාශියක් පරිත්‍යාග වශයෙන් ලබා ගැනීම සඳහා කටයුතු කර තිබුණි.

## පුස්තකාල ප්‍රවෘත්ති අරඹා දස වසරයි!

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් පුස්තකාල ප්‍රවෘත්ති ප්‍රකාශනය පළ කිරීම අරඹා 1983 ජනවාරි මසට වර්ෂ 10 ක් සම්පූර්ණ වන බව සතුටින් නිවේදනය කරන්නේ දිවයිනේ පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයේ අඛණ්ඩ ප්‍රකාශන වාර්තාවක් සහිත එකම ප්‍රකාශනය ලෙසද ලබා ඇති කීර්තියද සනිටුහන් කරමිනි. ආරම්භයේදී රෝනියෝ මුද්‍රිත ස්වරූපයෙන් ප්‍රකාශයට පැමිණ වූ මෙම ප්‍රකාශනය, 1979 දී 'ටැබ්ලොයිඩ්' ප්‍රමාණයේ පුවත්පතක් ලෙසින් පළවී, ඉන් අනතුරුව 1981 දී එහි වර්තමාන ස්වරූපයෙන් ප්‍රකාශණය ඇරඹිණි. මුලින් සියලු පුස්තකාල අතර නොමිලයේ බෙදා හරින ලද මෙය දැන් සහන දයක මුදලකට අලෙවි කරනු ලැබේ.

# BIBLIOGRAPHIC DATA FORMATS

## AUTOMATED INFORMATION STORAGE AND RETRIEVAL

An account of the Meeting of Librarians held at the Colombo Public Library on 21.01.83.

**The National Library Services Board organized a successful meeting to discuss computerized bibliographic formats on the eve of SLSTIC launching its computerized Union Catalogue, UNICAST.** Around 80 invitations were sent out and it was attended by 55 participants who considered the topic sufficiently important to take almost half a working day off their busy schedules. This itself was most encouraging.

Chairman, SLNLSB, Mr. S. Atukorale delivered the welcome address and said that it is essential for all interested parties to be associated with a project of this nature at its outset itself in order to arrive at a common understanding. We already have apart from UNICAST a Union Catalogue on Development Information, and the National Library too is planning to compile a Union Catalogue, he added. Hence we should identify what problems we are likely to face and seek better alternatives.

Director, SLNLSB, Mr. N. Amarasinghe briefly outlined the Board's interest in the field of standardization and said that the Board has already formed a National Standards Committee which will be responsible to formulate standards in all fields of library activities. This work is carried out in association with the Bureau of Ceylon Standards, which is the National Standards body. Mr. Amarasinghe said that standardization promotes economy and consistent quality, while it also encourages interchangeability. On the subject of Standardization of a bibliographic format for Computerized Union Catalogues he explained that the Union Catalogue that will be compiled by the National Library will be based on a format compatible with other formats in use although the format for the National Library catalogue will include all the elements listed in a detailed format such as MARC/UNIMARC. A Union Catalogue being a location device may not need such detailed entries but it would be best if the formats adopted are within the main framework.

He also added that advent of computers to the library world had revolutionized information processing and also the so-called house keeping activities in libraries. The Board has a national interest in promoting standardization in library activities for the benefit of all libraries in the national system. Director, SLNLSB. further said that there should be uniformity in cataloguing practices in libraries, especially in regard to author/title headings and mentioned that the National Library is planning to create and maintain authority files on author headings and uniform titles.

Mr. N. U. Yapa, Director/NRESA thanked the Board for convening this meeting and explained to those present, how newer and latest computer technologies allow libraries to exploit information as never before. Computers have entered all kinds of establishments in Sri Lanka during a very short period and today one does not require vast financial resources to purchase a computer. Improved storage methods resulting in economy will be a boon to all librarians he said. Networking has made it possible to consolidate resource bases and computers make this a very simple task.

Touching on the technical problems envisaged in a joint venture of this nature, Mr. Yapa said due to the diversity of resource contents and user requirements, different methods and systems are followed by various libraries and information centres. There are a number of classification schemes that are being followed by various libraries and sometimes although two libraries will be using the same scheme they could be different editions.

In providing subject index terms and keywords too it has to be decided from which particular source these are to be selected. Another similar problem that is envisaged is the need to transliterate entries recorded in Sinhala and Tamil scripts for input into the data bank. A standard form should be used by all participating libraries.

Implementation of the project is phased out in to three, as follows :

Phase 1 — (*a*) SLSTIC will provide accession lists to participating libraries.

(*b*) Prepare subject bibliographies.

(*Contd. on page* 8)

# විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු

## කුඩා මහජන පුස්තකාලයකට ලබා ගැනීම හා සංවිධානය

**එන්. යූ. යාපා**

අධ්‍යක්ෂ (තොරතුරු)

ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා අධිකාරිය

පුස්තකාලයකට විද්‍යා හා තාක්ෂණික තොරතුරු සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී හා ඒවා සංවිධානය කිරීමේදී මුහුණ පාන්නට සිදුවන ගැටළු කිහිපයක් ඇත. සාමාන්‍යයෙන් මහජන පුස්තකාල, විශ්ව විද්‍යාල පුස්තකාල හා විශේෂ පුස්තකාල මෙම විෂයයන් ආවරණය කරන පුස්තකාල ලෙස සැලකිය හැකිය. යම් පුස්තකාලයක් විද්‍යා හා තාක්ෂණික විෂයයන් පිළිබඳ තොරතුරු සංවිධානය කිරීමේදී පැන නගින ප්‍රශ්න 4 කි. එනම්:

1. විෂය පථයේ ඇති විශාලත්වය.
2. බුද්ධි මට්ටම හෙවත් පාඨක වර්ගය.
3. තොරතුරු වල නවතාවය හා
4. භාෂාව ය.

1. මෙහිදී විෂය පථයේ ඇති විශාලත්වය ගැන කල්පනා කර බලන විට විද්‍යා හා තාක්ෂණික යන වගන්තියෙන් ඉතාම පුළුල් විෂයක් ආවරණය වන බව පෙනේ. විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ උනන්දුවක් දක්වන මෙවැනි යුගයක පාඨකයන් සඳහා තොරතුරු සැපයීමේදී විෂය සම්පූර්ණයෙන් ආවරණය කිරීම දුෂ්කර කාර්යයකි. මේ අනුව විද්‍යා හා තාක්ෂණය යන විෂයට අලුත් විෂයයන් එක්වීම නිරායාසයෙන් සිදුවේ. අප පුස්තකාල විද්‍යාව හැදෑරීමේදී දුක ඇති පරිදි ඩිවි වර්ගීකරණයේ සමහර කලා විෂයන් අද විද්‍යා විෂයන් බවට පරිවර්තනය වෙමින් පවතී. උදහරණ ලෙස 710,720,770, වැනි කලා විෂයයන් සමහරක විද්‍යාත්මක කරුණුද අඩංගු වන අතර, 300 සමාජ විද්‍යාවට අයත් සමහර කොටස්ද විද්‍යා විෂයන් ලෙස පරිවර්තනය වෙමින් පවතී. මෙ අනුව විද්‍යා හා තාක්ෂණ විෂය තුළ විශාල, පුළුල් විෂය පථයක් අඩංගු බව කිව හැකිය. එම නිසා විද්‍යා හා තාක්ෂණය විෂය මුළුමනින්ම ආවරණය කිරීම මොනම පුස්තකාලයකට වුවත් දුෂ්කර කාර්යයකි.

### පාඨක වර්ග

2. බුද්ධි මට්ටම හෙවත් පාඨක වර්ගය. මෙහිදී පුස්තකාලය පරිහරණය කරන පාඨක වර්ගය ගැන සලකා බැලිය යුතුය. සාමාන්‍යයෙන් මහජන පුස්තකාලයක පාඨකයන් ලෙස පාසැල් ශිෂ්‍යයන්, සාමාන්‍ය මහජනයා හා විශේෂඥයන් වශයෙන් පාඨකයින් තුන් වර්ගයකට වෙන් කළ හැකිය. එක් විෂයක් පිළිබඳව වුවද විවිධ මට්ටම්වල පාඨකයන් සඳහා අවශ්‍ය වන දැනුම ද විවිධය. මේ අනුව පාසැල් ශිෂ්‍යයන්ට අවශ්‍ය දැනුම සැපයීමේදී අනුගමනය කරන පිළිවෙල මහජනයාට අවශ්‍ය දැනුම සැපයීමේ ක්‍රමයට හාත්පසින්ම වෙනස් ස්වරූපයක් ගනී. එක් එක් පුද්ගලයන්ගේ දැනුම අවබෝධ කර ගැනීමේ හා තේරුම් ගැනීමේ හැකියාව වෙනස් වන නිසා විවිධ තරාතිරම්වල පාඨකයන්ට ඔවුන්ගේ බුද්ධි මට්ටම අනුව අවශ්‍ය තොරතුරු සැපයීම කළ යුතුවේ.

3 තොරතුරු වල නවතාවය. විශේෂයෙන්ම විද්‍යා හා තාක්ෂණය පිළිබඳ තොරතුරු ඉක්මනින්ම වෙනස් වන සුළුය. යම් විෂයක් පිළිබඳව ලියැවී පැරණි තොරතුරකට වඩා නව තොරතුරක් අලුත් සොයා ගැනීමක් ඇත්නම් එහි වැඩි වටිනාකමක් ඇත. උදහරණයක් ලෙස ගුවන් විදුලි යන්ත්‍රයක් පිළිබඳ තොරතුරු විමසන්නෙකුට 1960 වර්ෂයේ ප්‍රකාශිත පොතක් දීමට වඩා නව සොයාගැනීම්, නව තොරතුරු අඩංගු වර්තමානයේ ප්‍රකාශිත ග්‍රන්ථයක් ලබා දීම වඩා සුදුසුය. මේ අනුව පාඨකයන්ට තොරතුරු සැපයීමේදී ඔවුන්ගේ අවශ්‍යතාවය අනුව නව තොරතුරු සැපයීම පුස්තකාලයේ පරමාර්ථය විය යුතුය.

4. භාෂාව. විද්‍යා හා තාක්ෂණය විෂයයන් සම්බන්ධයෙන් 'භාෂාව' පුස්තකාලයකට මුහුණ පාන්නට වන බැරෑරුම් ප්‍රශ්නයකි. බොහෝ විට මෙම විෂය සම්බන්ධයෙන් ඇති ප්‍රලේඛන වැඩි ප්‍රමාණයක් ප්‍රකාශ වී ඇත්තේ ඉංග්‍රීසි භාෂාවෙන් හෝ විදේශ භාෂාවලිනි. බොහෝ විට මහජන පුස්තකාලයක පාඨකයනට මෙම ප්‍රශ්ණයට මුහුණ පෑමට සිදුවේ. විද්‍යා හා තාක්ෂණය පිළිබඳ සිංහල හෝ දෙමළ භාෂාවලින් ප්‍රචලිත පොත් දුලබය.

### විෂය ආවරණය

සාමාන්‍යයෙන් විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධයෙන් දැනුම සංවිධානය කරන පර්යේෂණ ආයතන, විශ්ව විද්‍යාල, විශේෂ පුස්තකාල ආදී විද්‍යා පුස්තකාලවලට ඉහත කී ප්‍රශ්ණවලට මුහුණ දීමට සිදුවේ. මෙහිදී පුස්තකාලය ආවරණය කරන විෂයයන් තෝරා ගැනීම පළමුව කළ යුතුය. කිසිම පුස්තකාලයකට ස්වාධීනව කටයුතු කිරීමේ හැකියාවක් නොමැත. විශේෂයෙන් විද්‍යා විෂයන් සම්බන්ධයෙන් තොරතුරු එකතු කිරීමේදී විශේෂ විශේෂඥතාවක් ඇති කර ගැනීමට බොහෝ විශේෂ පුස්තකාල සිරිතක් කොට ගෙන ඇත. මෙලෙස තෝරාගත් විෂයන් සම්බන්ධයෙන් සම්පූර්ණ අවධානය යොමු කොට තම පුස්තකාලයේ ග්‍රන්ථ සම්භාරය ගොඩ නගා ගන්නට උත්සාහ කළ යුතුය.

මේ සඳහා ලංකාවේ විද්‍යා පුස්තකාල අතර අන්තර් සහයෝගීතාව ඇති කොට පුස්තකාල සම්පත් පොදුවේ පරිහරණයට අවස්ථා සලසා ඇත. ලංකාවේ විද්‍යා පුස්තකාලවලින් දැනීම සපයන්නේ විශේෂඥයන් සඳහා නියා පාසල් ශිෂ්‍යයන්ටත් මහජනතාවටත් සේවා සලසන මහජන පුස්තකාලවලට මෙන් දැනුම මට්ටමේ ප්‍රශ්ණයක් විද්‍යා පුස්තකාලවලට ඇති නොවේ. සාමාන්‍යයෙන් පුස්තකාලයක් සභරා සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරයි. විද්‍යා හා තාක්ෂණය සම්බන්ධයෙන් තොරතුරු වෙනස් වන මෙවැනි යුගයක සභරා වැඩි

වැඩියෙන් ලබා ගැනීමෙන්, තාක්ෂණ වාර්තා ලබා ගැනීමෙන්, අලුත් තොරතුරු ග්‍රන්ථ සම්භාරයට එකතු කිරීමෙන් දැනීම අලුත් කර ගත හැකිය. මේ අනුව තොරතුරුවල නවතාවයක් ඇති කොට පාඨකයන්ගේ ප්‍රශ්න වලට පිළිතුරු සැපයිය හැකිය. භාෂාව සම්බන්ධයෙන් විද්‍යා පුස්තකාලවලට ප්‍රශ්නයක් ඇති නොවේ. විද්‍යාඥයන්, පර්යේෂකයන් වැනි ඉංග්‍රීසි උගත් අයට විද්‍යා පුස්තකාල පරිහරණයේදී අපහසුතාවක් ඇති නොවේ.

## පාඨක අවශ්‍යතා

නමුත් මහජන පුස්තකාලවලට මුහුණ පාන්නට සිදුවී ඇත්තේ මීට හාත්පසින්ම වෙනස් තත්ත්වයකටය. පොදුවේ මහජනයාට සේවා සලසන මහජන පුස්තකාලයකට විෂයන් කීපයක් තෝරා ගැනීමේ හැකියාවක් නොමැත. මෙහිදී සාමාන්‍ය මහජන පුස්තකාලයක් හෝ කුඩා මධ්‍යම ප්‍රමාණයේ මහජන පුස්තකාලයකට අවශ්‍ය විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ දැනීම සංවිධානය කිරීමේදී අපි කල්පනාවට ගත යුතු කරුණු මොනවාද කියා සලකා බලමු. පුස්තකාලයක දැනීම සංවිධානය කිරීමේදී පළමුවෙන්ම පාඨකයන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම කළ යුතුය. පුස්තකාලයක ග්‍රන්ථ සම්භාරය හෝ සේවාවන් සියල්ලක්ම සංවිධානය විය යුත්තේ පාඨකයන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීමටය.

විද්‍යාව පිළිබඳව මහජන පුස්තකාලයක පාඨකයන්ගේ අවශ්‍යතාවයන් කොටස් දෙකකට බෙදීමට පුළුවන. (1) ශිෂ්‍යයන්ගේ අවශ්‍යතාවය. ඊට හේතුව වී ඇත්තේ මහජන පුස්තකාලයකට පාසැල් ශිෂ්‍ය පාඨකයන් විශාල පිරිසක් සිටීමයි. යම් ශිෂ්‍යයෙක් තමන්ගේ අධ්‍යාපන කටයුතු වලට අදල විද්‍යා හා තාක්ෂණ විෂය සම්බන්ධයෙන් දැනුම ලබා ගැනීමට, ඇති දැනුම දියුණු කර ගැනීමට පාසැල් පුස්තකාලයෙන් නොහැකි වූ විට ඒ සඳහා මහජන පුස්තකාලය උපයෝගී කර ගනියි. (2) මහජනතාවගේ අවශ්‍යතාවයන්. මහජනයාගේ විද්‍යා අවබෝධය පිළිබඳව ඇති වී තිබෙන අවශ්‍යතාවයන් සපුරාලීමටද විද්‍යා හා තාක්ෂණික තොරතුරු සංවිධානය කරන මහජන පුස්තකාලයක් සමත් විය යුතුය. සාමාන්‍ය මහජනතාව තමන්ගේ ජීවන තත්ත්වය නංවාලීම උදෙසා විද්‍යාව පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම අවශ්‍ය යැයි පිළිගෙන ඇති මතයකි. තවද විද්‍යාව ජනප්‍රිය කිරීම පිළිබඳව යුනෙස්කෝව ඇතුලු නොයෙකුත් ජාත්‍යන්තර සම්මේලනද උනන්දුවක් දක්වමින් කටයුතු කරන බව පෙනේ. විශේෂයෙන් මහජනතාවගේ ජීවන තත්ත්වය දියුණු කර ගැනීමට අද පවත්නා ලෝක තත්ත්වය අනුව විද්‍යා අවබෝධයක් අවශ්‍ය හෙයින් ඒ අනුව මහජන පුස්තකාලය සංවිධානය විය යුතුය.

මෙසේ මහජන පුස්තකාලයක විද්‍යා හා තාක්ෂණික විෂයයන් සංවිධානයේදී ශිෂ්‍ය පාඨකයනගේ හා මහජනයාගේ අවශ්‍යතාවන් සපුරාලීමට කටයුතු කරන්නේ කෙසේද යන්න සලකා බලමු. ශිෂ්‍යයන්ගේ මූලික අවශ්‍යතාවය වන්නේ අධ්‍යාපනය සඳහා අවශ්‍ය පොතපත ලබා ගැනීමයි. මෙහිදී ඔවුන් පරිහරණය කරන පාඨක ද්‍රව්‍ය කොටස් 3 කට බෙදිය හැකිය: (1) පාඨ ග්‍රන්ථ. (2) පාඨ ග්‍රන්ථ නොවන පොත් : එනම් අතිරේක කියවීම් පොත්. (3) සඟරා යනාදියයි. පාඨ ග්‍රන්ථ සම්බන්ධයෙන් අප කටයුතු කළ යුතු ආකාරය ගැන සලකා බලමු.

සාමාන්‍යයෙන් විද්‍යා පාඨ ග්‍රන්ථවල මිළ අධිකය. ඒ නිසා කුඩා පුස්තකාලයකට එම පොත් මිලදී ගැනීමට අපහසුය. පාසැල් ශිෂ්‍යයන්ට අවශ්‍ය පාඨ ග්‍රන්ථ බොහොමයක් පාසැල් පුස්තකාල මගින් ලබා ගත හැකි වුවත්, පුස්තකාල නොමැති පාසැල්වල ශිෂ්‍යයන්ට මහජන පුස්තකාලයකින් ඒ අවශ්‍යතාවය සපුරා ගැනීමට සිදුවේ. ඒ සඳහා මහජන පුස්තකාලවල පාසැල් සිසුන් සඳහා අවශ්‍ය පාඨ ග්‍රන්ථ රැස් කළ යුතුවේ. එහෙත් මහජන පුස්තකාලයකට ස්වාධීනව මේ කටයුත්ත කිරීම අපහසුය. එහෙත් දිස්ත්‍රික් මට්ටමින් මෙය කළ හැකිය.

ඒ අනුව දිස්ත්‍රික් මට්ටමේ පුස්තකාල මගින් පාඨ ග්‍රන්ථ එක් රැස් කොට දිස්ත්‍රික් පුස්තකාල, කුඩා පුස්තකාලවලට සම්බන්ධ කරන්නට වැඩ පිළිවෙලක් ආරම්භ කළ හැකිය. මෙම ග්‍රන්ථ, පුස්තකාල පිරුළු ක්‍රමය මගින් කුඩා මහජන පුස්තකාලවලට ලබාදීමේ සේවාවක් සැලසිය හැකිය. මෙහිදී කුඩා මහජන පුස්තකාලයාධිපතීන්ගේ මාර්ගයෙන් පාසැල්වල ඇති අඩුපාඩුකම් හා අවශ්‍යතා ගැන අවබෝධයක් ලබා ගත යුතුය. මේ අන්දමින් පාසැල් පුස්තකාලයෙන් තමන්ගේ අවශ්‍යතාවයන් ඉටු කර ගත නොහැකි ශිෂ්‍යයින්ට මහජන පුස්තකාලයෙන් එම කාර්යය ඉටු කර දීමට හැකිවේ.

තවද යම් පාසැල් පුස්තකාලයක හොඳ ග්‍රන්ථ එකතුවක් ඇති විට ඒ අසල ඇති මහජන පුස්තකාලයත් එවැනිම ග්‍රන්ථ එකතුවක් ගොඩ නගා ගැනීමට වෙහෙසීම අවශ්‍ය නොවේ. අප නිතරම මහන්සි ගත යුත්තේ ඇති සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමටය. ඇති සේවාවක් නැවතත් ආරම්භ කිරීමට වඩා නැති සේවාවක් ආරම්භ කිරීම වඩා ඵලදායී වේ. පාසැල් සඳහා පත්කර ඇති විද්‍යා අධ්‍යාපන නිලධාරීන්ගේ මාර්ගයන්ගේ අවශ්‍යතා ගැන නිවැරදි වැටහීමක් ලබා ගත යුතුය.

## සඟරා

පාඨ ග්‍රන්ථ නොවන පොත් එකතුවක් ද මහජන පුස්තකාලයට ලබා ගත යුතුය. මේ සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විද්‍යා සම්බන්ධයෙන් කටයුතු කරන අංශයෙන් උපදෙස් ගත හැකිය. ජාතික වශයෙන් කටයුතු කරන්නෙ නම් ඒ සඳහා පුස්තකාල සේවා මණ්ඩලයට මේ කාර්යය ඉෂ්ට කිරීමට පුළුවන. අනෙක් අවශ්‍යතාවය ලෙස සඟරා ලබා ගැනීම සඳහන් කළ හැකිය. පාසැල් ශිෂ්‍යයන් සඳහා ලංකාවේ සිංහලෙන් පළවී ඇති සඟරා කිහිපයකි. **විද්‍යා ව්‍යාප්ති, විද්‍යා, විදුරාව** ආදිය මින් සමහරකි. සාමාන්‍යයෙන් මිළ අඩු මෙවැනි සඟරා පාසැල් සිසුන්ගේ දැනුම වර්ධනය කර ගැනීමෙහිලා බොහෝ ප්‍රයෝජනවත් වේ. මෙයින් ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය මගින් ප්‍රකාශයට පත් කරනු ලබන **විද්‍යා ව්‍යාප්ති සඟරාව** පාසැල් සිසුන් අතර බොහෝ ජනප්‍රියව ඇත. තවද මෙම සංගමයේ විද්‍යාව ජනප්‍රිය කිරීමේ අංශය යනුවෙන් වෙනම අංශයක් ද ඇත. සිංහල භාෂාවෙන් ප්‍රකාශිත මෙම දේශීය සඟරා සියල්ල ඉතා අඩු මිලකට ලබා ගත හැකිය.

ඉංග්‍රීසි සඟරා පිළිබඳව සලකා බැලීමේදී දේශීය සඟරා හිඟය. බොහොමයක් විදේශීය සඟරා වේ. මෙයින් ජනප්‍රිය සඟරා ලෙස **'පොපියුලර් මිකැනික්,' පොපියුලර් සයන්ස්, වයර්ලස් වර්ල්ඩ්, සයන්ස් ඩයිජෙස්ට්** සඳහන් කළ හැක. පාසැල් සිසුන්ට මෙන්ම මහජනයාටද සාමාන්‍ය විද්‍යා අවබෝධය සඳහා මේ

සඟරා බොහෝ ප්‍රයෝජනවත්ය. එහෙත් මෙම සඟරා මිල අධික විය හැකිය. එම නිසා සාමාන්‍ය කුඩා පුස්තකාලයකට මිලදී ගැනීම අසීරු වේ. එම නිසා මෙවැනි සඟරා මිලදී ගැනීමේදී දිස්ත්‍රික් මට්ටමින් එක් එක් පුස්තකාල සඟරා තෝරා ගෙන ලබා ගැනීම වඩා උචිතය. මේ අනුව පාසැල් ශිෂ්‍යයන් සඳහා අවශ්‍ය විද්‍යා දැනුම ලබා ගැනීමට මහජන පුස්තකාලය සංවිධානය කළ හැකිය.

## විද්‍යාව ජනප්‍රිය කිරීම

සාමාන්‍ය මහජනතාවගේ විද්‍යා හා තාක්ෂණික දැනුම මහජන පුස්තකාලයක් සංවිධානය කිරීමේදී පාඨක අවශ්‍යතාවන් අනුව කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකිය. (1) මහජනතාවගේ ජීවන තත්ත්වය නගාලීම සඳහා දැනීම ලබා දීම. (2) ස්වයං රැකියාවක් ඇරඹීමට අවශ්‍ය දැනුම ලබාදීම.

මහජනයාගේ ජීවන තත්ත්වය නැංවීම සඳහා එනම්: **සෞඛ්‍යය හා පරිසරය** වැනි දේ **සම්බන්ධයෙන් යහපත්** අධ්‍යාපනයක් ලබා දිය යුතුය. සෞඛ්‍යය පිළිබඳ ප්‍රශ්ණය විද්‍යාව ජනප්‍රිය කිරීමේ මූලික අංගයක් වශයෙන් තෝරාගෙන ඇති කරුණකි. ඒ අනුව ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය නැංවිය හැකිය. විශේෂයෙන් ලෙඩරෝග සම්බන්ධයෙන්, ආහාර හා පෝෂණය සම්බන්ධයෙන් අප තුළ වැරදි මත තිබීමට පුළුවන. එම නිසා මහජනයාගේ මෙවැනි ප්‍රශ්න වලට පිළිතුරු සොයා ගැනීමට මහජන පුස්තකාලය ඉතාම සුදුසු ස්ථානයන් ලෙස සැලකිය හැක.

කෘෂිකර්මය, ධීවර කර්මාන්තය, සත්ව පාලනය හා කුඩා කර්මාන්ත ආදියෙහි නියැලි මහජනයාට එදිනෙදා ජීවිතයෙහි ගෙදර දොරේ කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය වන විද්‍යාව පිළිබඳ දැනීම පුළුල් කර ගැනීමට වුවද ඔවුන් මහජන පුස්තකාලය වෙත පිවිසෙනු ඇත. මෙවැනි අවස්ථාවක මහජන පුස්තකාලයක් පොත් බැහැරදෙන පුස්තකාලයක් ලෙස කටයුතු කරනවාට වඩා තොරතුරු සපයන මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීමට සිදුවේ. පාඨක ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා ග්‍රන්ථ පමණක් නොව, වෙනත් තැනකින් ලබා ගත් තොරතුරු ඒ ඒ පුද්ගලයන් වෙත යොමු කිරීමටද සිදුවේ. සමහර විට පාඨකයා වෙනත් පුස්තකාලයක්, ආයතනයක් හෝ මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට සිදුවේ.

මෙසේ පාඨකයා යොමු කිරීම සඳහා මහජන පුස්තකාලය එවැනි සේවා සපයන, තොරතුරු සොයා ගත හැකි පුස්තකාල හා ආයතන පිළිබඳ දැනීමක් ලබා තිබිය යුතුය. ඇතැම් ආයතනවල මෙවැනි කටයුතු කිරීම පිණිස නිලධාරීන් පත්කොට ඇත. උදහරණ ලෙස කෘෂිකර්මය සම්බන්ධයෙන් මහජනයාට තොරතුරු සපයන කෘෂිකර්ම නිලධාරීන්, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය නිලධාරීන් ආදී වශයෙන් ඒ ඒ විෂයන් පිළිබඳ දැනුමැති පුද්ගලයන්ගෙන් විමසිය හැකිය. මෙලෙස තොරතුරු සපයා ගත හැකි පුද්ගලයන් පිළිබඳ ලැයිස්තු, ආයතන පිළිබඳ ලැයිස්තු මහජන පුස්තකාලයක් සතුව තිබිය යුතුය. උදා. : තොරතුරු සංග්‍රහයක් (ඩිරෙක්ටරි).

පුස්තකාලයක මෙවැනි තොරතුරු ප්‍රභවයන් මෙන්ම ප්‍රලේඛන ද අවශ්‍ය වේ. ප්‍රලේඛන ලෙස පොත්පත්, සඟරා, ප්‍රවෘත්ති පත්‍ර ගත හැකිය. පොත්පත් ලබා ගැනීමේදී ඊට අදාල විෂයට සම්බන්ධ ග්‍රන්ථ පුස්තකාල සේවා මණ්ඩලය මගින් ප්‍රකාශයට පත් කරන ජාතික ග්‍රන්ථ නාමාවලිය, විශ්ව විද්‍යාල පුස්තකාලයක හෝ විශාල මහජන පුස්තකාලයක ප්‍රතිග්‍රහණ ලැයිස්තු ආදිය ලබාගෙන එමගින් ඒ ඒ විෂයයන් යටතේ ඇති පොත්පත් මොනවාද කියා දැන ගත හැකිය. සාමාන්‍යයෙන් විද්‍යා විෂයන් සම්බන්ධයෙන් ලංකාවේ පළවී ඇති පොත් ප්‍රමාණය ඉතා සීමිතය. පොදුවේ මහජනයාට නිතර අවශ්‍ය වන විෂයන් වන වාත දූෂණය, බලශක්ති, ජල දූෂණය, කෘෂිකර්මය හා සත්ව පාලනය වැනි විෂයයන් කිපයක් තෝරාගෙන ඒවා කෙරෙහි වැඩි අවධානයක් යොමු කොට තොරතුරු එකතු කිරීම වඩා වැදගත්ය.

## එදිනෙද තොරතුරු

තවද මහජනතාවගේ එදිනෙද කටයුතුවලදී අවශ්‍ය වන විද්‍යා දැනුම ලබා ගැනීම සඳහා සඟරා ද ඉතා අවශ්‍ය වේ. මෙම සඟරා අතුරින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පළ කරන **කෘෂිකර්ම සඟරාව,** ගොවි කටයුතු පර්යේෂණ ආයතනයේ **ගොවි ජනතාව,** කර්මාන්ත සංවර්ධන මණ්ඩලය මගින් පළ කරන **කර්මාන්ත සඟරාව,** මහජන සෞඛ්‍ය පිළිබඳව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පළ කරන **සැපත සඟරාව** ද මහජනයාගේ එදිනෙද ජීවිතයේදී මුහුණ පාන්නට වන විද්‍යා ප්‍රශ්ණ සම්බන්ධයෙන් පිළිතුරු සොයා ගත හැකි වටිනා ප්‍රලේඛන වේ. සිංහල භාෂාවෙන් ප්‍රචලිත මෙම සඟරා හැරුණු විට ඉංග්‍රීසියෙන් පළ කරන **ලෝරිස්, ඉංජිනියර්** වැනි සඟරාද ඇත. ලංකාවේ පළවන ඉංග්‍රීසි සඟරා වලින් වැඩි කොටසක් විද්‍යාඥයන්, පර්යේෂකයන් වැනි විද්‍යාව පිළිබඳ උගත් අය සඳහා සුදුසු වේ.

තවද දැනට ලංකාවේ පළවන බොහෝ ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන්ද තොරතුරු බොහොමයක් දැන ගැනීමට හැකිය. පුවත් පතක වැඩි වශයෙන් සාමාන්‍ය තොරතුරු පළ වුවත් විද්‍යාව සම්බන්ධයෙන් වටිනා ලිපිද පළවේ. එම නිසා විශේෂයෙන් මහජන පුස්තකාලයක මෙම පුවත්පත් කැපුම් එකතුවක් තබා ගැනීම වැදගත්ය. උදහරණයක් ලෙස පාසැල් ශිෂ්‍යයන්ට ඉතා අවශ්‍ය වන කරුණු ඇතුළත් දිනමිණ පත්‍රයේ **'විද්‍යා සංග්‍රහය'** වැනි ලිපි එකතු කිරීම කළ හැකිය. තවද ඩේලි නිවුස්, සුබසෙත, නවයුගය වැනි පුවත් පත්වලද මහජනයාට අවශ්‍ය කරන ආයුර්වේදය, බල ශක්තිය ආදී වැදගත් කරුණු පිළිබඳව වටිනා තොරතුරු ඇතුළත් ලිපි පළ වේ. මෙලෙස එකතු කරගත් පුවත්පත් ලිපි පුස්තකාලයේ තැන්පත් කර තබා ගන්නේ කෙසේද යන්න ගැන සලකා බලමු. පුස්තකාලයේ මෙම ලිපි තැන්පත් කර ගැනීමේදී පළමුව මෙම පුවත්පත් කැපුම් කොලයක අලවා එහි දිනය , පුවත්පතේ නමද, පිටුවද, සඳහන් කොට ඒ ඒ විෂයයන් යටතේ දින පිළිවෙලට ගොනු කොට තබා ගත හැකිය. උදහරණයක් ලෙස සෞඛ්‍ය, පරිසරය, බල ශක්ති වැනි වැදගත් විෂයයන් සම්බන්ධයෙන් පළවී ඇති ලිපි වෙන වෙනම ගොනු කොට තැබීම සුදුසුය.

ලංකාවේ සඟරා ප්‍රකාශන හිඟතාවයේ හේතුවෙන් බොහෝ විද්‍යාඥයෝ ඔවුන්ගේ විද්‍යා ලිපි පුවත්පත්වල පළ කිරීමට පෙළඹෙති. මෙවැනි පුවත්පත් ලිපි හා සඟරා එකතුවක් ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාවේ, විද්‍යා හා තාක්ෂණික තොරතුරු මධ්‍යස්ථාන පුස්කාලයේ ඇත. තවද සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශිත ලංකාවේ සඟරාවල හා පුවත්පත්වල ලිපි අන්තර්ගත **"ශ්‍රී ලංකා සයන්ස් ඉන්ඩෙක්ස්"** සඟරාව මගින්

පළ කරනු ලබන ත්‍රෛමාසික අනුක්‍රමනිකාවක් වේ. මෙහි පර්යේෂණ වාර්තා හා සම්මන්ත්‍රණ වාර්තා ආදියද ආවරණය කරයි. ලංකාවේ ප්‍රකාශිත සියලුම විද්‍යා සඟරා, පුවත්පත් සියල්ලක්ම මෙම පුස්තකාලය ලබා ගනී. තවද 1977 සිට මේ දක්වා ඇති යම්කිසි විද්‍යා විෂයයක් යටතේ ලංකාවෙ පළ වූ සඟරා, පුවත්පත් ලිපි එකතුවක් 'කාඩ්පත අනුක්‍රමනිකාවක්' ලෙස මෙම පුස්තකාලය මගින් පවත්වා ගෙන යනු ලබයි. යම් පාඨකයෙකුට එම තොරතුරු අවශ්‍ය වේ නම් **ජාතික විද්‍යා සභාව, 47/5, මේට්ලන්ඩ් පෙදෙස, කොළඹ 7.** ලිපිනයෙන් විමසා දැනගත හැක.

මේ අනුව විද්‍යා විෂයන් සම්බන්ධයෙන් පාඨක ප්‍රශ්නවලට තොරතුරු සැපයීම සඳහා සඟරාවලට අමතරව විමර්ශණ ප්‍රලේඛනද වැදගත්ය. විශේෂයෙන් ඒ සඳහා විද්‍යා ශබ්දකෝෂයක්, ග්ලොසරීස් නැතහොත් ශබ්ද මාලා ආදිය පුස්තකාලයක තිබිය යුතුය. බ්‍රිටැනිකා විශ්ව කෝෂය වැන්නක් වඩාත්ම සුදුසු වූවත් එහි අධික මිල සාමාන්‍ය මහජන පුස්තකාලවලට දැරිය නොහැකිය. එම නිසා මෙම විශ්ව කෝෂය දිස්ත්‍රික් මට්ටමින් තිබිය යුතු විමර්ශණ ග්‍රන්ථයක් ලෙස ගිණිය හැක. බොහෝ විට අප පුස්තකාලවලට ස්වාධීනව කටයුතු කිරීමේ හැකියාවක් නොමැතිකම නිසා යම් යම් අවස්ථාවල අසල් වැසි පුස්තකාලවල පිහිට සෙවීමට සිදුවේ.

සාමාන්‍යයෙන් මහජන පුස්තකාලයකට කලාතුරකින් පැමිණෙන පර්යේෂකයන්, විද්‍යාඥයන් වැනි පාඨකයන්ගේ අවශ්‍යතාවන් සඳහා ඉදිරිපත්වීමට කුඩා මහජන පුස්තකාලවලට නොහැකිය. එවැනි අවස්ථාවක විද්‍යා විෂයයන් සම්බන්ධයෙන් පර්යේෂකයෙකුට, විද්‍යාඥයෙකුට උදව් දිය හැකි ජාතික විද්‍යා සභාවේ විද්‍යා හා තාක්ෂණික තොරතුරු මධ්‍යස්ථානය, තේ, පොල්, රබර් පර්යේෂණ ආයතන, විද්‍යා හා කාර්මික පර්යේෂණ ආයතනය (සීඅයිඑස්අයිආර්) වැනි ප්‍රධාන විද්‍යා පුස්තකාල වෙත යොමු කළ යුතුය. තවද විද්‍යා හා තාක්ෂණික තොරතුරු මධ්‍යස්ථාන මගින් විද්‍යා පුස්තකාල, විශ්ව විද්‍යාල පුස්තකාල, පර්යේෂණ පුස්තකාල ආදී පුස්තකාල 50 ක් පමණ එකතු වී තොරතුරු පද්ධතියක් ඇති කර එමගින් ඒකාබද්ධ සූචියක් ඇති කොට ඒ ඒ පුස්තකාල අතර අන්තර් හුවමාරුවක් ඇති කර ගැනීමට ඉඩ සලසා ඇත. මෙම ග්‍රන්ථ පිළිබඳ ඒකාබද්ධ සූචිය හැරුන විට ලංකාවේ ඇති විද්‍යා සඟරා සම්බන්ධයෙන්ද ඒකාබද්ධ සූචියක් පවත්වාගෙන යයි.

යම් පාඨකයෙකුට ලංකාවේ විද්‍යා සඟරාවක ලිපියක් හෝ පිටපතක් අවශ්‍ය නම් එම සඟරාව ඇති පුස්තකාලය සොයාගෙන එම ලිපිය ලබා ගැනීමේ හැකියාවක් මෙමගින් ඉටුවේ. මීට අමතරව විද්‍යා අනුක්‍රමනිකා සඳහා අන්තර් ප්‍රතිග්‍රහණ වැඩ පිළිවෙලක් ද සකස් කොට ඇත. විද්‍යාඥයින්, පර්යෙෂකයන් සඳහා අවශ්‍ය වන තොරතුරු ලබා ගැනීමට, තමන්ට තොරතුරු අවශ්‍ය අනුක්‍රමණිකාව, එය ලබාගත හැකි පුස්තකාලය ආදියද පිළිබඳව යොමු කිරීමක් මෙම තොරතුරු පද්ධතිය මගින් සිදුවේ. ඉහත කී කරුණු ගැන අවබෝධයකින් යුතුව මහජන පුස්තකාලයාධිපතිවරුන්, විද්‍යා හා තාක්ෂණ විෂයයන් සංවිධානය කිරීමේදී කටයුතු කළ යුතු වේ.

---

(*Contd. from page* 4)

Phase 2 — SLSTIC will provide printed catalogue cards where libraries will add whatever extra information is required by each individual library.

Phase 3 — By having terminals installed, libraries will be able to contact the data base on line and access information direct.

Response from the participants to the introductory speeches was varied and may be summarised as follows :

(1) Some participants were not familiar with computers and how they could be applied to the working of libraries. A request was in fact made that the SLNLSB conducts a seminar or workshop to create an awareness among library personnel about the capabilities of computers and how they can be applied to library activities.

(2) In the case of compiling a Union Catalogue where input is provided by many libraries it is possible that descrepancies may arise with regard to classification/cataloguing methods. Assignment of indexing terms and keywords is subjective and problems may arise when done by several individuals in different institutions.

(3) For computerized information processing, it is immaterial which classification scheme is followed. What is significant is the method of indexing used to bring out the information content.

(4) Computerized format for recording of bibliographic information should be standardized with the consensus of the majority of participating libraries as other Union Catalogues are already in existence and as these libraries will also participate in the proposed project.

(5) One area that creates problems in standardization is recording bibliographic details of corporate Author/uniform titles.

(6) The National Library Services Board should in association with SLSTIC/NRESA lay down standards to ensure uniformity. The other libraries could then adopt them as guidelines.

(7) SLSTIC should put to test the proposed format and in the event of problems being encountered find suitable solutions.

Director, SLNLSB summarised the purposes and objectives of the meeting and thanked all those present for sharing their knowledge and expertise for the benefit of all.

# CLASSIFICATION SCHEMES FOR GEOGRAPHY MATERIALS

**Part II**

**M. A. GUNAPALA**

*(Senior Assistant Librarian, University of Peradeniya)*

**[This article is continued from previous issue]**

UDC has the possibility of absorbing new branches in Physical geography under 911.2 and the other numbers related to the subject are :

| | | | |
|---|---|---|---|
| 911.2 | : 572 | — | Ethnological geography |
| | : 574.9 | — | Biogeography |
| | : 581.9 | — | Plant geography |
| | : 591.9 | — | Animal geography |

All branches in Human geography could be brought together under 911.3 by building numbers as required, by using faceted features. A few examples may be given as follows :

| | | | |
|---|---|---|---|
| 911.3 | : 3 | — | Social geography |
| | : 312 | — | Population geography |
| | : 32 | — | Political geography |
| | : 33 | — | Economic geography |
| | : 341.222 | — | Geography of International boundaries |
| | : 35 | — | Administrative geography |
| | : 656 | — | Geography of transport |
| | : 93/99 | — | Historical geography. |

It is certainly a very good classification scheme when compared to Dewey Decimal geography classification. However, arrangement within the Human geography section is neither logical nor helpful. Political geography (911.3 : 32) and Geography of International Boundaries (911.3 : 341.222) are in two different places, and Economic geography (911.3 : 33) appears in between. Study of international boundaries is a part of Political geography but this subordination is not shown in the classification. It is also more helpful if Economic geography (911.3 : 33) and geography of transport (911.3 : 656) are kept closer rather than placing them away from each other. Scattering of more closely related subjects could be more clearly seen when going on building numbers. Numbers built for some subjects in Economic geography, as in column "A" in the table below shows the scattering and column "B" shows an attempt to bring them together even though long numbers are inevitable, e.g.

| Subject | Column A | Column B |
|---|---|---|
| Economic geography | 911.3:33 | 911.3:33 |
| Industrial geography | 911.3:553.45 | 911.3:33:553.45 |
| Petroleum geography | 911.3:553.98 | 911.3:33:553.98 |
| Agricultural geography | 911.3:63 | 911.3:33:63 |
| Geography of transport | 911.3:656 | 911.3:33:656 |

In UDC "911.37 — Settlements, study of settlement patterns, settlement geography, rural settlements, town or city geography" is the main contribution of the classification for Geography. While the scheme is quite in detail, subdivision is also possible by using auxiliary signs when necessary. Both rural settlements and town and country planning are included here which is quite justified. Settlements are classified according to site, type and function, spatial distribution and situation, location, settlement pattern, etc. Urban geography is sub-divided according to types of towns or cities, buildings, town division in relation to its centre, etc. Therefore the settlement section happens to be the most important and well-organized section in the UDC Geography scheme.

A part of Theoretical geography is placed at the beginning in 910.1 which is for "Science of geography and Methodology". However, the main theory section is placed at 911.5/.9. Apart from the dispersion of the subject, location of the subject does not seem to have been helpfully done. It has to be suitably located at the beginning of the classification and not between Systematic and Regional geography. In addition to dispersion different branches of study have been put together in theory section 911.5/.9 where Comparative geography (911.7) and Applied geography (911.9) have also been assigned. While "Applied geography" should be given a more prominent place in the classification, "Comparative geography" could be conveniently included in the Regional geography section because of its close relations to regional study.

Another important section in the classification is "non-literary presentations of a region" (912) which includes pictures, graphs, diagrams, profiles, cartograms, maps, atlases and globes. It is useful and helpful to have them together in a library whatever the subject they deal with, because of the nature of the materials. It is most helpful to classify non-literary materials in order of importance area — subject — date — and author as Boggs and Lewis[4] believe. Their suggestion is both impressive and helpful because of the special nature of the non-literary items. However, for a present day librarian, the scale of map is also of vital importance and with this Boggs' and Lewis' idea could be brought up-to-date.

## NON-LITERARY MATERIAL

It is useful to have non-literary material separately located in UDC, as follows :

| | | |
|---|---|---|
| 912.4 | — | Pictorials, graphic and cartographic descriptions in general. |
| .43 | — | Maps, plans, charts. |
| .44 | — | Atlases. |
| .64 | — | Three dimensional presentations. |
| .643 | — | Globes. |
| .644 | — | Relief models and maps. |
| .65 | — | Models. |

UDC makes provision for classification of non-literary items in detail by adding area number, subject number and date. However, author or scale cannot be added to the classification number in UDC. Two other important items to be considered in connection with non-literary presentation in UDC are its relative location and the regional table. The regional table could express any large or small area satisfactorily. However, the relative location of the section cannot be considered logical or helpful in the middle of the subject classification. Since the non-literary presentations are very important instruments or reference materials used in the study of Geography, this section would be more useful at the beginning of the classification. It could perhaps be possible to have it separately, because of the fact that these materials are kept separately even in libraries.

The Regional geography section in UDC 913/919 begins with a historical approach from "Regional geography of the ancient world" in 913 and then proceeds to the "Regional geography of the modern world" at 914/919. Its good regional table and faceted features help to classify Regional geography books in detail in this classification.

Having introduced some faceted features UDC has certainly gained much improvement over the Dewey Decimal Classification. Because of its faceted features it could build numbers to express the content of a book fairly well, even with prevailing shortcomings. Any book on Settlement geography could be very well accommodated in this classification which is the main contribution of this scheme. In addition, maps and atlases section and also Regional geography section have been well organised to suit the requirements of geographers. For both these sections its excellent area table is an added advantage.

## DISADVANTAGE

The following criticisms of the UDC Geography classification are however to its disadvantage :

(1) The main subdivisions in the scheme have been done in a manner not at all helpful to educational consensus. The main subdivisions introduced, General geography, Physical geography, Human geography, Theoretical geography, Maps and Atlases, and Regional geography are hardly sufficient to satisfy the present-day needs of information retrieval in the field. Some of the main branches of Geography (i.e. Applied geography, political geography, Bio-geography, and Settlement geography are not given their proper places in the scheme).

(2) Arrangement within the Geography class is neither logical nor helpful. Sometimes it does not bring together or closer the most inter-related branches of study. On the whole the arrangement or the relative location of different branches of study cannot be justified.

(3) Space assigned for various branches of study within the scheme is not suitably distributed. While Regional geography class is assigned 913-919, rest of the branches of Geography study (Human geography, Theoretical geography, Applied geography, Historical geography, Maps and Atlases, and General geography, etc.) have been assigned 910-912, and this imbalance causes long numbers in the classification scheme.

| | | |
|---|---|---|
| e.g. Medical climatology | — | 911.2:551.58:61 |
| Medicine climatology | — | 911.2:551.58:61 |
| Climatology | — | 911.2:551.58 |
| Physical geography | — | 911.2 |
| Geography | — | 91 |

(4) In UDC general classification, the relative location of Geography class cannot be considered satisfactory. As in Dewey Decimal Classification the subject of Geography is placed between Literature and History. Because of its relationship to Social sciences, Pure sciences and also Applied sciences, its location with these groups of study would be more helpful to the library user. However, FID is now considering the Geography class in UDC along with Environmental sciences at class 4 which could be the most suitable place for Geography.

**Library of Congress Classification (LC) :**

The best example for an enumerative classification among general classification schemes, LC is deviced to classify Library of Congress ever-growing literature which is being revised with the growth of literature. In other words, the classification is based on literary warrant.

At the outset, it is quite important to make one criticism against the LC Geography classification, which perhaps could be the strongest criticism. Even though Geography is mainly placed in class G of this classification, more than half of its field of study is scattered in other subject classes. It is obvious that the geographer has to undergo much difficulties to get hold of its directly relevant literature. Its subject areas are put along with general subjects as given below, viz :

| | | |
|---|---|---|
| Economic geography in | H | (Economics) |
| Political geography in | JC | (Political science) |
| Military geography in | UA | (Military science) |
| Climatology in | Q | (Science) |
| Regional geography in | D.E.F | (History) |
| Urban geography in | HT | (Urban sociology) |
| | GT | (Manners and Customs) |
| | NA | (Architecture) |

## INCONVENIENCE

Some other areas of study in Geography have been assigned to S and T as well. There is no provision in LC to bring all branches of study in Geography together as it is possible in UDC. However much inconvenience it brings to geography studies, LC attempts to justify its scattering of subjects. When reasoning out the scattered distribution of Geography class, Richard H. Schimmelpfeng and C. Donald Cook[5] explain "one of the major subjects affecting several discipline is Geography. General geography, Mathematical geography, Astronomical geography, Physical geography and Anthropology are allocated in Class G. However, the Topography and description of individual continents and countries are not classed in G but are placed in history schedule (D-F). This collocation was considered desirable because "a knowledge of the geography of a country is essential for the understanding of its history (class D)." Furthermore, Topical geography is not classed in class G, but grouped together with pertinent subjects, e.g. Economic geography in HC, HD and HP (Economics). Geography of transportation in HE (Transportation and Communications), Medical geography in RA (Medicine), Military geography in UA (Military science) etc."

## IMPORTANT PRINCIPLE

Any classification scheme should be geared to *educational and scientific consensus* which is an important principle by which a classification scheme is to be successful. A classificationist should take into account method of subject study and its field of study. The classification scheme should support the needs of the education and research. In a general classification scheme a Geography book should be able to be placed appropriately in the Geography section but not under any other subject. Collocation is unwise at the expense of any other subject as it happens in LC. Alfred H. Mayer's[6] ideas elucidate the dissatisfaction of geographers concerning LC. A classification scheme should not only satisfy librarians merely to find a pigeon-hole for a given book but it should fulfill the supreme aim of satisfying the reader, researcher and scholar. Therefore the libraries following the LC system find it difficult to bring the Geography books together. The Johns Hopkins University Library[6] which recognised the dispersion problem in the Geography section, has wisely taken steps to bring all of them together by adding the prefix "Geog" before the call number.

Needless to say the relative location of the Geography section in LC, between History (D,E,F) and Economics (H) is fairly satisfactory. However, because of the nature of the subject (its close connection with Social sciences as well as Pure sciences) the best location would have been between Social sciences and Pure sciences as suggested by FID for future revision of the UDC Geography schedule.

When considering the general arrangement of the main sub division in class G, it is both unhelpful and illogical.

LC class G general arrangement :

| | | |
|---|---|---|
| G | — | Geography general |
| GA | — | Mathematical geography |
| GB | — | Physical geography |
| GC | — | Oceanography |
| GF | — | Anthropogeography |
| GN | — | Anthropology |
| GR | — | Folklore |
| GT | — | Manners and customs |
| GV | — | Recreation. |

Anthropology, Folklore, Manners and Customs, and Recreation are allocated in class G but it is hard to find the desirability of it as argued by Richard H. Schimmelpfeng and C. Donald Cook.

At the beginning of the Geography class "G I-73 — Geography general class" is very appropriate and quite detailed too. This could include all the important reference materials such as periodicals, societies and congresses, addresses, essays and lectures, directories, biographies, museums, exhibitions, etc. However, G 80—890 is definitely a separate main branch of geography which should be given a more prominent place.

| | | |
|---|---|---|
| G 80— 99 | — | History of geography |
| G 141 | — | Historical geography |
| G 200—890 | — | History of discoveries, exploration and travel. |

The first two could conveniently go together with the "Historical geography" which is a well known field of study in the subject. "History of discoveries, exploration and travel" is another main branch which should stand separately and that should be suitably located.

## MAPS AND ATLASES

At the end of the General class G 1001—9980 is assigned for maps and atlases and this is no doubt the main contribution of LC geography classification. Atlases are allocated in G 1001—3102 and maps are in G 3160—9980 and it is quite useful to have this separation because of the nature of the materials. Both sections are subdivided in detail according to region and historical periods. In the map schedule maps are subdivided by particular localities and also by towns. It is also possible to further subdivide any area by using "Cutter numbers". Maps and atlases can be subdivided according to subjects by using the subject table of LC. Therefore, in LC there is provision for giving a specific number even for a map of a small locality. In UDC this simply is impossible. Furthermore, in LC it could add the date, and also the authorship as Boggs and Lewis suggested. Therefore, the "New York State road map of 1947" prepared by the American Automobile Association will get the number G 3801. P2. 1947. A5,

| | | |
|---|---|---|
| G 3801 | — | New York State |
| .P2 | — | Roads |
| 1947 | — | Date of map |
| .A5 | — | American Automobile Association. (Cutter number for authorship of the map) |

The maps and atlases is just one main branch of Geography schedule, among a number of others. However, nearly 75% of the pages from the geography schedule has been devoted to this section. According to Robert C. White[7] the most convenient arrangement for maps and atlases is to put them under one number and to subdivide them in order of importance, area, subject, date and author. As Robert C. White discusses it is difficult to say which classification of maps and atlases is better.[8] Both are based on the same principles but LC maps and atlases classification would be definitely better for a library which uses the LC Classification Scheme.

Class G is assigned for "Mathematical geography and Cartography." Mathematical geography (GA 1—87) is subdivided into History, General works (divided by period) Surveys (divided by areas). Aerial cartography, Projections, Map reading etc., are given as the major subdivisions of Cartography. Map reading is also further subdivided by area and period, and there are provisions to expand it by using Cutter numbers and also by adding the date. On the whole this is also another satisfactory area in the LC Geography schedule.

LC has not correctly defined the content of Physical geography. Only Geomorphology has been included in the Physical geography (GB) class and other branches of the discipline has been put along with other branches of study. Meteorology and Climatology is in QC 851-899 at the end of Physics class. As in UDC, provision has not been made in LC to class Climatology books in the Geography section even if it is necessary. While the Geomorphology class is not in logical order, it cannot also correctly absorb and place all the literature on the subject. Some important problems that are studied in Geomorphology, such as cycle of erosion, development of slopes, erosion process etc., have not found a place in LC Geography schedule.

However, possibility to subdivide almost all the subjects by area could be a helpful feature in the scheme. In Climatology section no exact place appears to have been given for classification of climates which again is a well known discipline and as such it has to go along with a more general number "QC 981 — Climatology and weather general works." Furthermore, general circulation of the atmosphere has to go with "QC 931 — Wind, general works" which is neither helpful nor logical. Clouds have been assigned to a general number QC 920. However, LC provision for subdividing climates according to areas is useful. Sometimes for detailed classification, cutter numbers could also be used when necessary (e.g. QC 976 — Special optics). On the whole, Physical Geography has not been treated satisfactorily in LC scheme.

## OCEANOGRAPHY

Oceanography is a subject which is not very much developed when compared to other branches of study in Geography. However, its field of study could be clearly distinguished in LC and the subject is well treated in this classification scheme. The general section at the beginning with instruments (GC 41) is both logical and helpful because study of Oceanography also begins with the study of instruments. Study of oceans, such as depth, composition, salinity, temperature, waves, currents, tides, etc., comes subsequently and these are subdivided in detail according to different aspects and also areas. Cutter numbers could also be used when necessary for detailed subdivisions.

Anthropogeography (GF) is a subject scattered all over the scheme. Literature relating to this field has also been assigned to Economics and Political science, etc. Regional geography goes with history of respective countries. Urban geography and rural settlements are scattered among HT — Urban sociology, GT — Manners and customs, and NA — Archaeology.

In LC geography schedule some subdivisions are treated extremely well while some are not. The major draw-back is due to unnecessary scattering of some of its branches of study. In UDC there is provision for building numbers and any geography book could be conveniently placed within the geography section. Being a pure enumerative classification scheme, this is not possible in LC. However, because LC is based on literary warrant and the scheme is revised continuously, a number could be found in the classification for each geography book whether the relative location is logical or otherwise.

*e.g.* Agricultural climatology — s 600
Medical climatolology — RA 793—954.

Moreover, the class G index sometimes does not give reference to Geography subdivisions located outside the Geography schedule. Some popular Geography technical terms have not been used and, at least no reference has been made to them. The term "Urban geography" is not referred to in this classification at all. For "Human geography" it uses the term "Anthropogeography." It is always helpful to have the more widely used term for the convenience of the user. However, its value could be judged from the very words of Alfred H. Mayer, "In any case, the very fact that LC is highly sophisticated nomenclature whose alphabetical-numerical notation in Geography alone constitutes a volume of 500 pages in an encouraging outlook..................". It is true that some branches of geography of LC are not detailed enough or not well treated. It is also true that if the whole Geography numbers could be brought together, it makes the LC Geography Classification Scheme a valuable one.

**(to be continued)**


# සූචි පත්‍රිකා සේවාව

- ශ්‍රී ලංකාවේ ප්‍රකාශන සඳහා මුද්‍රිත සූචි පත්‍රිකා සේවාවක් ආරම්භ කිරීමට දැන් සැලසුම් කරගෙන යනු ලැබේ.
- විශේෂයෙන්ම, කුඩා පුස්තකාලවල සූචිකරණ කටයුතුවලට මෙමගින් මහත් ප්‍රයෝජනයක් අත්වනු ඇතැයි බලාපොරොත්තු වේ.
- මේ සම්බන්ධයෙන් කරනු ලබන විමසීම් පහත සඳහන් ලිපිනයට යොමු කරනු මැනවි.

අධ්‍යක්ෂක/ලේකම්
**ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය**
**නිදහස් මාවත, කොළඹ 7.**
ටෙලි: 598847

# මහජන බැංකුවේ

# 7

## ඉතිරිකිරීමේ ගිණුමක ඔබ මුදල් තැන්පත් කළයුතු වාසනාවන්ත හේතු හතක් මෙන්න

**1** ඔබේ මුදල්, කලින් දැනුම් දීමකින්
තොරව සතියේ වැඩ කරන ඕනෑම දිනයක
ආපසු ලබා ගැනීමට ඇති හැකියාව

**2** ශාඛා බහුතර සංඛ්‍යාවක් පවත්නා බැවින්
ඔබේ නිවස ආසන්නයේම බැංකුවකින්
ප්‍රයෝජන ගැනීමට ඔබට ඇති හැකියාව


**3** දස ලක්ෂ දෙකකට අධික ඥානාන්විත ගිණුම්කරුවන්
සංඛ්‍යාවක් අතරට එක්ව ඔබටද විශිෂ්ය සේවාවක්
භුක්ති විඳීමට ඇති හැකියාව

**4** මුදල් දෙගුණ කිරීමේ ලොතරැයිය
මගින් ඔබ නොදැනුවත්වම ගිණුමේ ශේෂය දෙගුණයක් වී
වාසනාවන්තයෙකු වීමට ඇති හැකියාව

**5** ඉතිරි කිරීමේ ගිණුම් හිමියනට
පහසුවෙන් ප්‍රදානය කෙරෙන ණය පහසුකම්
ඔබටද ලබා ගැනීමට ඇති හැකියාව

**6** මුදලේ ආරක්ෂාව පිළිබඳව
පූර්ණ සහතිකයක් ලබා ගැනීමට
ඇති හැකියාව

**7** ආයාසයකින් තොර
හැඳින්වීමකින් ගිණුමක් විවෘත
කිරීමට ඇති හැකියාව



# මහජන බැංකුව

# ජාතික පුස්තකාලයෙන්

## නොලියූ සාහිත්‍යය:

# ජන කවි

පීටර් විජේසිංහ

ජාතික පුස්තකාලය සඳහා 1982 වසර තුළදී වැව් ශිල්පය, සිංහල ඇල් වී ගොවිතැන, සිංහල හස්ති ශිල්පය, තල කොළ වරුණ, හේන් ගොවිතැන. දෙලොස් මහේ සිව්පද, අසිරිමත් උෟව, වැදි කවි, හවරි කවි, පෙම් කවි, තේරවිලි සිව්පද, පැල් කවි ආදී මාතෘකා යටතේ ජන කවි රාශියක් පීටර් විජේසිංහ මහතා විසින් ලියා භාරදෙන ලදී. මෙම ලිපියද විවිධ ජන කවිවල ප්‍රභවය හා රසමුසුනැන් අළලා ඔහු විසින් රචනා කරන ලද්දකි.

**කවර රටක හෝ පුස්තකාලයක් වෙතොත් එයට එකතු වන ඥාන සම්භාරය අතරට වෙසෙසින්ම ජන කවිද අඩංගු විය යුතුය. ජන ජීවිතයේ සෑම අංශයක්ම, විවෘත හදවතකින් යුතුව දැක ගන්නා හෙයින් ජන කවියාගේ දෘෂ්ටිය සැබවින්ම තියුණු එකකි.**

යම් ජාතියක තතු ඇති සැටියෙන් නිවැරදිව දැකීමට මීට වඩා හොඳ මාර්ගයක් නොවන හෙයින් ජන කවි මග අප විසින් සදහටම අගේ කළ යුතුය. ඔහු විටෙක උදම් මගට පිවිසෙයි. විටෙක ඉතිහාසය පිරික්සයි. විටෙක පෙම් ලොවේ සිහින දකී. විටෙක ගමේ ගොඩේ අහිංසක පලහිලව්වකට මැදිවී අහක සිටින අප වැන්නවුන්ට විනෝදයද ගෙන දෙයි. මෙන්න එබඳු අවස්ථාවක්:

පුත්තලමෙන් ගෙන ආ කුම්බලා වා  
පාර වැරදිලා මේ රටට ආ වා  
ඔහොරි පොටට පැනලා කල්පනා වා  
**හොරකළුවේ*** දිය මගෙ කුම්බලා වා

**වන්නියේ සිවුපද**

මෙය වන්නියේ සිවුපදයක් යයි හංවඩු ගැසී ඇත. ඒ කෙසේ වෙතත් මේ 'දූප්පත් සොරකම'' සිදුවී ඇත්තේ පුත්තලමේ කරවල කඩයකදීය. ඕ තොමෝ කුම්බලාවා ඔහොරි පොටේ සඟවාගෙන තම නිජ බිම වූ වන්නියට පැමිණියාය.

නිවසට පැමිණ ඕ තමන් ඇඳ සිටි ඔසරිය ලිහද්දී ඔහොරියේ නරු පටක සැඟවී සිටි කුම්බලාවා බිම ඇද වැටුණේය. එවකටත් තමන් පිළිගන්නට මෙන් පැමිණ තම දෙපයේ පැටලෙමින් සිටි ගෙදර කළු පූසාගේ කටට උෟ (කුම්බලාවා) ලෙහෙසි ගොදුරක් විය.

## විනෝදාත්මක කවි

අපේ ගම්බද කවි අතර විනෝදාත්මක කවිද දුර්ලභ නොවේ. බලියාගයක් කිරීම පිණිස එක්තරා කට්ටඩියෙකුට පිට පළාතකට යන්නට සිදුවිය. කවි කීමේදී ඔහුට උදව් කිරීම පිණිස ගෝලයෙක් උවමනා වේ. කට්ටඩියා ඔහු ළඟ සිටි ගෝලයාට කතා කොට ඔහු සමග යන්ට ලැහැස්ති වන ලෙස කීය. නිතර නිතර ඇදුම රෝගයට භාජන වන ගෝලයා යත යතා කිවයුතු දිග කවි ගායනා කිරීමට කවදත් අකමැත්ත පළ කරයි. යාගයේදී කෙටි කවි පමණක් කීමට පොරොන්දුවක් දුන් ඇදුරා (කට්ටඩියා) ගෝලයා සතුටු කරවාගෙන ගමනට පිටත් වීය.

මෙසේ දෙදෙනා වෙල්යායක නියරක් දිගේ යද්දී ඔවුනට මරක්කල වෙළෙන්දෙක් හමුවිය. කට්ටඩි තෙම මේ මරක්කළ වෙළෙන්දගෙන් ණයක් අරගෙන තිබුණ හෙයින් වෙළෙන්ද මේ අවස්ථාවේදී ණය ඉල්වීය. දෙදෙනා අතර මේ මුණගැසීම බලාපොරොත්තු නොවූවකි. වෙල් එළිය මැදින් ආ බැවින් මග හරින්නටද පුළුවන්කමක් නොවීය. දුන් ණය කිසි අඩුවක් නැතිව පොලිය සමග ගැනීම මරක්කලුන්ගේ සිරිතය.

ඇදුරා ඒ වේලාවේදී තමා ළඟ තඹ දොයිතුවක් පවා නැතැයි කී විට යවන කළ හැක්කක් නොවූයෙන් වෙළෙන්ද කෝපව ඇදුරාට මීට මොලවා ටොක්කක් ඇණ යන්නට ගියේය. මේ සිද්ධිය හොඳින් දැක බලා ගන්නට ගෝලයාට හැකි විය.

එදින සවස යාගය පටන් ගත් යකැදුරාණන්ට කොට තාලේ කවි කීමට කලින් වූ පොරොන්දුව අමතක වී ඔහු සුපුරුදු පරිදි දීර්ඝ ස්වරය නංවමින්–

**''සාව කුලේ ඉපිද ලොලේ, සීල බලේ වැඩූ**  
**බෝසත් සංසොබන''**

යයි දික් ඕසය නැගෙන කවි පදයක් පටන් ගති.

මෙවිට පොරොන්දුව කඩ කිරීම ගැන රැහැණ වූ ගෝල තෙම

**''නයා වෙලේ මරක්කලේ–ඇන්න කලේ ටොකු**  
**– මරහඩ ලැවේ''**

යයි දෙවෙනි කවි පදය කියා අවසන් කළේය මේ කවිය සංවාද ස්වරූපය ගනී.

## තවත් නිදසුනක්

මාතර යුගයේ උසස් පෙළේ කවියකු වශයෙන් ප්‍රසිද්ධිය ඉසුලූ සමරජීව නොහොත් පත්තායමේ ලේකම්තුමා නිතර රා බීමට පුරුදුව සිටි කෙනෙකි. ඔහු එක සැන්දෑ ජාමයක

*** මේ පැදියේ ''හොර කළුවා'' යයි කියා ඇත්තේ ඇගේ කළු පූසාටය.**

සිය නිවසේ ශාලාවේ එහා මෙහා ඇවිදිමින් "**කන දෑ අදින දෑ**" යයි ඇද පැද කීය. එවිටම "**බොන දෑ විතර හොඳ දෑ**" යයි ඒ විගසම පිටතින් තවත් කවි පදයක් ඇසුණි. ඒ වූ කලී ලේකම් මහතා හමුවීම පිණිස ගෙයි පිටුපස බිත්තක්කන අයිනේ රැඳි සිටි රා සොඬ ගැමියෙකුගේ කටින් පිට වූවකි. එකෙනෙහිම පන්තායමේ ලේකම්තුමා මේ අමුත්තා කවරෙක්දැයි දැන ගැනීමට එබී බලමින් **කවුදෑ එවුන්දෑ** යයි කීය. මේ ගැමියා වූ කලී පහත් කුලයක තරුණයෙකි. හේ ගත් සටටම "**මොකදෑ හිරයක් දෙන්ට වත්දෑ**" යි ක්ෂණික පිළිතුරක් බුහුටා හැරියේලු!

සංවාද ස්වරූපයෙන් බිහිවුණ තවත් ජන කවියකි **ගම්වලට නම් පට බැඳීම.**

ගම්වලට නම් පට බැඳීමේදීද ජන කවිය ඍජු පියවරක් ගනී. ලක්දිව ග්‍රාම නාම ඉතිහාසය දෙස සූපරික්ෂාකාරී වන්නෙකුට මෙවැනි සුගම නිදසුන් කොතෙකුත් දක්ක හැකි වනු ඇත. ඒ අනුව ජන කවියා **ආරගොඩ** නමැති ගමේ ඉතිහාසය මෙලෙසින් දකී. දඹදෙණි හත් පත්තුවේ පොල්ගහවෙල ඡන්ද කොට්ඨාශයට අයත් මේ ගමේ නටබුන් රැසක් මතුවී ඇතැයි වාර්තා වී ඇත. මේ නටබුන් අතර දඹදෙණි රජ්ජුරුවන්ගේ මාලිගාවක සුන්බුන්ද දේවාලයක හා වැවක නටබුන්ද ඇතැයි කියති. වටිනා වස්තු සම්භාරයක් ඇතැයි කවුරුත් සලකන **සමනොළ ගල** නම් පුදුමාකාර ගල් තලාවක්ද මෙහි වෙයි.

රජ මාළිගය තිබුණේ දඹ ගොළු මුදු නේ
පාතිස් බැබළුණේ රජුගේ වැව රැව් නේ
යන එන ඔරු පාරු නවතා තිබුණ තැ නේ
මීයක් බැන්දයිලු ඔරුවක තිබුණ තැ නේ

සුසිරි මේ වැවේ සිටිනා මසුන් ගොඩ
අතර සිටියෙ නම් දරණා **ආර** **නඩ***
වැ බැම කැඩීලා උණ පැන්නයිලු ගොඩ
එද පටන් විය අපෙ ගම **ආර** **ගොඩ**

මෙහි **දඹ ගොළු** යයි සඳහන් වූයේ දඹගොල්ලටයි. **පල්ලේබණ්ඩාර, උඩ බණ්ඩාර, මුත්තෙට්ටු බණ්ඩාර** යනාදී වශයෙන් බණ්ඩාර හත් තට්ටුවක් මෙහි විසූහයිද ජන ප්‍රවාදයෙහි සඳහන්ය. ගම්වලට නම් ගෙතුණ සැටි මෙහි ඉහත දක්වෙන කවෙන් පැහැදිලි වෙයි. ගමට නම වැටුණේ වැවේ බැම්ම (වැ–බැම) කැඩී ගලා ගිය දියපාර සමඟ දැහලිල්ලේ පැන ගිය "ආර" නම් වූ ලොකු මිරිදිය මසෙකු නිසාය. මිරිදිය මසුන් අතර ආරා දෙවෙනි වන්නේ ලූලාට පමණි. "ආරාගොඩ" යයි කියන ගම් කිපයක්ම ඇති බැව් පැහැදිලිය. දෙවෙනි රාජසිංහ රජතුමා ගන්නොරුව සටන නිසා විශ්ව කීර්තිය දිනා ගත්තේය. එම සටනට මූලාධාර වූ **රත්න තිලක මුතුගල් විධාන දුරයාට** ආරගොඩ නම් ගම නින්ද ගම් කොට සන්නසකින් දෙවා වදාරන ලදී. මෙය උඩයාල ඕතව කෝරලේ පිහිටි ගමකි. වර්තමාන කෑගලු දිස්ත්‍රික්කේ රඹුක්කනට නුදුරුව මේ ගම පිහිටා ඇත.

## සිංහල සිවුපදකරුවාගේ විශේෂ ලක්ෂණයක්

සිය උවමනාව කෙසේ හෝ දක්වීමට නැමුණු සිවුපදකරුවා සිවුපදයේ මුල් තුන් පියෙන් බහු බූත දෙඩා අග පෙදෙන් පමණක් වුවමනාව දක්වීම සිරිතක් කොට ගනී. එකිනෙක විරිදු අදහසින් නොසිහෙන කරුණින් මෙබඳු සිවුපද කීම සිපද කරුවාට පුරුද්දක්ම විය. පද සබඳ නැකීමට වඩා සිතැඟි එළිදරව්වට හැමවිටම හේ ඉදිරිපත් වෙයි. මේ සිවුපදය එයට නිදසුන්ය.

ගහ බඩ තිබෙන රැක් අත්තන පඳුරු රැයයි
ඥානතිලක හිමි අපවත් වුණු දවසයි
රෙදි නැන්ද අපෙ ගෙදරට දා දවසයි
මට මක් වුනත් "සොපියට" තිසරණ සරණයි

**නූතන සිවුපදයකි**

## තලමල් කවි:

තල්, පොල්, කිතුල්, පුවක් ආදී තාලවර්ගයේ ගස් මෙන් නොව තල ගසක් මල් හට ගැනීමට දීර්ඝ කාලයක් ගතවෙයි. තල ගස පිදුණායින් පසු එහි වැඩීම නතර වෙයි. නිතර සුලභ දර්ශනයක් නොවන හෙයින් තලමලක් පිපුණු විට එය බලන්නට යෑම පුරාණ ගැමියන්ගේ සිරිත විය. සිනමා දර්ශන, බයස්කෝප්, රූපවාහිණී ආදී දේවල් එකල නොවූයෙන් සාමාන්‍ය සිංහල ගැමියා තලමල් ආදී ස්වාභාවික සුන්දර දේවල් බලා ප්‍රීතිවීමට පුරුදුව සිටියේය. තල මලින් ලත් ආශ්වාදය ඇති බොහෝ ගැමි කවීහු තලමල් කවි හා සින්දු ගෙතූහ.

මේ කවි සින්දු කුරහන් කැපීම, ගොයම් කැපීම, පැළ සිටුවීම, වල් නෙළීම ආදී ගොවිතැන් කටයුතුවලදී සමූහ වශයෙන් යැදී මිහිරි ඔසයට ගායනා කරන ලදී. එකමුතුකම ඇති වීමටද, බර වැඩෙහිදී විඩාව දුරු කර ගැනීමට ද, මේ තලමල් සින්දු බෙහෙවින් උපකාර විය. එසේම සී සෑම, පෝරු ගෑම, වැපිරීම, නෙලීම, කැපීම, පෑගීම වැනි කුඹුරේ, හේනේ හැම අත්තම් වැඩකදීම මිහිරි කොට ගයනු ලබන මේ තලමල් කවි ගම් වැසි ස්ත්‍රීහු සමූහ වශයෙන් එකතුව කුරහන් කැපීමේදීද ගායනා කරනු ලැබූහ. තවද වර්ෂාවෙන් නොතෙමීමටද, අව්වෙන් බේරීමටද, එකල සෑමටම තල අත්ත නැතිවම බැරි උපකරණයක් විය. මෙකල අපේ කුඩයට හිමි තැන එකල තල අත්තට හිමි වී තිබුණේය. තල ගොබය තම්බා, වේලා, පදම් කර ගැනීමෙන් සාද ගන්නා **පොත්ගෙඩිය** පුස්කොළ **ලිවීමට** උපයෝගි කර ගන්නා ලදී.

කුඹුරක වල් නෙළන නෙලුම් කයියකට සහභාගි වන ගැහැණු පිරිමි හැමදෙනා අතේම අව්වට ඉසලා ගැනීම සඳහා තල අත්ත බැගින් තිබුණ බැව් නොක්ස් මහතා පවසයි. පැරණි ගැමියෝ තද වැස්සේ වුවත් නොතෙමී ඉහලා ගෙන යා හැකි පරිදි "බෝගාව" තල අත්තෙන් පිළියෙල කර ගත්හ. යුද සේවයට බැඳුණ ගේවායා අතේ වුවද තල අත්ත තිබුණේ යයි "නොක්ස්" වැඩි දුරටත් පවසයි.

පන්සලේ හිමියන්ගේ ගොටු අත්තටත්, උදම්පොත් ලිවීමට ගන්නා "පොත් ගෙඩියටත්" නැකැත් ගණිත ගුරුන්නාන්සේගේ ගෙදර කේන්දර ලිවීමටත්, කට්ටඩි මන්තර ගුරුන්නාන්සේගේ ගෙදර යන්තර ඇඳීමටත, එද තල කොළ පත් ඉරුව (පුස්කොළ) නැතිවම බැරි විය. මුද්‍රණ ශිල්පයේ විශ්මයාවහ දියුණුව නිසා නැවත හිස ඔසවන්නට බැරි තරමින් බැට කෑ තල කොළ කර්මාන්තය අද මේ වනතුරුත් **ගලතර මැඩිල්ලේ ලියන්නන්ගේ** අතින් නිමවන නව නිර්මාණ (තල කොළ) රටාවන්ට පමණක් සීමා වී පවතී.

## ජන කවි ගොතන හැටි

එක් දවසක අප්පුවා නමැති මිනිසෙක් තම සුහුරා (මස්සිනා) සමග ගමනක් ගියේය. ඔහු දෙදෙනා අතරමග ගහක් අයිනේ

(19 වන පිටුවට)

* **"ආරනඩ" යයි කියා ඇත්තේ ලොකු මිරිදිය මාළු අයිනකටය.**

# මාණ්ඩලීය කටයුතු: 1982

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ විවිධ සේවා අංශ මගින් පසුගිය 1982 වර්ෂය තුළදී ඉටු කරන ලද කටයුතු පිළිබඳ සමාලෝචනයක් රැගත් මෙම වාර්තා, ඒ ඒ සේවා අංශවල ප්‍රගති වාර්තා ඇසුරෙන් සකසන ලද බව සැලකුව මැනවි.

## ජාතික පුස්තකාලය

### (1) පුස්තකාල ද්‍රව්‍ය ලබා ගැනීම:

මේ පිළිබඳව ජාතික පුස්තකාල අංශය 1982 වර්ෂය තුළදී **රු. 55,2160.95** ක් වටිනා පොත් ඇණවුම් කරන ලද අතර, එම වර්ෂය අවසාන වන විට **රු. 2,90867.65** ක් වටිනා ග්‍රන්ථ නාම 4016 ක් ලබා ගැනීමට හැකි වී ඇත.

තවද ජාතික පුස්තකාල අංශය සඳහා අයත් කර ගන්නා ලද **පැරණි පොත්, දුර්ලභ පොත්, අත්ලිපි හා පුස්කොළ පොත් ආදිය** ලබා ගැනීම අදාල වසර තුළදී වඩාත් ක්‍රමානුකූලව සිදු කරන ලදී. මේ සඳහා උපදෙස් දීමට ඒ ඒ අංශ පිළිබඳ විශේෂඥයින්ගෙන් යුත් කමිටුවක් පත් කරන ලද අතර, එම කමිටුවේ මඟ පෙන්වීම යටතේ මෙම පුස්තකාල ද්‍රව්‍ය ලබා ගැනීමට ද විධි විධාන යොදන ලදී.

ජාතික පුස්තකාලය සඳහා 1982 වර්ෂයේදී පහත දැක්වෙන ආයතන හා පුද්ගලයින්ගේ පරිත්‍යාග ලැබිණි.

| | | පොත් සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ශ්‍රී ලංකා විදෙශ අමාත්‍යාංශය (එ. ජා. පු.) | 3000 |
| 2. | කොළඹ මහරෝහල් පුස්තකාලය | 6500 |
| 3. | වාණිජ දෙපාර්තමේන්තුව | 150 |
| 4. | මහාචාර්ය යූ. ඩී. ජයසේකර මහතා | 29 |
| 5. | එක්සත් ජාතීන්ගේ කාර්යාලය | 97 |
| 6. | කොළඹ විශාඛා විද්‍යාලය (සඟරා නාම 14කින් යුක්තව) | 580 |
| 7. | කේ. එස්. පීරිස් මහත්මිය | 22 |
| 8. | ඕස්ට්‍රේලියානු ජාතික පුස්තකාලය | 27 |

### (2) නීත්‍යානුකූල තැන්පතුව:

මේ යටතේ රාජ්‍ය ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුවෙන් ප්‍රකාශන 5314 ක් ජාතික පුස්තකාලයට අයත් කර ගන්නා ලදී.

මෙතෙක් මාලිගාවත්ත කාර්යාලයේ පැවති ජාතික පුස්තකාල එකතුව මණ්ඩලයේ ප්‍රධාන මූලස්ථානය වෙත ගෙන ඒමත්, ඒවා ක්‍රමානුකූලව ජාතික පුස්තකාල ගොඩනැගිල්ලෙහි සංවිධානය කිරීමටත් කටයුතු කරන ලදී.

**(3)** යුනෙස්කෝ ආයතනය වෙත ලංකාවේ මහජන පුස්තකාල පිළිබඳ තොරතුරු සැපයීම සඳහා ප්‍රශ්නාවලියක් මාර්ගයෙන් අදල තොරතුරු රැස් කර ගැනීමත් ඒ අනුසාරයෙන් පිළිතුරු සැපයීමත් මෙම වර්ෂයේදී සිදු කරන ලදී.

### (4) අන්තර් ජාතික පොත් හුවමාරු කටයුතු:

මෙම කටයුතු 1982 වර්ෂයේදී තවදුරටත් ව්‍යාප්ත කිරීමට පියවර ගන්නා ලද අතර, විශේෂයෙන් සෝවියට් දේශය, බ්‍රිතාන්‍යය, ඉන්දියාව, චීනය, සිංගප්පූරුව, එක්සත් ජනපදය හා මැලේසියාව ආදී රටවල ජාතික පුස්තකාල සමඟ අන්තර් හුවමාරු කටයුතු ආරම්භ කරන ලදී. විදේශීය ප්‍රකාශන සඳහා අවශ්‍ය වන විදේශ විනිමය ඉතිරි කර ගැනීමටත්, දේශීය ප්‍රකාශන පිටරටවල ව්‍යාප්ත කිරීමටත් ජාතික පුස්තකාලයට අවශ්‍ය පොත්පත් හා වෙනත් ප්‍රකාශන නිරායාසයෙන් ලබා ගැනීමටත් මෙම ජාත්‍යන්තර පොත් හුවමාරු ක්‍රමය ප්‍රයෝජනවත් වී තිබේ.

**(5)** ජාතික පුස්තකාල ප්‍රමිතීන් සකස් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපතීන්ගේන් යුත් කමිටුවක් පත් කර අදල විෂයෙහි කටයුතු ද මෙම වර්ෂයේදී ආරම්භ කරන ලදී.

### (6) ග්‍රන්ථ සංරක්ෂණය:

ජාතික පුස්තකාල පොත් එකතුව සංරක්ෂණය කිරීමේ මූලික පියවරක් ලෙස විශේෂයෙන් අගනා දුර්ලභ ගණයේ ග්‍රන්ථ බැඳීමේ කටයුතු සිදු කරන ලදී.

ජාතික පුස්තකාලයේ පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය කිරීමේ තවත් පියවරක් වශයෙන් ඊට අයත් **පුවත්පත් සූක්ෂ්ම ඡායාගත කිරීමේ** (micro-filming) කටයුතු ආරම්භ කරන ලදී.

## පුස්තකාල අධ්‍යාපන හා අභ්‍යාස අංශය

**පුස්තකාලයාධිපතීන් 413 දෙනෙකු කෙටිකාලීන පාඨමාලා මගින් 1982 වසර තුළ පුහුණු කරන ලද අතර එය මේ දක්වා එක් වර්ෂයක් තුළ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් පුහුණු කරන ලද විශාලතම පුස්තකාලයාධිපතීන් සංඛ්‍යාව වේ.** පළාත් පාලන පුස්තකාලයාධිපතීන් 228 දෙනෙක් මෙම වසරේ පාඨමාලාවට සහභාගි වූ අතර ඔවුන් පුහුණු වීම් ලැබූ මුළු සංඛ්‍යාවෙන් 55.2% නියෝජනය කරන ප්‍රධානම කොටස බවට පත්වේ. පාසැල් පුස්තකාලයාධිපතීන් 150 ක් මේ වසර තුළ පුහුණුව ලැබූ අතර, එම කණ්ඩායම මුළු සංඛ්‍යාවෙන් 36.3% ක් නියෝජනය කරන දෙවන විශාලතම කණ්ඩායම වේ.

1982 වසර තුළදී මණ්ඩලය මගින් පුහුණු කරන ලද අනෙක් ප්‍රධාන පුස්තකාලයාධිපතීන් සංඛ්‍යාව කාර්මික ආයතනවල පුස්තකාලයාධිපතීන් වේ. කාර්මික ආයතන 23 හි සම්පූර්ණ පුස්තකාලයාධිපතීන් සංඛ්‍යාව වූ 35 දෙනාම එම පාඨමාලාවට සහභාගි වූ අතර ඔවුන් මුළු පුහුණුව ලැබූ සංඛ්‍යාවෙන් 8.5% පමණ වේ. මෙම වර්ෂය තුළ පුහුණු කිරීමේ පාඨමාලා 9 ක් පැවැත් වූ අතර ඒවා දින 3 සිට දින 5 දක්වා විවිධ ප්‍රමාණයේ ඒවා විය. පුස්තකාල ක්ෂේත්‍රයේ නව ප්‍රවනතා ඇතුළත් වීමට සහ පාඨමාලාවල වැඩි අවධානය ප්‍රායෝගික කටයුතු වලට යොමුවන සේ එම පාඨමාලාවල වැඩ සටහන් මෙම වසර තුළදී සංශෝධනය කරන ලදී. පාඨමාලාවල දේශකයින් සහ උපදේශකයින් ලෙස පුස්තකාල ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම් සහිත ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපතිවරුන්ගේ සේවය ලබා ගන්නා ලදී.

කාර්මික අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුස්තකාලවල වැදගත්කම අවධාරණය කරනු පිණිස කාර්මික ආයතන විදුහල්පතිවරුන්, නියෝජ්‍ය විදුහල්පතිවරුන්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්මික අධ්‍යාපන අංශයේ නිලධාරීන් සඳහා එක් දින සම්මන්ත්‍රණයක් මේ වසර තුළදී පවත්වන ලදී.

අදාල වර්ෂය තුළදී පහත දැක්වෙන ප්‍රකාශන තුන පුස්තකාල අධ්‍යාපන අංශය මගින් පළ කරන ලදි. **1. කුඩා කාර්මික ආයතන පුස්තකාල - ඩී. ජේ. කැම්බල් (පරි. ධනපාල ගුණසේකර), 2. කාර්මික ආයතන පුස්තකාල තොරතුරු සංග්‍රහය- යූ. අමරසිරි, 3. Directory of Technical Institute Libraries —U. Amarasiri.**

## පුස්තකාල පර්යේෂණ හා සංවර්ධන අංශය

### (1) පොත් පරිත්‍යාග:

**පුස්තකාල සංවර්ධන විෂයෙහි කැපී පෙනෙන අඩුපාඩුවක් වන පොත්පත් හිඟතාවයට පිළියමක් වශයෙන් මෙම වසරේදීද මණ්ඩලය වෙත ලැබී ඇති ඉල්ලීම් පරිදි සුදුසු පොත් කට්ටල සකස් කර පරිත්‍යාග කරන ලදී** මෙහිදී පාසැල් හා මහජන පුස්තකාල සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන ලදී.

මේ අතර සිංහල මාධ්‍යයේ පොත් 900 ක් බෙදා හරින ලද අතර, එහි දළ වටිනාකම රු. 20,000 ක් වේ. මීට අමතරව බ්‍රිතාන්‍ය කවුන්සලය මගින් ඕ. ඩී. එම්. පොත් ආධාර වැඩ පිළිවෙල යටතේ මණ්ඩලය වෙත ලැබී ඇති පොත් තොගයෙන් රු. 18,000 ක දළ වටිනාකමකින් යුත් පොත් 318 ක් පාසැල් පුස්තකාල අතරේ බෙදා හැරීමට කටයුතු කරන ලදී. තවද එංගලන්තයේ රන්පර්ලි පුස්තකාල සේවාව වෙතින් පරිත්‍යාග වශයෙන් ලැබී ඇති පොත් තොගයෙන් මණ්ඩලයේ මහනුවර මධ්‍යස්ථානය මගින් බෙදා හැරීම සඳහා පොත් තොගයක් සපයන ලද අතර, ඊට අමතරව විවිධ වූ පුස්තකාල 89 ක් අතරේ පොත් 4773 ක් බෙදා හැරීමටද කටයුතු කරන ලදී.

බහුතාක්ෂණික හා කාර්මික ආයතන පුස්තකාල අතරේ බෙදා හැරීම සඳහා විද්‍යා හා තාක්ෂණික ක්ෂේත්‍රයට අදල රු. 20,000 ක දළ වටිනාකමකින් යුත් ඉංග්‍රීසි පොත් විශාල තොගයක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාරදීමට කටයුතු කරන ලදී. 1982 වර්ෂයේ කරන ලද පොත් පරිත්‍යාග පිළිබඳ දළ සටහනක් පහත දැක්වේ:

| පුස්තකාල/ආයතන සංඛ්‍යාව | | පිටපත් සංඛ්‍යාව | වටිනාකම රු. ශ. |
|---|---|---|---|
| මහජන පුස්තකාල | 18 | 1341 | 13,105.77 |
| පාසැල් පුස්තකාල | 53 | 2829 | 4,368.13 |
| බහුතාක්ෂණික ආයතන | 18 | 603 | 21,500.00 |
| වෙනත් | 28 | 1581 | 16,142.00 |
| එකතුව | 117 | 6354 | 55,115.90 |

### (2) පොත් පිරුළ සේවාව:

කෝට්ටේ හා මැද කොළඹ මැතිවරණ කොට්ඨාශවලට අයත් පාසැල් පුස්තකාල 28 ක් අතරේ මණ්ඩලය විසින් පොත් පෙට්ටි ක්‍රමයට පොත් බෙදා හැරීමට අමතරව කොලොන්නාව මැතිවරණ කොට්ඨාශයේ පාසැල් 18ක් අතරේ ද මෙම සේවාව ව්‍යාප්ත කිරීමට අවශ්‍ය මූලික පියවර ගන්නා ලදී. මෙම සේවාව සඳහා රු. 3,737.50 ක් වටිනා පොත් තොගයක් අභිනවයෙන් මිලදී ගැනීමටද කටයුතු කරන ලදී.

### (3) විවෘත විශ්ව විද්‍යාල පුස්තකාල පහසුකම්:

මණ්ඩලය විසින් දිස්ත්‍රික් පදනම මත තෝරා ගන්නා දිස්ත්‍රික් පුස්තකාල 24 මගින් විවෘත විශ්ව විද්‍යාල සිසුන් සඳහා පුස්තකාල පහසුකම් සැපයීම පිළිබඳව ශ්‍රී ලංකා පුස්තකාල සේවා මණ්ඩලය හා විවෘත විශ්ව විද්‍යාලය අනුබද්ධව වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව දිවයිනේ ප්‍රධාන මහජන පුස්තකාල 24ක් අතරේ රු. 2,73,634 ක දළ වටිනාකමකින් යුත් පොත් 2273ක පොත් තොගයක් බෙදා හැරීමට කටයුතු කරන ලදී. තවද ලියා පදිංචි වූ විවෘත විශ්ව විද්‍යාල සිසුන්ගේ අනුපාතයට මෙම පොත් කට්ටල බෙදා හැරීමේ පදනම වශයෙන් සලකන ලදී.

### (4) පුස්තකාල සංවිධාන හා පරීක්ෂණ කටයුතු:

පුස්තකාල අභිනවයෙන් ආරම්භ කිරීමේදී හා ආරම්භ කරන ලද පුස්තකාල යළිත් ප්‍රතිසංවිධානය කිරීම සඳහා මණ්ඩලය විසින් තාක්ෂණික උපදෙස් හා සුදුසු ආධාර ලබා දීමද මෙම අංශය යටතේ සිදු කළ වැදගත් සේවාවකි. මෙම වර්ෂය තුළ මෙවැනි පුස්තකාල පරීක්ෂණ හා සංවිධානය සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් විශේෂ පුස්තකාල 4 ක්ද ආයතනික පුස්තකාල 1 ක්ද පාසැල් පුස්තකාල 1 ක් සඳහාද ලබා දී ඇත. මේ අතර පුස්තකාල විවෘත කිරීම් ආදී අවස්ථාවන්හි පවත්වනු ලැබූ ප්‍රදර්ශන කටයුතු සංවිධානය කිරීම්ද සිදු කරන ලදී.

### (5) විදේශ ආධාර යටතේ පාසැල් පුස්තකාල සංවර්ධනය:

මෙම වර්ෂය තුළ පාසැල් පුස්තකාල සංවර්ධනය සඳහා යුනිසෙෆ් ආයතනයට ඉදිරිපත් කරන ලද යෝජනාවලට අදල රු. 2, 26, 607 ක් වටිනා ජීප් රථයක් පරිත්‍යාග වශයෙන් ලබා ගන්නා ලදී.

### (6) මණ්ඩලීය පොත් පරිග්‍රහණ කටයුතු:

පොත් පිටපත් 1663 ක් ජාතික පුස්තකාලය වෙනුවෙන්ද, ජාත්‍යන්තර පොත් හුවමාරු වැඩ පිළිවෙළ උදෙසා පිටපත් 194 ක් ද ඇණවුම් යැවීම හා පරිග්‍රහණ කටයුතු කරන ලදී. මේ හැර පොත් හුවමාරු සේවාව හා පුස්තකාල සංවර්ධන කටයුතු සඳහා ග්‍රන්ථ 1556 ක් ඇණවුම් කර අයත් කර ගන්නා ලදී.

### (7) කර්තෘ ප්‍රකාශක ආධාර වැඩ පිළිවෙළ:

උපකරණ වැඩ පිළිවෙල යටතේ රු. 70,000 කට වැඩි වටිනාකමකින් යුත් ග්‍රන්ථ පිටපත් 6888ක් මිළදී ගැනීමටත් අදල ග්‍රන්ථ පුස්තකාල අතර බෙදා හැරීමටත් කටයුතු කරන ලදී.

### (8) දිස්ත්‍රික් පුස්තකාල ක්‍රමය:

මෙම වර්ෂයේදී පහත සඳහන් දිස්ත්‍රික් පුස්තකාල සඳහා පොත් පත්, උපකරණ සහ සංවිධාන කටයුතු පිළිබඳ ආධාර හා උපදෙස් ලබාදීමට කටයුතු කරන ලද අතර, ඒ පිළිබඳ දළ විස්තර පහත දැක්වේ:

| දිස්ත්‍රික් පුස්තකාලයේ නම | දිස්ත්‍රික්කය | සපයන ලද ආධාර | වටිනාකම |
|---|---|---|---|
| | | | රු. ශත. |
| 1. ඩී. එස්. සේනානායක අනුස්මරණ මහජන පුස්තකාලය | මහනුවර | පුස්තකාල ලී බඩු උපකරණ | 20,000.00 |
| 2. ඊරියගොල්ල සියවස මහජන පුස්තකාලය | කුරුණෑගල | එම (රු. 5000 වටිනා පොත් ඇණවුම්කර ඇත.) | 15,000.00 |
| 3. හොරණ මහජන පුස්තකාලය | කළුතර | ලී බඩු සහ පොත් බැදීම | 20,000.00 |
| 4. චාවාකච්චේරිය මහජන පුස්තකාලය | යාපනය | පොත් ආධාර සහ උපකරණ | 20,000.00 |
| 5. කල්මුනේ මහජන පුස්තකාලය | අම්පාර | පොත් ආධාර | 19,336.36 |

**(9) මණ්ඩලීය ප්‍රකාශන**

පුස්තකාල ප්‍රවෘත්ති මෙම වර්ෂයේදී නව නිමාවකින් යුතුව සහන මිලකට අළෙවි කිරීමේ කටයුතුද සාර්ථකව සිදු කරන ලදී. මෙම ප්‍රකාශන විස්තර දිවයිනේ සියළුම මහජන පුස්තකාල, සාර්මික පුස්තකාල වෙත ලබාදීමට ඒ ඒ අමාත්‍යාංශ විසින් දයකත්වය ලබා දීමට කටයුතු සලස්වන ලදී. පුස්තකාල ප්‍රවෘත්ති 3 වන කලාපයේ අංක 1 සහ 2 මුද්‍රණය කර බෙදා හැරීම සහ 3 වන කලාපයේ අංක 3 සහ 4 මුද්‍රණය සඳහා ද භාර දෙන ලදී. මේ හැර පශ්චාත් උපාධි ග්‍රන්ථ නාමාවලිය හා මූලික සූචිකරණ ග්‍රන්ථයද මුද්‍රණය සඳහා භාර දෙන ලදී.

**(10) පුස්තකාල ලිපි ද්‍රව්‍ය අලෙවිය:**

මේ හැර මණ්ඩලය විසින් මුද්‍රිත පුස්තකාල ලිපි ද්‍රව්‍ය, මහජන පුස්තකාල තොරතුරු සංග්‍රහය අළෙවි කිරීම හා ලී බඩු සැපයුම හා ඩිවි දශම වර්ගීකරණය අත්පොත නොමිලයේ පුස්තකාල විද්‍යාර්ථීන් රාශියකටද ලබා දීමට කටයුතු කරන ලදී.

(16 වන පිටුවෙන්)

**ජන කවි . . .**

කුඹුක් ගස් ගොල්ලක් වෙතට පැමිණියාහු ගමන් විඩාව සංසිඳුවා ගැනීම පිණිස ගං ඉවුරේ හිඳ ගත්හ. ගඟ එගොඩ තල මලක් පිපී තිබෙනු දුටු ඔවුහු ''කවි කාරයෝ තල මල් සිවුපද ගොතත්ලු! අපිත් මේ තල මලට සිවුපදයක් බඳිමු'' යි කතිකා කර ගත්හ. ඉන්පසු--

''එගොඩ ගොඩේ තල මලකුත් පිපි ජ්ජා
යන පදය අප්පුවා කීය.

මෙගොඩ ගොඩට ඒ තලමල පෙනෙ ජ්ජා''
යන පදය ඔහුගේ සුහුරා කීය.

එහෙත් අනෙක් දෙපදය කියා සිවුපදය සම්පූර්ණ කිරීමට ඔහු දෙදෙනා අසමර්ථ වූහ. 'මෙය කෙසේ කරගත හැකි දැයි' කතා බහේ යෙදුණ ඒ දෙදෙනා ඒ සඳහා උගත් භික්ෂූන් වහන්සේ නමක් වෙසෙන අසල පන්සලකට ගොස් සිවුපදයේ තුන්වන, සතරවන පද සම්පූර්ණ කර දෙන ලෙස අයැද සිටියේය.

මේ කවිකම් මෙහෙවර ගැන සලකා බැලූ හිමිපාණෝ මෙසේ කීහ.

''වඩුකම් දන්නා වඩු රාළ කෙනෙකුට වඩුකම් නොදන්නා නියවෙකු විසින් අර්ධයක් කොටත් නිමවාගත නුහුණු ලී බඩුවක් සම්පූර්ණ කර දීමට වඩා අමුතුවෙන්ම ඒ මාදිලියේ බඩුවක් තනා දීම පහසුය. එපරිද්දෙන්ම කවි සිව්පද ගොතන්නට නොදත් නුඹලා දෙදෙනා විසින් යම්තමකට ගැට ගසා ගත් මේ කවි පද දෙකට සරිලන සේ තවත් දෙපදයක් අමුණා දීමට වඩා නුඹලාගේ පද දෙක සම්පූර්ණයෙන් විසි කර දමා ඒ වෙනුවට අමුතුවෙන්ම ''කවියක්ම'' රචනා කොට දෙන්නට කැමැත්තෙමි'යි කීහ. එවිට ඕ දෙදෙනා ''අනේ හාමුදුරුවනේ එහෙම නම් එපා. අපේ පද දෙක තිබෙන්නටම ඕනැය. නැත්නම් සිවුපදය අපේය කියා ගමේ රටේ ප්‍රසිද්ධ වන්නේ කොහොමද'යි ඔහු දෙදෙනා කීහ.

ඉන්පසු ස්වාමීන් වහන්සේ පළමු වෙනි පදය කීවේ අප්පුවා බවත්, දෙවෙනි පදය කීවේ ඔහුගේ හුරා බවත්, ඔවුන්ගෙන්ම අසා දැන ගෙන සිවුපදයේ එළිවැට හොඳින් වැටෙන සේ,

එගොඩ ගොඩේ තල මලකුත් පිපි ජ්ජා
මෙගොඩ ගොඩට ඒ තලමල පෙනි ජ්ජා
පළමු පදේ කීවේ අප්පු ව ජ්ජා
දෙවන පදේ කීවේ උගෙ හුව ජ්ජා

යයි කවිය සම්පූර්ණ කොට දුන්නේලු.


මෙහි පිපිජ්ජා, අප්පුවජ්ජා, හුවජ්ජා යන තැන්වල ඒ ප්‍රත්‍ය යෝජනයට හේතුවූයේ ඔවුන්ගේම ගැමි වහරේ අයුරින් කවි කීමේ උචිතකම සලකා ගෙන විය යුතුය.


මතු සම්බන්ධයි


## පුස්තකාල විද්‍යා ගුරුවරුන් උදෙසා


# පළමුවන


# වැඩ මුළුව











**පුස්තකාල විද්‍යා ගුරුවරුන් සඳහා සම්මන්ත්‍රණයක් සහ වැඩ මුළුවක් පසුගිය අප්‍රේල් මස කොළඹ මහජන පුස්තකාලීය සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. ගරු අධ්‍යාපන සේවා ඇමතිතුමා විසින් මෙම සම්මන්ත්‍රණය විවෘත කළ අතර, බ්‍රිතාන්‍ය මණ්ඩල පුස්තකාල අධ්‍යාපන උපදේශක ඈන් අර්වින් මහත්මිය විසින් වැඩ මුළුව පවත්වන ලදී.**

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, කැළණිය විශ්ව විද්‍යාලයීය පුස්තකාල අධ්‍යයන අංශය, කොළඹ විශ්ව විද්‍යාලයීය පුස්තකාල අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, ශ්‍රී ලංකා විද්‍යාත්මක හා කාර්මික තොරතුරු මධ්‍යස්ථානය යන ආයතනවලට පුස්තකාල විද්‍යා ගුරුවරුන් වශයෙන් සම්බන්ධ වන පුස්තකාලයාධිපතීන් රාශියක් මෙයට සහභාගි වූහ.

පුස්තකාල අධ්‍යාපන ක්ෂෙත්‍රයේ විවිධ අංග මෙහිදී පුළුල් වශයෙන් සාකච්ඡාවට භාජනය වූ අතර, මෙය ලංකාවේ පුස්තකාල විද්‍යා ගුරුවරුන් සඳහා පැවැත් වූ මේ වර්ගයේ පළමු වැඩ මුළුව විය පුස්තකාල විද්‍යා ගුරුවරුන් සඳහා මෙබඳු වැඩ සටහන් වාර්ෂිකව පවත්වා ගෙන යාමට ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පුස්තකාල අධ්‍යාපන සහ අභ්‍යාස අංශය බලාපොරොත්තු වේ.

**ඡායාරූප 1.** අධ්‍යාපන සේවා අමාත්‍ය ලයනල් ජයතිලක මහතා අබියස බ්‍රිතාන්‍ය මණ්ඩල උපදේශිකා ඈන් අර්වින් මහත්මිය පහන් දල්වයි. 2. ලං. ජා. පු. සේ. ම. සභාපති එස්. අතුකෝරල මහතා කතා කරයි. 3. අධ්‍යාපන සේවා අමාත්‍යතුමාගේ දේශණය. 4. වැඩ මුළුවට සහභාගි වූ පිරිසක්. 5. සමූළු සාකච්ඡා වාරයක්

**(ඡායාරූප : ඩී. ගලප්පත්ති)**


# තැපැල් මාර්ගික

# පාඨ මාලාවට

# මූල පිරුත වගයි




**ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මෙහෙයවන පුස්තකාල විද්‍යා ප්‍රලේඛන සහ ප්‍රවෘත්ති විද්‍යා තැපැල් මාර්ගික පාඨමාලාව පසුගිය මාර්තු මස 31 දින ගරු අධ්‍යාපන සේවා ඇමතිතුමා විසින් විවෘත කරන ලදී.**



දැනට ස්ථිර සේවයේ යෙදී සිටින නුපුහුණු පුස්තකාලයාධිපතීන් පුහුණු කරලීම මෙම පාඨමාලාවේ ප්‍රධාන පරමාර්ථය වේ. පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නම් කරන ලද මහජන සහ පාසැල් පුස්තකාලයාධිපතීන් හතළිස් හය දෙනෙක් පළමු වසරේ ශිෂ්‍යයින් හැටියට ලියා පදිංචි වී සිටිති.



ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන ක්‍රමයට සමාන ක්‍රමයක් මෙහිදී අනුගමනය කරන අතර, ඒ අනුව පාඨමාලා ශිෂ්‍යයින් වෙත තැපෑලෙන් යැවීමත්, ඊට අමතරව වරින් වර ප්‍රාදේශීය වශයෙන් සම්මන්ත්‍රණ, දේශන, ප්‍රායෝගික පුහුණු පාඨමාලා සංවිධානය කරලීමත් කරනු ලැබේ.



දිවයිනේ ප්‍රධාන පෙළේ වෘත්තීය පුස්තකාලයාධිපතීන් මෙම පාඨමාලාවේ ගුරුවරුන් වශයෙන් ක්‍රියා කරනු ලබන අතර, මෙම පාඨමාලාව ශ්‍රී ලංකාවේ පුස්තකාල අධ්‍යාපන කටයුතුවල විශේෂ සන්ධිස්ථානයක් ලෙස සැලකේ.



ඡායාරූප 1. අධ්‍යාපන සේවා අමාත්‍යතුමා චාරිත්‍රානුකූල පහන දල්වයි. 2. ලං. ජා. පු. සේ. ම. සභාපති එස්. අනුකෝරාල මහතා 3. අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ ලේකම් චන්ද්‍රා ද සොයිසා මහතා. 4. පළාත් පාලන කොමසාරිස් පැරාක්‍රම විජේසිංහ මහතා 5. පැමිණ සිටි සම්භාවනීය පිරිසෙන් කොටසක්.

# මාර්ග අධ්‍යාපනික ප්‍රකාශන

○ වාණිජ්‍යය

○ තර්ක ශාස්ත්‍රය

## අ.පො.ස (උසස් පෙළ) සිසුනට අවශ්‍යම පොත් දෙකක්

**නව නිර්දේශයේ අලුතින් ඇතුළත් කළ කොටස් අලලා විශේෂයෙන්
ලියවා මාර්ග ආයතනය සිසුන් අතට පත් කරයි.**

**අ.පො.ස. (උ. පෙළ) උපකාරක පොත් පෙළේ අංක: I සහ II**

---

**වාණිජ්‍යය: දේශීය සහ අන්තර් ජාතික සංවිධාන**

**මාල් විජයරත්න විසිනි**

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මහාචාර්ය හේම විජේවර්ධනගේ
උපදේශකත්වය යටතේ වෙසෙසින් සකස් වූ පොතකි.

**මිල රු. 22.50**

---

**නවීන තර්ක ශාස්ත්‍රය සහ භාරතීය තර්ක ශාස්ත්‍රය**

**ආචාර්ය ආර්. ඩී. ගුණරත්න සහ
ඇල්පිටියේ ඥාණිස්සර හිමියන් විසිනි.**

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දර්ශන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
**ආචාර්ය ආර්. ඩී. ගුණරත්න** මහතාගේ
විශේෂ උපදේශකත්වය යටතේ සකස් විය.

**මිල. රු. 19.50**

---

අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදෙස් සහ අනුදැනුම
ඇතිව ප්‍රකාශ කරන ලද

**අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා මාර්ග දේශකය**

අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටින අයදුම්කරුවනට එම විභාගයට සූදානම් වීමට උපකාරයක් වශයෙන්
විශේෂයෙන් සකස් කරන ලද්දකි.

**මිල රු. 27.50**

---

**තවත් විශිෂ්ඨ මාර්ග පරිවර්තනයක තෙවැනි මුද්‍රණය...**

**ජෝර්ජ් ඔවල් ගේ**

**ගොවිපළේ පෙරළිය**

උපහාසාත්මක නව කථාවකි

**පරිවර්තනය දයාරත්න ගුරුසිංහ**

**මිල රු. 15.75**

---

**මෙම සියලුම ප්‍රකාශන මාර්ග ආයතනයේ ප්‍රකාශන අංශයෙන් සහ
ප්‍රසිද්ධ පොත්හල් වලින් ලබාගත හැක.**

**මාර්ග ආයතනය** 61, ඉසිපතන මාවත, කොළඹ 5.

දුරකථනය 85186/81514

# SECOND INTERNATIONAL CONFERENCE OF DIRECTORS OF NATIONAL LIBRARIES

**Tokyo, Japan 15—19 Nov. 1982**

By N. AMARASINGHE
(*Director, National Library, Sri Lanka*)

**Directors of National Libraries in the Asian and Oceania regions met in Tokyo, Japan in Nov. 1982 to discuss international cooperation among National Libraries in Asia and Oceania. Following papers were read by the respective participants.**

**Mr. Harrison Bryan:** Director General, National Library of Australia. *Recent developments in international cooperation in library and information services in Asia and the Pacific : An Australian perspective.* **Mr. K. M. Karim:** Director of Archives and Libraries, Bangladesh. *Compilation of a National Bibliography : some problems.* **Rev. Lopen Pemala:** Director, National Library of Bhutan — *Past achievements actual state and future directions.* **Mr. Tan Xiangjin:** Deputy Director, National Library of China. *Some thoughts on resource sharing.* **Mr. Kantilal L. Jinna:** Chief Librarian. *Library Service of Fiji.* **Mr. Alex NG.** Chief Librarian, Urban Council Libraries Hongkong (Territory). *An introduction of the Urban Council Public Libraries, Hongkong.* **Mr. Subhas C. Biswas:** Director, Central Secretarial Library, India. *South East Asian Collection in India — Problems and prospects with emphasis on exchange of publications.* **Mastiri Hardo Prakoso** Director, National library of Indonesia. *The Role of the National library of Indonesia in resource sharing.* **Ma. Masahiro Arao:** Librarian, National Diet Library, Japan. *Some proposals for better understanding and close cooperation among librarians in Asia and Oceania.* **Mr. Kye-hyun Loh:** Librarian, National Library, Korea. *The Role of Central Libraries in the 1990s.* **Mr. Mohammed Hashin:** Director General, National Library of Malaysia. *Current priorities in Book Development and libraries.* **Mr. P. G. Scott:** National Librarian, New Zealand. *The New Zealand National Bibliography.* **Mr. Nematullah Bett:** Librarian, Liaquat Hall Library, Pakistan. *Preservation of deteriorating materials.* **Sir John Yocklumn:** National Librarian, Papua New Guinea. *Recent developments, with particular reference to resource sharing.* **Dr. Serafin D. Quiason** Director, NL of Philippines. *Inter-Asian and Oceanic Library Cooperation an illusive concept and a reality.* **Mrs. Hoding Anuar :** Director, NL of Singapore. *The NLDC— SEA Consortium.* **Mr. N. Amarasinghe:** Director, National Library of Sri Lanka. *National Library services in Sri Lanka.* **Mrs. Kullasap Gesmankit:** Director, NL of Thailand. *Resource sharing activities of the NL of Thailand* 1979 – 1982. **Mr. Trinh Giem:** Director, NL Viet-Nam. *Collection of legal deposit copies and compilation of Bibliographies at the National libraries of Viet-Nam.* **Mr. Shini Matsumoto:** GIP, Unesco. *Unesco's information activities on resource sharing.*

At the conclusion of the conference, the following recommendations were unanimously adopted :

## RECOMMENDATIONS

The Second International Conference of Directors of National Libraries on Resource Sharing in Asia and Oceania meeting in Tokyo from 15th to 19th November 1982, hereby proposes :

(1) **Recognizing the importance of the role of a national library as the centre for national and international resource sharing, the Conference recommends :**

(*A*) **that in countries where national libraries have not been established yet, the governments of countries concerned consider the establishment of such institutions so that the role of a national library be recognized and carried out effectively.**

(*B*) **that in countries where national libraries have already been established, they direct increased attention and effort toward resource sharing.**

(2) Recognizing that effective resource sharing depends largely upon access to materials, especially in such countries where library resources are extremely limited, the Conference recommends that all national libraries in Asia and Oceania make every effort to make their resources available as far and as freely as possible for the purpose of international lending and reprographic services.

(3) Recognizing the importance and value of a national bibliography as an effective tool for

implementing national and international lending and reprographic services, the Conference recommends that in countries which do not yet have a national bibliography, governments of these countries consider providing positive assistance for the compilation of a national bibliography.

(4) Recognizing that a legal deposit system designed to ensure the comprehensive acquisition of national publications by the national library, is an essential basis for compiling a national bibliography, the Conference recommends that a high priority be given to the introduction of this system in countries where it does not yet exist. As regards the countries where legal deposit already exists, the Conference felt that an appreciable amount of materials published in most countries is not received as legal deposit and listed in national bibliographies. The Conference, therefore, recommends that governments experiencing such difficulty review their legal deposit legislation and establish such further machinery to enlarge the catchment of materials to collect the remaining percentage that escapes listing.

(5) Recognizing the existence of a number of old and historical documents in the region which are in danger of being lost to the country of origin, the Conference recommends that each government provide assistance to its national library or other appropriate institutions to locate these documents in order to collect and preserve them through purchase or copying.

(6) In order to prevent the deterioration of printed materials caused by tropical climatic conditions as well as by chemical reactions in paper itself, the Conference recommends :

(*A*) that each country formulate effective preservation policies;

(*B*) that assistance be sought for the improvement of facilities for training and research in conservation in the region; and

(*C*) that assistance be provided to countries in the region without conservation laboratories to establish such facilities.

(7) Recognizing the increasing need to apply modern information technology to various aspects of library operations, such as the compilation of bibliographies, information retrieval etc., the Conference recommends that each national library consider the introduction of such technology when and wherever appropriate.

(8) In order to promote better understanding and closer co-operation among national libraries in Asia and Oceania, the Conference recommends :

(*A*) that consideration be given to the holding of more frequent meetings, not necessarily limited to heads of the institutions, for the exchange of information, views and experiences, but especially in order to establish personal contacts, and

(*B*) that the exchange of information among libraries be promoted;

(*a*) by the exchange of their own publications such as information bulletins, annual reports, statistics, etc.

(*b*) by the publication and distribution of a newsletter (Co-ordinator, Librarian of the National Diet Library, Tokyo) designed to serve as a forum for effective communication among librarians in Asia and Oceania, and

(*c*) by the publication and distribution of other appropriate materials.

(9) Recognizing the need for training and transfer of technology and expertise at regional and international levels, the Conference recommends:

(*A*) that countries with library schools and well-equipped libraries be encouraged to welcome trainees from less developed countries for professional education and work experience, and

(*B*) that UNESCO, IFLA, IDRC or other international aid agencies provide funds to facilitate the implementation or secure the continuation of these programmes for staff training.

(10) Recognizing the value and the necessity of continuing dialogue among the national libraries in this region, the Conference recommends that a meeting such as the present one be held once every three years, and that the **next Conference be held in Sri Lanka in 1985, if possible.**

(11) Recognizing the importance of the recommendations adopted by the International Congress on Universal Availability of Publications held in May 1982 as well as the proposals already adopted by IFLA, both in this area and in relation to Universal Bibliographic Control, the Conference recommends that each country take appropriate steps to achieve the aims set out in these recommendations and proposals.

*Contd. on p.* 38.

# කුඩා කාර්මික ආයතන පුස්තකාල

**2 වන කොටස**

## තාක්ෂණික පුහුණුවක් නොලැබූ පුස්තකාලයාධිපතීන් සඳහා නියමුවකි

**ඩී. ජේ. කැම්බල්**

''කුඩා කාර්මික ආයතන පුස්තකාල'' නමැති මෙම ලිපියේ මුල් කොටස 'පුස්තකාල ප්‍රවෘත්ති' 3 වන කලාපයේ අංක 3/4 සඟරාවේ පළ විය. මෙම ලිපිය සම්පාදිතව ඇත්තේ තාක්ෂණික වාතාවරණයක් තුළ සේවය කරන, එහෙත් තාක්ෂණික අධ්‍යාපනයක් හෝ එම ක්ෂේත්‍රයේ පරිචයක් නොලැබූ පුස්තකාලයාධිපතීන්ට සහාය වීමේ පරමාර්ථයෙනි. මෙහිදී එම පුස්තකාලයාධිපතීන් පුස්තකාල වෘත්තීමය සුදුසුකම් ලැබූ අය ලෙස හෝ පුස්තකාල ක්ෂේත්‍රයෙහි පුහුණුව ලැබූ අය ලෙස පරිකල්පනය කරන ලද අතර, හුදු අත්දැකීමෙන්ම පමණක් ඉගෙනීමට සිදුවී ඇති කරුණු කිහිපයක් පිළිබඳව ඔවුනට දැනුමක් ලබා දීමට මෙම ලිපිය මගින් ප්‍රයත්න දරා ඇත. මෙම ලිපියේ භාවිතා කර ඇති 'තාක්ෂණික' යන යෙදුමට 'විද්‍යාව' 'විද්‍යාත්මක' යන අරුත්ද ඇතුළත් වන බව සැලකුව මැනවි.

**මෙම ලිපිය සහකාර අධ්‍යක්ෂ ධනපාල ගුණසේකර මහතා විසින් පරිවර්තනය කරන ලදී.**

### 3. කුඩා කාර්මික ආයතන පුස්තකාල: ඒවායේ කාර්ය මණ්ඩලය, පොත් තොගය හා මුදල්:

ප්‍රධාන වශයෙන් මෙම ගණයට වැටෙන පුස්තකාල නම් කාර්මික විද්‍යාල, පර්යේෂණ ආයතන හා නිෂ්පාදන ආයතන සතු පුස්තකාල වේ.

### 3.1 කාර්මික විද්‍යාල පුස්තකාල

පොදුවේ බලන විට මෙම පුස්තකාල වර්ගය වෙනත් පුස්තකාල වර්ගවලින් වෙනස් වන්නේ මේවා මගින් පුළුල් විෂය ධාරාවක් නොගැඹුරු මට්ටමින් ආවරණය කිරීමට සිදුවීම නිසාය. මෙම පුස්තකාලවලින් ප්‍රයෝජන ලබා ගන්නේ ශිෂ්‍යයෝය. ඔවුහු කාර්මික විද්‍යාලයේ රැඳී සිටින්නේ වර්ෂ 1–3 අතර කාලයක් පමණි. මේ නිසා ආයතනය කෙරෙහි භක්තියක් හෝ ආයතනය සතු දේපල කෙරෙහි ඇල්මක් ඔවුන් තුළ ඇති නොවීමට බොහෝ දුරට අවකාශ ඇත. මේ නිසා මෙම පුස්තකාල පාලනයේදී වඩාත් නිල ස්වරූපයෙන් කටයුතු කිරීමට සිදුවේ. මෙම ලිපියේ සම්පාදකයා දන්නා තරමින් කාර්මික විද්‍යාල පුස්තකාල කාර්ය මණ්ඩලය, පොත් තොගය හා මුදල් ප්‍රතිපාදන පිළිබඳව ප්‍රකාශයට පත්කර ඇති එකම ප්‍රමිතිය වන්නේ (12) බ්‍රිතාන්‍ය පුස්තකාල සංගමයේ කාර්මික විද්‍යාල හා වැඩිදුර අධ්‍යාපන අංශය මගින් 1971 දී නිකුත් කරන ලද ප්‍රමිතියයි. එම ප්‍රමිතියට අනුව කාර්මික විද්‍යාල පුස්තකාල, විද්‍යාල වාරය තුළ සතියකට පැය 60 ත් 66 ත් අතර විවෘතව තැබිය යුතු වන අතර, විද්‍යාල නිවාඩු කාල තුළදී කාර්යාල වේලාවන් තුළ විවෘතව තැබිය යුතුය. මෙම ප්‍රමිතීන්ට අනුව බ්‍රිතාන්‍යයේ ඇති මූළමනින්ම තාක්ෂණික විෂයයන්ට නැඹුරු නොවූ භාෂාවන්, විනෝදාංග වැනි විෂයයන්ද ඇතුළු පුළුල් විෂය ධාරාවක් ඉගැන්වෙන,වැඩිදුර අධ්‍යාපන ආයතනවල පුස්තකාල සඳහා මිළදී ගත යුතු අවම වාරික ප්‍රකාශන සංඛ්‍යාව 100 ක් වේ.

ප්‍රමිතියේ සඳහන් නොවුනද කුඩා කාර්මික විද්‍යාල පුස්තකාලයකට වුවද අවම වශයෙන් වාරික ප්‍රකාශන 250 ක් වත් නොමැතිව පාඨකයින්ට ප්‍රමාණවත් සේවාවක් ඉටු කළ හැක්කේ කෙසේදැයි වටහා ගත නොහැකිය. සැලකිය යුතු තත්වයේ උසස් අධ්‍යාපන පාඨමාලා පවත්වන විද්‍යාලවල, පුස්තකාල සඳහා අවම වශයෙන් වාරික ප්‍රකාශන 600 ක් වත් ලබාගත යුතුවේ.

උපාධි මට්ටමට වඩා පහත් තත්වයේ පාඨමාලාවක් පවත්වන විද්‍යාලයක පුස්තකාලයේ මූලික පොත් තොගය අවම වශයෙන් 10,000ක් වත් විය යුතු අතර උපාධි හා ඊට වඩා උසස් පාඨමාලා පවත්වන විද්‍යාලවල මෙම සංඛ්‍යාව 25,000 කට අඩු නොවිය යුතුය. එසේම උපාධි මට්ටමේ පාඨමාලා වැඩි ගණනක් වේ නම් ඊට අනුරූප වන සේ පොත් සංඛ්‍යාවද වැඩි විය යුතුය. තවද, අධික ඉල්ලුමක් ඇති පොත්පත්වල මෙන්ම බහුලව ප්‍රයෝජන ගන්නා වාරික ප්‍රකාශන හෝ වෙනත් දැනුම් ද්‍රව්‍යවල බහු පිටපත් මිලයට ගැනීමටද සිදුවේ.

ඉහත කී ප්‍රමිතීන් අනුව පූර්ණ කාලීනව සේවා සපයන පුස්තකාලයක, ආයතන කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයින් 20 කටම එක් පුස්තකාල නිලධාරියෙකු බැගින්වත් සිටිය යුතුය. එසේම මොවුන්ගේ වෘත්තිය නොවන නිලධාරින්ගේ අනුපාතය 2:3 විය යුතුවේ.

පුස්තකාල කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව වැඩි කිරීමට හේතු වන කරුණු 3 ක් මෙම ප්‍රමිතීන්හි සඳහන් කර ඇත. එනම්:

1. ශාඛා පුස්තකාල හෝ සේවා ස්ථාන එකිනෙකින් ඈත්ව පිහිටුවා තිබීම. (උදා:—විශාල හෝ විමධ්‍යගත විද්‍යාල පුස්තකාල සේවා සඳහා)
2. ඇතැම් පාඨක වර්ගවලින් පුස්තකාල සේවා සඳහා විශාල ඉල්ලුමක් තිබීම. (උදා:— පර්යේෂකයෝ)
3. කුඩා විද්‍යාලවල මූලික කාර්ය මණ්ඩල අවශ්‍යතා. (උදා:—අවම වශයෙන් 3 දෙනෙකුගෙන්වත් යුත් කාර්ය මණ්ඩලයක් සිටිය යුතුය.)

විවිධ වර්ගවලට අයත් පුස්තකාල ද්‍රව්‍ය සඳහා අවශ්‍ය ඉඩකඩ පිළිබඳ නියමුවක්ද ඉහත කී ප්‍රමිතීන්ට ඇතුළත් වේ. ඊට අනුව උපාධි මට්ටමින් පහළ සෑම තාක්ෂණික විද්‍යා පූර්ණකාලීන ශිෂ්‍යයින් 5 දෙනෙකුටම එක් කියවීම් ස්ථානයක් බැගින් තිබිය

යුතුය. අර්ධකාලීන ශිෂ්‍යයින් සඳහා මෙම සංඛ්‍යාව 10 කට එක් කියවීම් ස්ථානයකි. මීට අතිරේකව විද්‍යාලයීය ගුරු මණ්ඩලයේ සෑම නිලධාරීන් 10 දෙනෙකුටම එක් කියවීම් ස්ථානයක් බැගින් සපයා තිබිය යුතුය. උපාධි මට්ටමින් පහළ ශිෂ්‍යයින්ගේ කියවීම් ස්ථානයක් සඳහා අවම වශයෙන් වර්ග මීටර් 2.5 ක (වර්ග අඩි 25 ක්) ඉඩ ප්‍රමාණයක්ද උපාධි ශිෂ්‍යයින්ගේ කියවීම් ස්ථානයක් සඳහා වර්ග මීටර් 3.5ක් (වර්ග අඩි 35ක) ඉඩ ප්‍රමාණයක් ද අවශ්‍ය වේ. මෙම ඉඩ පහසුකම්-වලට අතිරේකව පුස්තකාලයේ ප්‍රයෝජනවත් බව පිළිබඳව පාඨකයින්ට අවබෝධයක් ලබාදීම සඳහා පන්ති පැවැත්වීම පිණිස වර්ග මීටර් 45–60 (ව. අ. 450–600) ප්‍රමාණයේ පන්ති කාමරයක්ද තිබිය යුතුවේ. පුස්තකාල කාර්ය මණ්ඩලයේ එක් නිලධාරියෙකු වෙනුවෙන් වර්ග මීටර් 10 ක (ව.අ. 100 ක) ඉඩ ප්‍රමාණයක් වෙන් කළ යුතුය. ඔවුන් කටයුතු කරන ලේඛන හා උපකරණ සඳහා අවශ්‍ය ඉඩකඩද මෙයට ඇතුළත්ය. මේ සියල්ලටම අතිරේකව සේවා ස්ථාන සඳහා පුස්තකාලයේ මුළු ඉඩකඩ ප්‍රමාණයෙන් 33.3% ක ඉඩක් වෙන් කළ යුතුවේ. පුස්තකාලයාධිපතිවරයාගේ කාර්යාලය රැස්වීම්, සාකච්ඡා ආදිය සඳහාද පාවිච්චි කරන හෙයින් වර්ග මීටර් 20 ක (ව.අ. 200ක) ඉඩ ප්‍රමාණයක් අවශ්‍යය.

කුඩා කාර්මික විද්‍යාල පුස්තකාලයක් සඳහා වර්ග මීටර් 600 (ව.අ. 6000) ක්ද ප්‍රාන්ත විද්‍යාලයක පුස්තකාලයක් සඳහා වර්ග මීටර් 1800 (ව.අ. 18000) ක්ද අවශ්‍ය බවට මෙම ප්‍රමිතීන් මගින් යෝජනා කර ඇත.

ඉහත දැක්වූ ප්‍රාන්ත විද්‍යාලයීය පුස්තකාල සාමාන්‍යයෙන් 1,00,000 ක පමණ ජනගහනයකට සේවය කරයි. මෙම ප්‍රමිතීන්ට අනුව කාර්ය මණ්ඩල වැටුප් හැර සාමාන්‍ය ප්‍රමාණයේ විද්‍යායතනවල මුළු වියදමෙන් 2% ක ප්‍රතිපාදනයක් පුස්තකාලය සඳහා වෙන් කළ යුතුය. විශාල විද්‍යාල පුස්තකාල සඳහා මෙම ප්‍රතිපාදනයේ ප්‍රතිශතකය ආයතනයේ මුළු වියදමෙන් 3%කි.

ඇත්ත වශයෙන්ම මහා බ්‍රිතාන්‍යයේ වුවද කාර්මික විද්‍යාල පුස්තකාල සියල්ලකම මෙම ප්‍රමිතීන් දක්නට නොලැබේ. දියුණුවෙමින් පවතින රටවල කාර්මික විද්‍යාල පුස්තකාල වලට මෙම ප්‍රමිතීන් වෙත ළඟාවීමට ප්‍රායෝගික වශයෙන් කිසිසේත්ම හැකි නොවනු ඇත. කෙසේ වුවද, තම පුස්තකාලය සංවර්ධනය කිරීම සඳහා හොඳ ඉලක්ක ලෙස මෙම ප්‍රමිතීන් උපයෝගී කරගත හැකිය.

කාර්මික විද්‍යාලයීය පුස්තකාලයාධිපතිවරයා කෙලින්ම විදුහල්පති වෙත වගකිවයුතු නිලධාරියෙකු වන අතර විද්‍යාලයේ ප්‍රතිපත්ති හා සැලසුම් නිර්ණය කරන සියළුම කමිටු රැස්වීම් වලට ඔහුද සහභාගී විය යුතුය. එසේ සහභාගී නොවන්නේ නම් අවම වශයෙන් එම කමිටු රැස්වීම්වල වාර්තා ඔහු වෙත සැපයිය යුතුවේ. විද්‍යාලයීය ප්‍රතිපත්ති වෙනස්වීම් හැම විටම යම්කිසි අන්දමකින් පුස්තකාලය කෙරෙහි බලපාන හෙයිනි. එහෙත් බොහෝ විට සිදුවන්නේ විෂය නිර්දේශයක පුළුල් කිරීමක් පිළිබඳව පුස්තකාලයාධිපතිට දැනගැනීමට ලැබෙන්නේ එම පුළුල් කිරීමට අදාළ පොත්පත් ශිෂ්‍යයින් විසින් පුස්තකාල-යාධිපතිගෙන් ඉල්ලන විටදීය. මේ නිසා විද්‍යාලයක පරිපාලන ව්‍යුහයේ වෙනත් අංශ ප්‍රධානීන්ගේ තත්වයට සම තත්වයක් පුස්තකාලයාධිපතිවරයාටද හිමිවිය යුතුවේ.

## 3.2 කාර්මික ආයතන පුස්තකාල හා ප්‍රවෘත්ති සේවා දෙපාර්තමේන්තු:

ජනසතු කළ කර්මාන්ත ආයතන, කුඩා වෙළඳ සමාගම් හා සංවිධාන හෝ විශාල වෙළඳ සමාගම්වල දෙපාර්තමේන්තු, කාර්මික කටයුතුවල නියැලී නොමැති එහෙත් කාර්මික ක්ෂේත්‍රයට සේවය කරන වාණිජ සංවිධාන, සංවර්ධන සංවිධාන හෝ පර්යේෂණ ආයතන ආදිය සතු පුස්තකාල මෙම ගණයට අයත්වේ. මේ අනුව බලන විට කාර්මික ආයතන පුස්තකාල වලින් වැඩි කොටසක්ද සියළුම කාර්මික පුස්තකාලද සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් පර්යේෂණ පුස්තකාල ලෙස හැඳින්විය හැකිය.

කාර්මික ආයතන පුස්තකාල සඳහා සම්මත පොදු ප්‍රමිතියක් නොමැත. එවැනි ප්‍රමිතියක් ගොඩ නැගීමටද අපහසුය. ඇමරිකා එක්සත් ජනපදයේ විශේෂ පුස්තකාල සංගමය විසින් පළකර ඇති ''විශේෂ පුස්තකාල සඳහා අරමුණු හා ප්‍රමිති'' (34) නමැති ප්‍රකාශනයෙහි මේ සඳහා ප්‍රයෝජනයට ගත හැකි නියමු පන්තියක් දක්වා ඇති නමුත් කාර්ය මණ්ඩලය පුස්තකාල ද්‍රව්‍ය, මුදල් ප්‍රතිපාදන හෝ වියදම් අනුපාත ආදිය දක්වා නැත. එම සංගමයෙන්ම නිකුත් කරන ලද තවත් ලේඛනයක (31) පුස්තකාලයක සේවාවන් අගය කිරීම සඳහා ඉතාමත් ප්‍රයෝජන-වත් වන ක්‍රම ගැන දක්වා ඇත.

මේ තත්වය මත මෙම ක්ෂේත්‍රයේ විශේෂඥයන් විසින් යෝජනා කර ඇති ප්‍රමිතීන්වල පිහිට සේවීමට අපට සිදුවේ. 1956 දී එවැනි විශේෂඥයෙකු වූ බින්ස් (22) විසින් ඉන්ජිනේරු පර්යේෂකයන් හා විද්‍යාඥයින් 200 කට සේවා සපයන්නා වූද, පුහුණු පුස්තකාලයාධිපතීන් තිදෙනෙකු ඇතුළු 7 දෙනෙකුගෙන් යුතු කාර්ය මණ්ඩලයකින් සමන්විත වූද, නිශ්චිත සේවා කටයුතු ඇත්තා වූද, කාර්මික ආයතන පුස්තකාලයක් සඳහා ප්‍රමිති මාලාවක් සම්පාදනය කර ඇත. පුස්තකාලයට අවශ්‍ය උපකරණ පිළිබඳ විස්තරාත්මක තොරතුරු මෙම ප්‍රමිති මාලාවට ඇතුළත් වෙයි. එහෙත් 1956 යේ පැවැති තත්වය අනුව මෙම ප්‍රමිතිවල දී ඇති වැය ඇස්තමේන්තු උද්ධමනයේ ප්‍රතිඵලයක් වශයෙන් අද දෙගුණ වී ඇති බවට සැකයක් නැත. එසේම මෙම ප්‍රමිතීන් අරපිරිමැස්ම ගැන සිතා සකස් කළ ඒවා නොවේ. එහෙයින් යුරෝපයේ කාර්මික ආයතන අතුරින් මෙම ප්‍රමිතීන් අනුගමනය කරන්නේ ඉතා සුළු සංඛ්‍යාවක් පමණි.

මෙම ලිපියේ සම්පාදකයා විසින් බ්‍රිතාන්‍යයේ ඇස්ලිබ් ආයතනය වෙනුවෙන් 1956 – 58 කාලය තුළදී වාණිජ හා තාක්ෂණික ක්ෂෙත්‍රයේ පුස්තකාල අළලා කරන ලද සමීක්ෂණයකදී පැහැදිලි වූයේ සමීක්ෂණයට භාජනය කරන ලද පුස්තකාල 52 න් 36 කම සේවයේ යොදවා තිබුණේ පාඨකයින් 54 දෙනෙකු සඳහා එක් ප්‍රවෘත්ති නිලධාරියෙකු බැගින් බවයි. නියත දත්තයන් අනුව බලන විට ඇත්ත වශයෙන්ම එක් නිලධාරියෙකු විසින් සේවය සැපැයිය යුතු පාඨක සංඛ්‍යාව 20 සිට 200 කට අධික සංඛ්‍යාවක් දක්වා විසිර තිබුණි. මෙම වාර්තාව (11) 1960 දී පළ කරන ලදී.

දීර්ඝ පළපුරුද්දක් ඇති කාර්මික ආයතන පුස්තකාලයාධිපතිවරයෙකු වන ඇෂ්වර්ත් බ්‍රිතාන්‍ය කළමනාකාරිත්ව ආයතනය විසින් 1961 දී සංවිධානය කරන ලද සම්මන්ත්‍රණයක කළ දේශනයකදී පුස්තකාල කාර්ය මණ්ඩලය පිළිබඳ ප්‍රමිතියක්

යෝජනා කළේය. විවිධ ප්‍රමාණයේ පුස්තකාල විසින් උපයෝග කරගත යුතු විවිධ වර්ගවල පුස්තකාල විද්‍යා හා ප්‍රවෘත්ති සේවා නිලධාරීන් සංඛ්‍යාව පිළිබඳ තරමක විස්තරයක්ද මෙම ප්‍රමිතියට ඇතුළත් විය. මෙම දේශන වාර්තාවට (21) පුළුල් ප්‍රචාරයක් නොලැබුණු හෙයින් ඔහුගේ යෝජනාවන් ඇතුළත් සටහනක් මෙහි පහත දක්වා ඇත. **(සටහන් පහත දැක්වේ)**

පුස්තකාල කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව නිර්ණය කිරීමේදී වැදගත් වන සාධක 4 ක් ගැන ඇෂ්වර්ත් විසින් අවධාරණය කර ඇත. ඒවා නම්:-

1. ආයතනයේ කාර්ය පද්ධතියට භාජනය වී ඇති විද්‍යාත්මක අන්තර්ගතය.
2. ආයතනය තුළ ඇති තොරතුරු ප්‍රවාහන ජාලයේ කාර්යක්ෂම භාවය.
3. පුස්තකාලයෙන් බලාපොරොත්තුවන සේවාවන් හා එම සේවාවන්ගේ විෂය පථය.
4. එමඟින් සේවය ලබන සංවිධානයේ ප්‍රමාණය.

මින් ප්‍රථම සාධකය පුළුල් වේ නම් හා දෙවැනි සාධකය දුර්වල නම් සේවාව සඳහා වැඩි පුස්තකාල නිලධාරීන් සංඛ්‍යාවක් අවශ්‍ය වෙයි. මෙම ප්‍රමිතීන් මඟින් පුස්තකාලයෙන් බලාපොරොත්තු වන සේවාවක් ලෙස ඇෂ්වර්ත් දක්වන්නේ කඩිනම් හා කාර්යක්ෂම සේවාවකි. ආයතනය විසින් පුස්ත-

| පුස්තකාලයේ සේවා ලාභී උපාධිධාරී කාර්මික නිලධාරි සංඛ්‍යාව | යෝජිත ප්‍රවෘත්ති සේවා හා පුස්තකාල කාර්ය මණ්ඩලය |
|---|---|
| 1 – 5 | සියළුම අදල විෂයයන් සඳහා කාර්මික නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය වේ. අවශ්‍යතා අනුව පර්යේෂණ සංවිධානය හා වෙනත් බාහිර තොරතුරු සේවා හා සම්බන්ධතා පවත්වා ගැනීමට ඔහුගේ කාලයෙන් 1/10 සිට $\frac{1}{4}$ දක්වා කාලයක් වැයවනු ඇත. |
| 5 – 10 | කුඩා පුස්තකාලයක් අර්ධකාලීන වශයෙන් ලිපිකරු නිලධාරියෙකුට පවත්වාගෙන යා හැකිය. එහෙත් සම්බන්ධතා වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා කාර්මික නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය වේ. |
| 10 - 20 | එක් පුස්තකාලයාධිපතිවරයෙකු (ස්ත්‍රීන් විශේෂයි) ප්‍රමාණවත්ය. ලිපි ගනුදෙනු හැර ඉතිරි ලිපිකරු සේවාවන් එම නිලධාරියාටම ඉටුකළ හැක. යම්තම් තොරතුරු සේවාවක් පවත්වා ගත හැකිය. |
| 20 – 30 | I ඉන්ජිනේරු තාක්ෂණ වේදය, රසායනික ඉන්ජිනේරු විද්‍යාව වැනි විෂයයන් ආවරණය කරන පුස්තකාල සඳහා කාර්ය මණ්ඩලය 2 කි. II ගුවන් ඉන්ජිනේරු තාක්ෂණ වේදය, උපකරණ වේදය, කාබනික රසායනය, ප්ලාස්ටික් නිෂ්පාදන වැනි විෂයයන් ආවරණය කරන පුස්තකාල සඳහා කාර්ය මණ්ඩලය 3 කි. |
| 30 – 50 | 3 කි. |
| 50 – 100 | සාමාන්‍යයෙන් 4 කි. එහෙත් උසස් මට්ටමේ විද්‍යාත්මක, කාර්මික ආයතන පුස්තකාල සඳහා 5 දෙනෙක් අවශ්‍යයි. |
| 100 – 150 | සාමාන්‍යයෙන් 5 කි. උසස් මට්ටමේ විද්‍යාත්මක හා තාක්ෂණික ආයතන සඳහා 6 දෙනෙක් අවශ්‍ය වේ. |
| 200 – 300 | සාමාන්‍යයෙන් පාඨකයින් 30 කට එක් නිලධාරියෙකු බැගිනි. උසස් විද්‍යාත්මක ආයතනවල නම් පාඨකයන් 25 කට එක් අයෙකු බැගින් විය යුතුයි. |
| 300 – 500 | සාමාන්‍යයෙන් පාඨකයින් 40 කට එක් අයෙකු බැගිනි. උසස් මට්ටමේ විද්‍යාත්මක ආයතනවලට පාඨකයන් 35 කට එක් නිලධාරියෙකු බැගින් අවශ්‍ය වේ. |

කාලයෙන් අපේක්ෂා කරන්නේ අවසන් මොහොතේ ප්‍රාතිහාර්‍ය්‍ය පෑමක් නම් නියත වශයෙන්ම එය ඉටු කළ හැකිය. එහෙත් එය ඉටු කිරීමට නම් පුස්තකාල කාර්ය මණ්ඩලයේ විශාල ශ්‍රමයක් හා කාලයක් විස්තරාත්මක සූචිකරණය වෙනුවෙන් කැප කිරීමට සිදුවනු ඇත.

පුස්තකාල හා තොරතුරු සේවා කාර්ය මණ්ඩලයක් සමන්විත විය යුතු ආකාරය පිළිබඳව විස්තරද ඈෂ්වර්ත්ගේ ප්‍රමිතීන්ට අයත් වේ. ඔහුගේ කෘතියෙහි පුස්තකාල 25 කින් සමන්විත වන කාර්ය මණ්ඩලයක් දක්වා වර්ග කර තිබුණි. එහි කාර්ය මණ්ඩලය 10 ක් දක්වා වර්ග කරන ආකාරය මෙහි පහත උපුටා දක්වා ඇත.

| කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව | ප්‍රවෘත්ති නිලධාරි | එම නියෝජ්‍ය | ප්‍රවෘත්ති සහායක | පරිවර්තක | පු. පති | පු. සහකාර | ලිපිකරු | ලඝු ලේඛක | යතුරු ලේඛක |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | — | — | — | — | 1 | — | — | — | 1-2 |
| 2 | — | — | — | — | 1 | — | — | 1 | — |
| 3 | 1 | — | — | — | — | 1 | — | 1 | — |
| 4 | 1 | — | — | — | 1 | 1 | — | 1 | — |
| 5 | 1 | — | — | — | 1 | 1 | — | 1 | 1 |
| 6 | 1 | — | 1 | — | 1 | 1 | — | 1 | 1 |
| 7 | 1 | — | 1 | — | 1 | 1 | 1 | 1 | 1 |
| 8 | 1 | — | 1 | — | 1 | 2 | 1 | 1 | 1 |
| 9 | 1 | — | 2 | — | 1 | 2 | 1 | 1 | 1 |
| 10 | 1 | 1 | 1 | — | 1 | 2 | 1 | 1 | 2 |

මෙම ලිපියේ සම්පාදකයාගේ අදහස නම් අවශ්‍ය අවස්ථාවලදී පුස්තකාල කටයුතු සඳහා ආයතනයේ යතුරු ලේඛක කණ්ඩායමෙන් පිටපත් යතුරු ලියීමට හා ලිපි කටයුතු කිරීමට කැමති ලඝු ලේඛකයකුගේ සහාය ලබා ගැනීම වඩාත් සුදුසු බවයි. මෙම ප්‍රමිතීන් සැකසීමේදී ඈෂ්වර්ත් විසින් ප්‍රධාන වශයෙන්ම සැලකිල්ලට ගෙන ඇත්තේ පුස්තකාලයේ සේවාව ලබන උපාධිධාරී කාර්මික නිලධාරීන්ගේ සංඛ්‍යාවයි. මෙම හේතුව නිසා උද්ගතවී ඇති දුෂ්කරතාවයන් 2 ක් වෙයි. ඉන් පළමු වැන්න නම් එතරම් ගැඹුරු නොවක විද්‍යාත්මක පදනමක් සහිත ඇතැම් ඉන්ජිනේරු විද්‍යා ක්ෂේත්‍ර වැනි කර්මාන්තවල වගකිව යුතු නිලතල දරණ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් බොහෝ දෙනෙක් උපාධිධාරීන් නොවීමයි. එවැනි තත්වයක් මත එම නිලධාරීන්ගෙන් කුමන නිලධාරීන් උපාධිධාරීන් හා සම තත්වයෙහි ලා සැලකිය යුතුද? නිලධාරියෙකු සතු වගකීම් භාරය පිළිබඳව තේරුම් ගැනීමට ඔහුගේ නිල නාමය හැමවිටම හොඳ සාධකයක් නොවේ. දෙවන දුෂ්කරතාවය නම් පුස්තකාලය කිසිසේත්ම පාවිච්චි නොකරන හෝ ඉතා කලාතුරකින් පාවිච්චි කරන කාර්මික නිලධාරීන් මෙන්ම තාක්ෂණ වේදීන්ද බොහෝ වීමයි. ඒන් සමහරු පුස්තකාලය පාවිච්චි කරන්නේ සහරාවක් දෙකක් උඩින් පල්ලෙන් බැලීම සඳහා පමණකි. ඔවුන් වෙනුවෙන් පුස්තකාල කාර්ය මණ්ඩලයේ කාලය වැය කිරීමක් අවශ්‍ය නොවේ. තරුණ අය මෙන්ම තම විෂය ගැන එතරම් උද්යෝගයක් නොදක්වන අයද බොහෝවිට කිය වන්නේ තමන්ට අනිවාර්යයෙන්ම කියවීමට සිදුවී ඇති ලේඛණ පමණකි.

මේ නිසා පුස්තකාලය විසින් අනුගමනය කළ හැකි හොඳම ක්‍රමය වන්නේ පෝර්මන් තනතුරට වඩා ඉහළ තනතුරු දරන්නා වූත්, අවම වශයෙන් මසකට වරක්වත් පුස්තකාලය පරිහරනය කරන්නාවූත් නිලධාරීන්ගේ සංඛ්‍යාව පාදක සංඛ්‍යාව ලෙස සැලකීමය. ඈෂ්වර්ත්ගේ වචනවලින්ම කියතොත් යම් ආයතනයක පාලන ව්‍යුහය තුළ විශ්වාසයෙන් යුතුව වගකීමක් භාරදීමට නොහැකි තරම් පහත් නිල මට්ටමක ප්‍රවෘත්ති නිලධාරියා තබා ඇත්තේ නම් එබඳු තනතුරකින් ආයතනයට ප්‍රයෝජනයක් අත් නොවේ. කණිෂ්ඨ නිලධාරියෙකු මෙම තනතුරට පත් කළහොත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් "පුස්තකාලයාධිපතිවරයා කණිෂ්ඨ නිලධාරියෙකි" යන ආකල්පයෙහි පිහිටා ඔහුගේ අදහස් හෝ යෝජනාවලට අවධානය යොමු නොකරනු ඇත. එසේම තමන්ගේ ප්‍රශ්න කෙළින්ම ඔහු වෙත ඉදිරිපත් කිරීමටද ඔවුන් නොපෙළඹෙනු ඇත. මෙම තනතුර සඳහා සමානයෙක් පත් කළහොත් අන් නිලධාරීන් ඔහුට සමානයෙක් වශයෙන් සලකනු ඇති අතරම ඔවුන් ආධාර පතා ඔහු වෙත පැමිණෙනු ඇත. එහෙත් හැමවිටම ඔවුන් තම ප්‍රශ්න කෙළින්ම ප්‍රවෘත්ති නිලධාරියා වෙත ඉදිරිපත් කරන බවක් මින් අදහස් නොකෙරේ. ආයතනවල අධ්‍යක්ෂවරුන්ට සිය කාර්යයන් බොහෝවිට තම කණිෂ්ඨ නිලධාරීන් වෙත පැවරීමට සිදුවේ. එසේම ඔවුනට යම් කිසිවක් පිළිබඳ තොරතුරු අවශ්‍ය වූ විට එම තොරතුරු සෙවීම තම සහකරුවනට පැවරීමද ඔවුහු පුරුද්දක් වශයෙන්ම කරති. එවැනි අවස්ථාවලදී සහකරු හැමවිටම එම තොරතුරු සපයා ගැනීම සඳහා තමාගේ සුපුරුදු ක්‍රියා පටිපාටිය අනුගමනය කරයි.

මෙසේ තොරතුරු සෙවීමේ කාර්යවලියේදී පුස්තකාලයට හිමිවන්නේ ප්‍රථම ස්ථානය හෝ හයවැනි ස්ථානය විය හැකිය. එසේත් නැතිනම් පුස්තකාලයට ස්ථානයක් හිමි නොවීමටද ඉඩ ඇත.

අවශ්‍ය තොරතුරු සපයා ගත් පසු ඔහු අධ්‍යක්ෂවරයාට කියන්නේ තමන් විසින් ඒ තොරතුරු සපයා ගත් බව විනා තොරතුරු සපයා ගත්තේ කුමන මූලාශ්‍රයෙන්ද යන බව නොවේ. මේ නිසා කාර්මික ආයතනවල සේවයේ නියුතු පුස්තකාලයාධිපතිවරුන් මෙන්ම ප්‍රවෘත්ති නිලධාරීන්ද තම අධ්‍යක්ෂ මණ්ඩලය හා අධ්‍යක්ෂවරුන්ගේ කිට්ටු සහායකයින් අතර පුස්තකාල සේවාව ප්‍රචාරය කිරීමට විශේෂ පියවර ගත යුතුය. තමන් වෙත විමසුමක් ඉදිරිපත්වූ විට එම විමසුම, විමසන්නාගේ තරාතිරමට වඩා ගැඹුරු මට්ටමක එකක් වේ නම් එම තොරතුරු අවශ්‍ය වන්නේ කාටදැයි ඔහුගෙන් විමසිය යුතුය. මීළඟ පියවර රඳා පවතින්නේ අදාල අධ්‍යක්ෂවරයා හෝ ජ්‍යෙෂ්ඨ නිලධාරියා හා පුස්තකාලයාධිපතිවරයා අතර පවත්නා සම්බන්ධතාවල ස්වභාවය මතය.

කර්මාන්ත ක්ෂේත්‍රයේ කටයුතුවල අත්‍යවශ්‍යම ගුණාංගය නම් භාරගත් කාර්යය කඩිනමින් නිම කළ යුතු වීමයි. මෙම ක්ෂේත්‍රයේ බොහෝ නිෂ්පාදන කටයුතු නියමිත කෙටි කාලයක් තුළදී ඉටුකොට නිෂ්පාදිත භාණ්ඩ නියමිත දිනට භාරදීමට අපොහොසත් වුවහොත් ආයතනයේ ඊට වගකිව යුත්තා කරදරයට වැටේ. "අධ්‍යක්ෂවරුන්ට හැමවිටම තොරතුරු අවශ්‍ය වන්නේ ඊයේ"යයි පැරණි කියමනක් ඇත. මෙම කථාව ගෙනෙන්නට ඇත්තේ කාලය කර්මාන්ත ක්ෂේත්‍රයට එතරමම අගනා දෙයක් නිසාය. නිවී හැනහිල්ලේ කටයුතු

කිරීමට පුරුදු වී ඇති පුස්තකාලයාධිපතීන් කාර්මික ආයතනවලදී මෙම කඨිනම් පරිසරයට සරිලන සේ හැඩ ගැසිය යුතුවේ.

සාමාන්‍යයෙන් බලන විට කාර්මික ආයතන පුස්තකාලයක ඇති පොත් සංඛ්‍යාව එතරම් විශාල නොවේ. එහි පුස්තකාල ද්‍රව්‍ය තොගය වැඩි වශයෙන්ම වාර සඟරා, පත්‍රිකා, රජයේ ප්‍රකාශන, ආයතනයේ හා බාහිර ආයතනවල වාර්තා, ප්‍රමිති, වාණිජ සාහිත්‍යය ආදියෙන් සමන්විත වේ. ඇතැම් ආයතන විසින් මව් ආයතනයේ ලිපිගොනුවල සූචිද පුස්තකාලයේම පවත්වා ගෙනයනු ලැබේ. එහෙත් මෙය සුවිශේෂ කාර්යයකි. සෑම විශාල නිෂ්පාදන සංවිධානයකම වෙළඳ බලපත්‍ර සඳහා වෙනම අංශයක් ඇත. වෙළඳ බලපත්‍ර ගබඩා කිරීම මෙන්ම ඒවා පිළිබඳ තොරතුරු සංවිධානය කිරීම හා සැපයීමද මෙම අංශය විසින් කරනු ලැබේ. වෙළඳ බලපත්‍ර අංශය වෙනම අංශයක් ලෙස පවත්වාගෙන යන්නේද නැතහොත් ඒවා පුස්තකාලයේ තැන්පත් කරන්නේද යන්න අදාල බලධාරින්ගේ රුචිකත්වයන් හා ආකල්පයන් මත රඳා පවතින්නකි. වෙළඳ බලපත්‍ර සම්බන්ධයෙන් කටයුතු කිරීමට පරිචයක් නොලද පුස්තකාලයාධිපතිවරයා හැමවිටම වෙළඳ බලපත්‍ර අංශයේ නිලධාරීන්ගේත් වෙනත් ප්‍රවීනයන්ගේත් දැනුමින් ප්‍රයෝජන ගත යුතුය. කාර්මික තොරතුරු සේවා සඳහා ඒ ඒ ආයතන විසින් ආයෝජනය කරනු ලබන මුදල් ප්‍රමාණයක් ගැන ලබාගත හැකි දත්තයන් ඉතා අල්පය. විවිධ ආයතන විසින් විවිධාකාර ගිණුම් ක්‍රම උපයෝගී කර ගැනීමේ හේතුවෙන් මෙම දත්තයන් රැස්කිරීම සංකීර්ණ කාර්යයක් බවට පත් වී ඇත. ඉහත සඳහන කළ ඇස්ලිබ් සමීක්ෂණයෙන් පෙනී ගියේ එක්සත් රාජධානියේ කාර්මික ආයතන විසින් පුස්තකාල ද්‍රව්‍ය සඳහා වැය කරන මුළු කාර්ය මණ්ඩල වැටුප් සඳහා වැය කරන මුදලින් 1/3 ක් පමණ බවයි. පුස්තකාලය වෙනුවෙන් වැය කරන මුදල් මව් ආයතනයේ ආදයම හෝ ප්‍රාග්ධන ආයෝජනය සමඟ සැසඳීම මෙන්ම, නිලධාරින් හා සේවක සංඛ්‍යාව සමඟ සැසඳීමද අදල නොවේ. පුස්තකාලයේ ප්‍රවෘත්ති විද්‍යා කාර්ය මණ්ඩලයට ඇතුළත් විය යුතු නිලධාරින් සංඛ්‍යාව නිගමනය කිරීමට හොඳම ක්‍රමය වන්නේ ඈෂ්වර්ත් පෙන්වා දී ඇති පරිදි ආයතනයේ උපාධිධර හෝ ඊට සම තතවයේ සිටින කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව සැලැකිල්ලට ගැනීමය. එසේ නිගමනය කිරීමෙන් පසු ඔවුනට සාධාරණ වැටුප් නියමකොට පුස්තකාල ද්‍රව්‍ය, උපකරණ හා ලිපිද්‍රව්‍ය ඇතුළු අනිකුත් වියදම් සඳහා, වැටුප් සඳහා වෙන් කළ මුදලින් 50%කට වැඩි ප්‍රමාණයක මුදල් ප්‍රතිපාදන සැපයිය යුතුය.

## 3.3 පර්යේෂණ සංවිධාන

විශ්ව විද්‍යාලවල සිට (ශුද්ධ හා ව්‍යවහාරික විද්‍යා පර්යේෂණ ආයතන, රජයේ රහස්‍ය හා විද්‍යා පර්යේෂණාගාර ආදියද ඇතුළත්ව) ස්වේච්ඡා සමාගම් හා සංවිධාන විසින් පවත්වාගෙන යනු ලබන පර්යේෂණ ආයතන දක්වා වූ ගුණාත්මක අතින් මෙන්ම ප්‍රමාණාත්මක අතින්ද විවිධ වූ පර්යේෂණ සංවිධාන වර්ග විශාල සංඛ්‍යාවක් තිබේ. ඒවායේ පර්යේෂණ කාර්ය මණ්ඩලද, සංඛ්‍යාව අතින් කිහිප දෙනෙකුගේ සිට සිය ගණනක් දක්වා විවිධ වීමට පුළුවන. එසේම එම ආයතන භෞතික විද්‍යාව, රසායන විද්‍යාව වැනි සම්ප්‍රදයික විෂයයන් පදනම් කරගත් ඒවා හෝ අජටාකාශ ගවේෂණ, පිළිකා නිවාරණය වැනි කාර්යමූල විෂයයන් පදනම් කරගත් ඒවා විය හැකිය මෙම සංවිධාන වර්ග මෙන්ම ඒවායේ පුස්තකාලවලින් ඉටුකරන පුස්තකාල හා තොරතුරු සේවාවන්ද විවිධ ස්වරූප ගනී.

පුස්තකාල ද්‍රව්‍ය පාඨකයින්ට නිකුත් කිරීම, විවිධ මට්ටම්වල සූචිකරණ සේවා, පාඨකයින්ට සහායවීම සහ නියත ප්‍රවෘත්ති සේවා සැපයීමට සමත් ප්‍රවීන පුස්තකාලයාධිපතීන්ගේ සහාය සැපයීම ආදී වූ සේවා රාශියක්ම මෙම පුස්තකාලවලින් ඉටු කරනු ලැබේ.

මෙම ලිපියේ සම්පාදකයා දන්නා තරමින් මේ පුස්තකාලවල කාර්ය මණ්ඩල පිළිබඳව ප්‍රමිතියක් මේ දක්වාම සම්පාදනය වී නොමැත. මෙම වර්ගයේ පුස්තකාල සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳව කාර්ය අධ්‍යාපන ක්‍රමයන් උපයෝගී කොටගෙන නිගමනය කළ යුතු බව හර්නර් හා හීට්වෝල් (28) විසින් යෝජනා කර ඇත. මෙවැනි ක්‍රමවේදයක් යෝජනා කිරීමට ඔවුන් පෙළඹෙන්නට ඇත්තේ ඒ ඒ පුස්තකාලයේ කාර්යයන් වෙන වෙනම අධ්‍යයනය කොට පුස්තකාල කාර්ය මණ්ඩල අවශ්‍යතා නිගමනය කරනවා මිස සාධාරණකරණයක් කළ නොහැකි හෙයිනි. කාර්ය අධ්‍යයන ක්‍රම වේදයක්ද ඔවුන් යෝජනා කොට නැත්තේ මේ නිසාය. එවැන්නක් දැක්වීමද දුෂ්කරය. එක්සත් ජනපදයෙන් හා වෙනත් රටවල ආයතනවලින්ද නිදසුන් දෙමින් තාක්ෂණවේදීන් හා ශිල්පීන් 400 කින් සමන්විත ආයතනයක පුස්තකාල කාර්ය මණ්ඩලය සාමාන්‍යයෙන් 5ක් හෝ 6 ක් වියයුතු බව ඔවුන් විසින් පෙන්වා දී ඇත. දැනට මෙම ප්‍රමිතීන් මෙයට වඩා ඉහළ මට්ටමක තිබීමට ඉඩ තිබේ. සාමාන්‍ය පර්යේෂණ ආයතන පුස්තකාල අද බොහෝ දුරට කාර්මික පර්යේෂණ පුස්තකාලවල තත්වයට ළංවී ඇති හෙයින් ඒවා සඳහාද ඉහතින් දක්වන ලද ඈෂ්වර්ත්ගේ ප්‍රමිතීන් උපයෝගී කරගැනීමට පුළුවන.

පර්යේෂණ ආයතන පුස්තකාලවල පොත් තොගය වැඩි වශයෙන්ම පශ්චාත් උපාධි මට්ටමේ කෘතීන්ට සීමාවනු ඇත. ඊට පහළ තත්වයේ කෘතීන් මෙම තොගයට ඇතුළත් වන්නේ ස්වල්ප වශයෙනි. විශාල ඉල්ලුමක් සහිත කෘතීන් කිහිපයකින් පමණක් පිටපත් කිහිපයක් බැගින් මිළයට ගැනීමට අවශ්‍ය වනු ඇත. තවද ඇතැම් කෘතීන් දීර්ඝ කාලීන ණය ක්‍රමය යටතේ පර්යේෂකයින්ට නිකුත් කිරීමටද සිදුවේ. ව්‍යවහාරික විද්‍යා ක්ෂේත්‍රයේ පුස්තකාල විසින් අප්‍රකාශිත හා අර්ධ ප්‍රකාශිත පර්යේෂණ වාර්තා බහුල වශයෙන් එක්රැස් කරනු ඇත. මේ පිළිබඳව පසුව විස්තර කරනු ලැබේ. ප්‍රධාන තාක්ෂණ පුස්තකාල වර්ග 3 අතුරින් වැඩිම භාෂා සංඛ්‍යාවකට අයත් ප්‍රකාශන, විශේෂ පුස්තකාල මගින් ආවරණය කෙරේ. පර්යේෂණ කෘතිවලින් අඩකටත් වඩා පළවන ඉංග්‍රිසි භාෂාවෙන් හා තම රටේ මව් භාෂාවෙන් පළවන ප්‍රකාශන හැරුන විට ජර්මන්, රුසියානු හා ප්‍රංශ භාෂාවලින් පළවන ග්‍රන්ථ හා වාරික ප්‍රකාශන බහුල වශයෙන් අවශ්‍ය වනු ඇත. ඊට අතිරේකව දැනට වැදගත් කමින් වැඩිවෙමින් පවත්නා ඉතාලි, ස්පාඤ්ඤ, ජපන්, චීන ප්‍රමුඛ වෙනත් භාෂාවලට අයත් වැදගත්කමින් යුතු පොත් හා වාර සඟරාද අවශ්‍ය වේ. මෙම භාෂා අනුව ලබා ගත යුතු ප්‍රකාශන සංඛ්‍යාවේ අනුපාතය රටින් රටට වෙනස් වෙයි. තවද, ඇතැම් විෂයයන් සම්බන්ධයෙන් ඇතැම් භාෂාවලින් රචිත සාහිත්‍ය වැදගත් තැනක් ගනී. නිදසුනක් ගතහොත් කඩදසි හා කඩදසි කල්ක කර්මාන්තය සම්බන්ධයෙන් ස්කැන්ඩිනේවියන් කෘතීන් වැදගත් වේ. කුඩා රටවල් මෙන්ම, එතරම් ප්‍රචලිත නොවූ මව්බසක් ඇති ජාතීන්ද තම විද්‍යාත්මක ක්ෂේත්‍රයේ පර්යේෂණ කෘතීන් ප්‍රචලිත ප්‍රධාන භාෂාවලින් පළ කරති. එහෙත් ප්‍රාදේශීය වශයෙන් පමණක් වැදගත් වන කර්මාන්ත හා විද්‍යා කෂේත්‍රයේ කෘතීන් සම්බන්ධයෙන් මෙය මෙසේ නොවේ.

(40 වන පිටුවට)

රත්තරන්, මැණික්, මුතු
මොකටද ඒවා ?...

ලුණු පොදක් නැති කලට

දන් සුදෝ සුදු

# සේදූ ලුණු

කිලෝ 1 පැකට් වශයෙන්

**ශ්‍රී ලංකා ජාතික ලුණු සංස්ථාව**

110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත,
කොළඹ 2 - ටෙලි: 28128, 28129, 28120

# A GLIMPSE OF LIBRARY SERVICES IN SOVIET RUSSIA

**Mrs. NELIYA FERNANDO**
*Assistant Director, SLNSB*

In a country that extends over one-sixth of the world's land mass and occupied by 264 million people, information is almost a basic human need. The U.S.S.R. is made up of 15 Union Republics of which Russia, or the Russian Soviet Federative Socialist Republic is the largest. Its capital is Moscow. Soviet Russia's national information policies are closely geared to achieving social development and it is the State's responsibility to see that there are no obstacles to impede communication of information which is a vital factor for development.

The National Library system of the U.S.S.R. is composed of National Libraries, Mass Libraries, University Libraries, School Libraries, Special Libraries, Technical Libraries and Children's Libraries. Each republic has its own leading library which enjoys national status and serve as National Libraries. The Mass Libraries which are similar to our Public Libraries with no definite sets of user groups have as their leading library the Republican state library. They serve as deposit libraries for the republic and stock deposit copies of publications of other republics in the U.S.S.R. These libraries also function as the central pivot in the Republican library system making available their rich resources to the nation through well organized co-operative schemes.

### Special Children's Libraries

Special libraries vary from those serving state Departments to Trade Union Libraries. Trade Union Libraries strive to provide information and also supply reading material to the workers, farmers and intellectuals as the case may be. Special feature in the library system of the U.S.S.R. is the chain of children's libraries amounting to 3,500 that have been specially set up to supply the information needs of school-going children. Within each republic the network of children's libraries operate at district and city levels within each region. These children's libraries too are classified as Mass libraries and are controlled by the Ministry of Culture in close coordination with the Ministry of Education and the School Library system. School Libraries mainly function to supplement the educational programmes of the school. The aim of the children's library is to cultivate and develop the interests so generated in the school's environment. These are in fact like the public libraries we are familiar with—though miniature in scale and size. They are fully equipped with Reference and Reading materials collections, serials collections, audio visual units and also conduct story hours, exhibitions and meetings with authors and writers etc.

### CENTRALIZED ACQUISITIONS

The children's libraries operate a centralized acquisitions programme and resources are shared through inter-library lending systems. The library's stock is divided into three categories :

**Group 1 — for grades 1, 2, 3**
**Group 2 — for grades 4, 5, 6**
**Group 3 — for grades 7, 8, 9, 10**

Apart from supplying the information needs of children, special emphasis is laid upon vocationel prospects, and children specially those falling into group 3 are exposed to prevalent conditions in the country in respect to career opportunities in order to give them an opportunity to equip themselves to face realities of today. These libraries also study the reading habits of children and carry out numerous other surveys and studies for the purpose of ascertaining their needs and identifying gaps in the information supply system. Thus the data gathered is analysed and recommendatory advice based on the findings are offered both to the publishing trade as well as to authors and writers, the information generators.

### The National Library

The Mass Libraries are appropriately centrally controlled by the Ministry of Culture of the Supreme Soviet. Some of these libraries even function as nonlending Public Libraries, and at the head of all these is the National Library of the Soviet Union. The State Lenin Library in Moscow started life as the Moscow Public Library in 1862, and in 1918 with the transfer of the Soviet capital from Petersburg to Moscow this library was elevated to the supreme position of the National Library of the country. Today its total

holdings amount to 36 million and is one of the richest depositories of literature in the world. Unlike many other national libraries the State Lenin Library is not a Copyright Library nor does it compile the national bibliography. This task is performed by the All Union Book Chamber which is an independent body that receives deposit copies under Deposit Laws, sometimes as many as 60 copies per title from publishers. Each of the Republics has its own Book Chamber and through co-ordination, deposit stocks are effectively built up. However, the State Lenin Library maintains a deposit collection on a selective basis depending on its acquisition policies. There is a large number of libraries that specialize in various scientific and technological information sources offering a wide range of services to the users and as such the National Library concentrates mainly on social sciences and humanities, although its holdings can be aptly described as universal.

## CLASSIFICATION

The Library has devised its own classification scheme and except the scientific and technical libraries that use the Universal Decimal Classification Scheme or a modified version of it all the other libraries adopt the system known as BIBICA (Bibliothecal Bibliographical System) which is the classification system of the State Lenin Library.

The State Lenin Library being the National Library also functions as the focal point of the network of libraries in the National system. The Union Catalogue of holdings of the major libraries of the country has 3 million entries and it is noteworthy that the holdings of the National Library was not included in this Union Catalogue as its own catalogue is adequate for the purpose. There are numerous co-operative schemes that have originated through resource sharing programmes and this is conspicuous in all areas of library activities throughout the country.

Of significance is the work carried out in research and methodology and conservation. As the main library of the country it offers methodological guidance to other libraries and shares with these libraries results of research carried out.

This no doubt helps the libraries that need such assistance and guidance resulting in optimum utilization of resources. Conservation too is regarded as a highly specialized job where the staff is exposed to latest techniques and methods. With great reluctance librarians are compelled to resort to machine-oriented conservation techniques due to the voluminous amount of work handled although manual methods are still preferred in the case of restoring rare material.

The State Lenin Library is the country's leading research institution in the field of library studies and bibliology. The development and introduction of uniform methods is an important part of the methodological assistance rendered by the National Library to libraries in the country. The Lenin Library also plays a leading role in activities on standardization in library work.

### State Library of Foreign Literature

The Library of Foreign Literature in Moscow covers a broad range of subjects and functions as the repository of literature in foreign languages. Extensive and comprehensive holdings in humanities, fine arts and literature of other countries amount to four and a half million volumes. The Library maintains a Union Catalogue of foreign books and serves other libraries through co-operative programmes. International book exchange is one valuable source of expanding the information resource collection of the library and with this end in view it maintains liaison with around 1,500 organizations in 90 countries.

Its acquisition policies have been formulated to correspond with those of the State Lenin Library which is also situated in Moscow. The library of Foreign literature has material in 250 foreign languages and prepares over 1,000 bibliographies in a year in order to satisfy user needs. Practically every week various themes or topics are selected and special programmes such as exhibitions and discussions are held to commemorate or highlight a particular event or pay tribute to an individual.

### Special Libraries

The Central Agricultural Library as its name indicates is the major library in the field of agriculture in the country and functions as the focal point in the network of agricultural libraries. Its main objective is to disseminate information and knowledge to research workers, scientists and students and special emphasis is laid upon disseminating results of research work carried out for the benefit of those actually engaged in agricultural activities as well as to avoid duplication of efforts resulting in wastage of valuable resources.

The library through modern methods in disseminating scientific information keeps its users alert with latest information. The library's stock is around 5 million and it subscribes to 3,000 periodical titles. Inter library loan services are made available to 6,000 Soviet and foreign organizations while it exchanges material with 1,500 organizations.

Its holdings are of great scientific and cultural value. The library stores comprehensive collections of domestic and foreign literature in agriculture and allied subjects thus providing information support to agricultural research and development programmes. Materials dating back to the 16th century are particularly valuable to the history of the evolution of scientific agricultural thought as well as the history of agricultural literature.

There are many other special libraries that serve various State Departments and missions. The libraries of the Academy of sciences take a prominent place among the special libraries. There are 39 such libraries attached to the Academies in the country out of which the 4 major libraries considered as the nerve centres are those in Leningrad, Moscow and Siberia. These serve a total of 630 Academies in the whole of the U.S.S.R. and the Union Catalogue of the library in Leningrad has fifteen and a half million entries.

Readers are served through its reading rooms and individual and inter-library loans. It maintains contact with many different organizations throughout the world and carries out exchange programmes with many countries.

**Non-lending Public Libraries**

Mass Libraries as they are popularly known provide the nation with the information it needs. Irrespective of ideologies political systems of all shades have realised and recognized the value of communication. The Mass Libraries are truly open to the public and offer many special services to the community it serves.

A new concept of non-lending Public or Mass Libraries have been put to test in creating the Yankakupala central Mass Library in the year 1949. This functions as the Central Mass Library for the Byelorussian Republic and has twenty one filials attached to it.

In organization and resource content it resembles the State Lenin Library. When all state Mass Libraries in this republic were brought under a centralization programme this library became the focal point and houses the Union Catalogue containing entries of Mass Libraries within the republic. The library's main stock is on closed access although auxilliary collections on major disciplines are maintained in close proximity to reading halls where users have direct access to them. A special collection is maintained for youth (14-21 years) and it contains material specially selected to serve their interests. For this purpose they maintain close contact with schools and the teaching profession and also with youth organizations. It also conducts surveys research pertaining to user habits and demands of all the component libraries in the system. This work assists its central acquisition programme immensely.

The libraries of the U.S.S.R. is a component of its coherent information system which promotes interconnection between all levels of information users and information generators. Its unparalleled efficiency and the resulting success story marvelled the world when it pioneered into space. Development of information resources and information supply systems to each specific level of user groups and careful integration of these into viable networks has enabled the Soviet libraries to cope with the demands of the information era the world is facing today.

**(This article does not claim to be an exhaustive study of Soviet libraries. It is only an attempt to share with the readers the experiences of the writer during a two week visit to some of the libraries in Soviet Russia).**


**ඔබේ පුස්තකාලයේ**

**සගතික කළ වාර්තා**

**පුස්තකාල ප්‍රවෘත්ති ප්‍රකාශනයේ**

**පළ කිරීම සඳහා අවකාශ ඇත**

ලිපි යොමුව:—

අධ්‍යක්ෂක/ලේකම්, පුස්තකාල සේවා මණ්ඩලය
නිදහස් මාවත, තැ. පෙ. 1764
කොළඹ 7, ටෙලි: 598847.

## මහජන පුස්තකාල ව්‍යවස්ථා ළඟදීම ?

**පළාත් පාලන පුස්තකාල සේවාව සංවිධානය කරලීමට ඇති ප්‍රධාන බාධකය මහජන පුස්තකාල ව්‍යවස්ථාවක් නොමැතිකම බව පළාත් පාලන දෙපාර්තමේන්තුව අවබෝධ කරගෙන ඇති නිසා ඉදිරි කාලය තුළ පළාත් පාලන පුස්තකාල ව්‍යවස්ථා මාලාවක් සම්පාදනය කරලීමට තම අවධානය යොමු වී ඇති බව පළාත් පාලන කොමසාරිස් පැරකුම් විජේසිංහ මහතා තුන්වන ශ්‍රේණියේ පළාත් පාලන පුස්තකාලයාධිපතීන් සඳහා සිව් දින පාඨමාලාවක් විවෘත කරමින් ප්‍රකාශ කෙළේය.**

සාර්ථක මහජන පුස්තකාල සේවාවන් පවත්වා ගෙන යනු ලබන එක්සත් රාජධානිය, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව වැනි රටවල විධිමත් පුස්තකාල ව්‍යවස්ථා මාලාවන් ඇති අතර, ඒවා එම රටවල සාර්ථක පුස්තකාල සේවාවන් සඳහා හේතු වී ඇති නිසා මේ අවස්ථාව පළාත් පාලන පුස්තකාල සඳහා ද ක්‍රමානුකූල ව්‍යවස්ථාවන් ඇති කරලීමට සුදුසු අවස්ථාවක් බව තමා විශ්වාස කරන බවද කොමසාරිස් වරයා පැවසීය.

මෙබඳු පාඨමාලා සංවිධානය කරලීම ඇතුළුව නොයෙක් අයුරින් පළාත් පාලන පුස්තකාල සේවාවට සහාය වන ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ උපදෙස් මෙම කාර්යයේදී තම දෙපාර්තමේන්තුව අපේක්ෂා කරන බවද විජේසිංහ මහතා ප්‍රකාශ කළේය.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති එස්. අතුකෝරාළ මහතා කථා කරමින් සේවයට කැප වී ක්‍රියා කිරීම, පුද්ගලික අභිවෘද්ධියටත්, වෘත්තියේ අභිවෘද්ධියටත් ඇති ඒකායන මාර්ගය බවත්, මහජන පුස්තකාලයාධිපතීන් ඒ අනුව ක්‍රියා කරනු ඇතැයි තමා බලාපොරොත්තු වන බවත් පැවසීය.

## ජාතික පුස්තකාල පත් කිරීම්

මොරටුව නගර සභා පුස්තකාලයාධිපති වශයෙන් සේවය කළ **එච්. නෙල්සන් පීරිස්** මහතා පුස්තකාල සේවා මණ්ඩලයේ පුස්තකාල සංවර්ධන හා පර්යේෂණ අංශයේ සේවය සඳහා 82.12.01 දින සිට පත්ව ඇත. ඒ මහතා මහජන පුස්තකාල සේවයේ වසර 10 කට වඩා අධික සේවා පළපුරුද්දක් ලබා ඇත.

පේරාදෙණිය විශ්ව විද්‍යාල පුස්තකාලයේ පුස්තකාල සහකාර වශයෙන් සේවය කළ **එච්. එම්. ගුණරත්න බණ්ඩා** මහතා 82.12.01 දින සිට මණ්ඩලයේ පුස්තකාල අධ්‍යාපන හා අභ්‍යාස අංශයේ සේවය සඳහා පත්ව ඇත.

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු පුස්තකාලයේ සහ කොළඹ මහජන පුස්තකාලයේ සේවය කළ **ජී. එච්. පුංචි බණ්ඩා** මහතා ජාතික පුස්තකාලයේ පුස්තකාලයාධිපති තනතුරක් සඳහා 83.03.01 දින සිට තේරී පත්ව ඇත.

කොළඹ මහජන පුස්තකාලයේ සේවයේ නියුක්තව සිටි **එන්. ගලගෙදර** මෙනෙවිය මණ්ඩලයේ සහකාර පුස්තකාලයාධිපති තනතුරකට පත් වී ඇත.

**කේ.ජී. නිමලසේන** මහතා මණ්ඩලයේ iii ශ්‍රේණියේ පුස්තකාල සහකාර තනතුරක් සඳහා පත්ව දැනට පුස්තකාල සේවා මණ්ඩලයේ මහනුවර ප්‍රාදේශීය කාර්යාලයේ සේවය කරනු ලබයි.

## නැවතත් සභාපති

1983 මාර්තු මස 26 වෙනි දින පැවැත්වූ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමේදී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පුස්තකාලයාධිපති **ඩබ්ලිව්. බී. දෙරකුඹුර** මහතා සංගමයේ සභාපතිවරයා වශයෙන් තේරී පත් වී ඇත.

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය ලංකාවේ පුස්තකාල ක්ෂේත්‍රයේ විවිධ අංශ දියුණු කිරීම අරමුණු කොට පාර්ලිමේන්තු පණතක් මගින් පිහිටුවන ලද ව්‍යවස්ථාපිත සංවිධානයකි.

පුස්තකාල සංගමයේ පූර්ණ සාමාජිකත්වය වෘත්තීය සුදුසුකම් ලත් පුස්තකාලයාධිපතිවරුනට පමණක් සීමා විය යුතුය යන යෝජනාවද මෙවර වාර්ෂික රැස්වීමේදී සම්මත වී ඇත.

පසුගිය අවුරුදු කීපයක් තුළ සාමාජිකත්වය පිළිබඳව පැවැති අර්බුදකාරී තත්වය නිසා සුදුසුකම් ලත් ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපතිවරු සියල්ලක්ම වාගේ සංගමය අතහැර ගොස් තිබුණි. සාමාජිකත්වය පිළිබඳව ගෙන ඇති නව තීරණය පුස්තකාල සංගමයේ අභිවෘද්ධියට හේතුවේ යයි බොහෝ පුස්තකාලයාධිපතිවරුන්ගේ විශ්වාසය බව වාර්තා වේ.

## ගුවන් විදුලි සංස්ථා පුස්තකාලය ප්‍රතිසංවිධානය වේ

**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පුස්තකාලය ප්‍රතිසංවිධානය කිරීම සඳහා එහි අධ්‍යක්ෂ ජනරාල් තේවිස් ගුරුගේ** මහතා විසින් මණ්ඩලය වෙත කරන ලද ඉල්ලීම පරිදි එම පුස්තකාලයට අයත්, සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන විවිධ සේවා අංශ යටතේ පැවැති තැටි/පටි ගබඩා, ආශ්‍රය පුස්තකාලය සහ පැරණි ලේඛන හා නිබන්ධන පුස්තකාලය පිළිබඳව කාර්ය මණ්ඩලය, පුස්තකාල ද්‍රව්‍ය තොග, සේවා, ලිබඩු හා උපකරණ හා ද්‍රව්‍ය සංවිධානය යනාදී කරුණු පිළිබඳ කරන ලද පුළුල් පරීක්ෂණයෙන් පසුව ගුවන් විදුලි සංස්ථා පුස්තකාලයේ ඉහත දැක්වූ එක් එක් අංශ ප්‍රතිසංවිධානය කළ යුතු ආකාරය පිළිබඳ විස්තර වාර්තා වක් මණ්ඩලය විසින් ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලදී.

# පුවත් ලුහුඬින්

**රද්දෙළුගම නිවාස යෝජනා ක්‍රමය** යටතේ ඉදි කරන ලද **මහජන පුස්තකාලය** සඳහා **රු. 10,000** ක වටිනාකමින් යුත් ලී බඩු හා **රු. 2,000 ක්** පමණ වටිනාකමකින් යුත් ඉංග්‍රීසි පොත් කට්ටලයක්ද ආධාර වශයෙන් මණ්ඩලයෙන් ලබා දෙන ලදී. මෙම පුස්තකාලය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් II ශ්‍රේණියේ හා III ශ්‍රේණියේ පුස්තකාලයාධිපතීන් දෙදෙනෙක් පත් කිරීමට විධි විධාන යොදා ඇත.

1982 වර්ෂයේ සැප්තැම්බර් මස ජපානයේ ටෝකියෝ නුවර **"ජාතික පුස්තකාල අධ්‍යක්ෂවරුන්ගේ සම්මේලනයක්"** පවත්වන ලද අතර, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ **අධ්‍යක්ෂ/ලේකම් එන්. අමරසිංහ** මහතා ශ්‍රී ලංකා නියෝජිතවරයා ලෙස ඊට සහභාගී විය.

**1983 වර්ෂයේ කතෘ ප්‍රකාශක ආධාර වැඩ පිළිවෙල** යටතේ පොත් මිලදී ගැනීමේ කටයුතු මණ්ඩලය විසින් දැන් ආරම්භ කර ඇත. මෙම වැඩ පිළිවෙල යටතේ පොත් මිලදී ගැනීම සලකා බැලීම **සඳහා** මණ්ඩලයෙන් ලබා ගන්නා ලද අයදුම් පත්‍රය **සමග** ආදර්ශ පිටපතක් මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුවේ.

**ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ, අධ්‍යක්ෂ අමරවංශ දේවරාජා මහතා** මෙම වසරේ ජනවාරි මස 04 වෙනි දින විශ්‍රාම යැමෙන් පසු එම තනතුරේ වැඩ බැලීම සඳහා එහි **නියෝජ්‍ය අධ්‍යක්ෂ හරිස්චන්ද්‍ර ද සිල්වා මහතා** පත් කර ඇත. ඒ මහතා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන්ද දැනට කටයුතු කරනු ලැබේ.

**පළාත් පාලන සේවා අධ්‍යක්ෂව** සිටි ශ්‍රී ලංකා පුස්තකාල සේවා මණ්ඩලයේ සාමාජික **බී. ලියනමාන මහතා** 1983 මාර්තු පළමුවන දින සිට **අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්** තනතුරට පත් කර ඇත.

මධ්‍යම පළාතේ පළාත් පාලන නියෝජ්‍ය කොමසාරිස්වරයා වශයෙන් කටයුතු කළ **ජේ. පී. කීර්තිරත්න මහතා නව පළාත් පාලන අධ්‍යක්ෂවරයා** ලෙස **83.03.01** දින සිට පත් කර ඇත.

පුස්තකාල සේවා මණ්ඩලයේ **ප්‍රධාන කාර්යාලයේ පුස්තකාල පර්යේෂණ හා සංවර්ධන අංශය** මගින් මෙම වර්ෂයේ **ජනවාරි** සිට **මාර්තු** දක්වා පුස්තකාල **42 ක්** අතරේ රු. **25,923.71** ක වටිනාකමකින් යුත් ග්‍රන්ථ නාම **1942 ක්** බෙදා හැරීමට කටයුතු කර ඇත.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති **එම්. ඒ. ගුණපාල මහතා** ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා **ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් සරසවිය** බලා මෑතකදී පිටත්ව ගියේය. ඒ මහතා වසර දෙකක් එහි ගත කිරීමට බලාපොරොත්තු වන අතර, වර්ගීකරණ ක්‍රම පිළිබඳ පරීක්ෂණාත්මක විග්‍රහයක් **තම පර්යේෂණ** මාතෘකාව වශයෙන් තෝරා ගෙන ඇත.

යුනිසෙෆ් ආයතනයේ අනුග්‍රහයෙන් **අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව** සහ **ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලයේ** මෙහෙය වීමෙන් **ප්‍රාථමික අවධිය සඳහා ළමා පොත් ලිවීම පිළිබඳ ලේඛකයන් පුහුණු කිරීමේ සම්මන්ත්‍රණයක්** සහ වැඩ මුළුවක් මැයි මස **02** සිට **06** දින **දක්වා** පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රණය හා වැඩ මුළුව ගරු අධ්‍යාපන සේවා ඇමති **ලයනල් ජයතිලක** මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් **කොළඹ තරුණ ක්‍රිස්තියානි කාන්තා සමිති ශාලාවේදී** පවත්වන ලදි.

## අනුරාධපුර පුස්තකාලයාධිපති සමුළුව

පුස්තකාල විද්‍යාව අද පුළුල් විෂයයක් බවට පත් වී ඇති අතර, පුස්තකාලයාධිපතීන් සූචිකරණය හා වර්ගීකරණය පමණක් හැදෑරූ කාලය අවසාන බවත්, මේ නිසා නව ප්‍රවණතා පිළිබඳව සේවයේ යෙදී සිටින පුස්තකාලයාධිපතීන් වඩාත් විමසිලිමත්ව සිටීම අත්‍යාවශ්‍ය බවත්, **83.03.27** වෙනි දින අනුරාධපුර මහජන පුස්තකාලයේ පැවති දිස්ත්‍රික් පුස්තකාලයාධිපතීන්ගේ සම්මන්ත්‍රණයක් අමතා **බ්‍රිතාන්‍ය මණ්ඩල පුස්තකාල අධ්‍යාපන උපදේශිකා** ඈන් **අර්වින්** මහත්මිය ප්‍රකාශ කළාය. අනුරාධපුර දිස්ත්‍රික් සංවර්ධන සභාව සහ අනුරාධපුර මහජන පුස්තකාලයාධිපතිවරයා මෙම සම්මන්ත්‍රණය සංවිධානය කර තිබුණි. තවදුරටත් කතා කළ **අර්වින්** මහත්මිය තම තමන්ගේ කුඩා පුස්තකාල ක්‍රමවත්ව සංවිධානය කර ගැනීම සහ ඒවායින් ඒ ඒ ජන කොටස්වලට උපරිම සේවයක් සැලසීම වැදගත් බවත්, එබඳු සාර්ථක කුඩා පුස්තකාල සේවා එකතු වීමෙන් සාර්ථක ජාතික පුස්තකාල සේවාවක් ඇති වන බවත් පැවසීය.

අනුරාධපුර සංවර්ධන සභාවේ සභාපති **ඒ. මහදිවුල්වැව මහතා** කතා කරමින් මෙවන් ප්‍රාදේශීය සංවර්ධන කටයුතු වලදී පුස්තකාල සංවර්ධනයට විශේෂ ස්ථානයක් ලබා දීමට උනන්දු වන බව පැවසීය. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ **එන්. අමරසිංහ** අනුරාධපුර මහජන පුස්තකාලයාධිපති **යූ. එන්. ජේ. විජේසේන** යන මහත්වරුද මෙහිදී කතා කළ අතර, පුස්තකාල සේවා මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂිකා **නාලිනී ද සිල්වා** මෙනවියද සම්මන්ත්‍රණයට සහභාගි වූවාය. සම්මන්ත්‍රණය අවසානයේ අනුරාධපුර සංවර්ධන සභාව මගින් **ඈන් අර්වින්** මහත්මිය වෙනුවෙන් රාත්‍රී භෝජන සංග්‍රහයක් පැවැත්වූ අතර, එයට අනුරාධපුර **දිසා ඇමති චන්ද්‍රා බණ්ඩාර මහතාද** සහභාගි විය.

# ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සඳහා පුස්තකාල ද්‍රව්‍ය රැස් කිරීම

නුදුරු අනාගතයේ විවෘත කරලීමට බලාපොරොත්තු වන ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සඳහා පුස්තකාල ද්‍රව්‍ය රැස් කිරීම, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් ආරම්භ කර ඇත.

ශ්‍රී ලංකාවට අදාළ වන පොත්පත්, වාර සඟරා හා ප්‍රධාන අනෙකුත් පුස්තකාල ද්‍රව්‍ය ජාතික පුස්තකාලයේ තැන්පත් කරලීම සඳහා පරිත්‍යාග කරන මෙන් මණ්ඩලය වෙනුවෙන් මෙයින් ඉල්ලා සිටිමි.

පුස්තකාලවලින් බැහැර කරනු ලබන පොත්පත් ආදියද ජාතික පුස්තකාලයේ නිදන් පුස්තකාල අංශය වෙත එවිය හැක. මේවා ආරක්ෂා සහිතව අනාගත අවශ්‍යතා සඳහා තැන්පත් කර තබනු ලැබේ. මේ පිළිබඳ අදාළ තොරතුරු සඳහා ජාතික පුස්තකාල අධ්‍යක්ෂවරයා අමතන මෙන් සියලුම පුස්තකාලයාධිපතිවරුන්ගෙන්ම ඉල්ලා සිටිමි.

තැ. පෙ. 1764
නිදහස් මාවත,
කොළඹ 7.
ටෙලි: 598847

සභාපති,
ශ්‍රී ලං. ජා. පු. සේ. ම.

## COLLECTION OF BOOKS FOR THE SRI LANKA NATIONAL LIBRARY

Sri Lanka National Library Services Board (SLNLSB) has started collecting material for deposit in the National Library of Sri Lanka which is to be opened shortly.


The Board would be grateful for any gifts, donations of books, periodicals and other documents relevant to Sri Lanka for deposit in the National Library.

Books weeded out from libraries may also be transported to the National Library for deposit in its repositories which will be made available for reference in the event of such a need arising.

Librarians! please contact the Directer if you have unwanted publications.

P. O. Box 1764
Independence Avenue
COLOMBO-7
*Tel:* **598847**

**CHAIRMAN**
Sri Lanka National Library Services Board



## ජාතික පුස්තකාලය ලහි ලහියේ ඉදිවෙයි !

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල ගොඩනැගිල්ල ඉදි කිරීම දැන් අවසාන අදියරට එළඹ ඇති සැටි මෙම ඡායාරූපයෙන් දැක්වේ. මෙහි ප්‍රධාන ගොඩනැගිල්ල පස් මහලකින් සමන්විතය. පරිපාලන ඒකකය මෙහි දකුණු පස වේ.

ඡායාරූපය:ඩී.ගලප්පත්ති



☆ පුස්තකාල සේවා මණ්ඩලය මෙහෙයවන පුස්තකාල විද්‍යා, ප්‍රලේඛන සහ ප්‍රවෘත්ති විද්‍යා තැපැල් මාර්ගික පාඨමාලාව පසුගිය මාර්තු මස අධ්‍යාපන සේවා අමාත්‍ය ලයනල් ජයතිලක මහතා විවෘත කළ අවස්ථාවේ පැමිණ සිටි සම්භාවනීය අමුත්තන් අසුන්ගෙන සිටි ආකාරය ඉහත ඡායාරූපයෙන් දැක්වේ.

# Indexing Expert Visits Sri Lanka

Mrs. Inex Smith, a lecturer at Loughborough University, U.K. arrived in Sri Lanka for a short visit during the second week of April. Before coming to Sri Lanka she spent three weeks in Lahore, Pakistan as a British Council Library Advisor where she conducted a three week workshop for University Librarians on Indexing. While in Sri Lanka, Mrs. Smith visited the National Library Board and had discussions with the Editorial staff of the National Bibliography on problems of transliteration, PRECIS indexing, machine readable bibliographic records, and computer application.

# Library Training Programmes: 1982

413 librarians have been trained by the Sri Lanka National Library Services Board, through continuing education programmes during the year 1982. This was the highest number trained in a single year by the Library Board. Among those trained are 228 public librarians, 150 school librarians and 35 technical institute librarians. 15 training programmes ranging from 3 days to one week's duration have been conducted for training of these librarians during the year.

Resource persons for these programmes were drawn from among qualified senior librarians, the National Library, the universities and other large library systems in the country.

# Batticaloa Seminar

A two day training programme for Public and School Librarians in Batticaloa District was conducted on the 28th and 29th of April at the Public Library Auditorium, Batticaloa. About 50 librarians and 25 officials from the Department of Local Government and the Department of Education participated in this seminar, conducted in the Tamil medium.

The seminar was organised by the SNLSB responding to the requests of Librarians of the District that opportunities for training be made available to those who are unable to attend full-time courses in librarianship.


නියමිත ප්‍රමිතීන්ට අනුකූලව
සැකසූ

o පුස්තකාල ලිපි ද්‍රව්‍ය
o උපකරණ

සහන මිලකට

| | | |
|---|---|---|
| පොත් තුණ්ඩු-100 | — රු. | 48.51 |
| පාඨක බලපත්‍ර-100 | — රු. | 51.98 |
| දින පත්‍රිකා-100 | — රු. | 49.67 |
| පරිග්‍රහණ ලේඛන (පිටු 150 සීමිත පිටපත් ප්‍රමාණයකි) | — රු. | 21.50 |
| කාඩ්ස් බන්දේසි (වරේ) (කාමර තුන සහිත) | — රු. | 46.20 |

**විමසීම්:**

අධ්‍යක්ෂ/ලේකම්,
පුස්තකාල සේවා මණ්ඩලය
තැ. පෙ. 1764,
නිදහස් මාවත, කොළඹ 7.
ටෙලි: 598847


## SECOND INTERNATIONAL....

*Contd. from page* 24

(12) In order to facilitate the implementation of the programme on resource sharing proposed above, the Conference recommends that UNESCO, IFLA and other relevant organizations be invited to extend support to these programmes.

(13) Recognizing that the proposal to establish a regional network for scientific and technological information in Asia and Pacific (ASTINFO) is significant both in itself and in respect of the high level of consultation proposed, the Conference commends UNESCO for its initiative and recommends the project to the Conference members for their careful consideration and support.

(14) Those recommendations which are of specific relevance to UNESCO or IFLA should be forwarded to them for their positive considerations and supports.

# පුස්තකාල විද්‍යාර්ථීන්ගේ දැනුම වඩන ප්‍රකාශන පෙළක්

- Catalogue of Postgraduate Dissertations Available in the University and Research Libraries of Sri Lanka-Comp. by N. Amarasinghe
  Rs. 74.00

- **මූලික සූචිකරණය**
  ග්‍රන්ථ සූචිකරණයේ මූලධර්ම හා මූලික සූචිකරණ ව්‍යවස්ථාවන් සරල අයුරින් ඉදිරිපත් කරයි.
  ධනපාල ගුණසේකර
  රු. 37.00

- **ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය**
  இலங்கைத் தேசிய நூற்பட்டியல்
  (ත්‍රෛමාසික/Quarterly)
  Sri Lanka National Bibliography (Quarterly)
  වාර්ෂික දායක මුදල රු. 80.00 (තැ. ගා. සමග)

- **පුස්තකාල ප්‍රවෘත්ති**
  நூலகச் செய்தி
  Library News
  (ත්‍රෛමාසික/Quarterly)
  වාර්ෂික දායක මුදල රු. 6.00

- **මහජන පුස්තකාල ප්‍රමිති**
  මිල රු. 4.00

- **මහජන පුස්තකාල තොරතුරු සංග්‍රහය** (නාමාවලියකි)
  මිල රු. 12.00

- **කාර්මික විද්‍යාල පුස්තකාල තොරතුරු සංග්‍රහය**
  (සීමිත මුද්‍රණයකි) සම්පාදක : උපාලි අමරසිරි

- Directory of Technical College Libraries (limited edition) *Comp: by Upali Amarasiri*

- **කුඩා කාර්මික ආයතන පුස්තකාල**
  ඩී. ජේ. කැම්බල්/පරිවර්තනය:- ධනපාල ගුණසේකර
  (සීමිත මුද්‍රණයකි)

මුදල් හෝ තැපැල් ඇණවුම්, චෙක්පත්, සභාපති, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය නමට ලියනු මැනවි.

විමසීම් හා ලිපි:

**අධ්‍යක්ෂ / ලේකම්,**

## ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

**තැ. පෙ. 1764, නිදහස් මාවත, කොළඹ 7. ටෙලි: 598847**

நூலகச் செய்தி தொகுதி 4 இல 1-2 ஜனவரி/ஜூன், 1983

LIBRARY NEWS Vol. 4 No. 1-2 January/June, 1983

# Second Workshop in August

The Library Association's second International Summer Workshop is scheduled to be held at the Library Association in London from the 31st August to 9th September.

The Workshop of three seminars is intended for Librarians, information workers, administrators, teachers, manpower planners and similar persons concerned with information and library resources. Some of the leading personalities in the relevant subjects are expected to participate as resource persons in the seminar.

## WORKSHOP FOR LIBRARY AND INFORMATION SCIENCE TEACHERS

A workshop for Library and Information Science teachers, the first of its kind, was held in the Colombo Public Library Conference Hall from 05.04.83 to 07.04.83. The workshop was inaugurated by the Hon. Minister of Educational Services, Mr. Lionel Jayatileke. Mrs. Ann Irving, Senior Lecturer, Department of Library Studies, Loughborough University, England and Library Education Adviser, conducted the Workshop. The following topics were discussed during the workshop:—

| | |
|---|---|
| Teaching methods : | Lecturing styles |
| do. | Lecture structures |
| do. | Projects and research curriculum design and developemnt |
| Evaluating performance: | Assignments |
| do. | Examinations |
| Putting into action : | (i) Choosing methods |
| do | (ii) Planning work |

35 librarians who also work as part time lecturers in the library science course in the University of **Kelaniya and Colombo, Sri Lanka Library Association and Sri Lanka National Library Services Board** participated in the seminar. The Library Education and Training Division of the SLNLSB organised the workshop with the assistance of the British Council.

**පුස්තකාල ප්‍රවෘත්ති**
ත්‍රෛමාසික ප්‍රකාශනය :
ආරම්භය 1973
4 වන කලාපය අංක : 1–2
1983 ජනවාරි/ජුනි
සංස්කරණය හා ප්‍රකාශනය :
පුස්තකාල පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
සැ:යු:
මෙම ප්‍රකාශනයෙහි පළවන ලිපිවල සඳහන් අදහස් අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අදහස් නොවන අතර, ඒ පිළිබඳ වගකීම අදාළ ලේඛකයන් වෙත පැවරේ.
**කලාපයක මිල රු. 1.50**
**වාර්ෂික දායක මුදල: රු. 6.00 (තැ. ගා. සමග)**
දායක මුදල්
සභාපති,
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
නමට ලියනු මැනවි.
සියලුම ලිපි හා විමසීම්:
අධ්‍යක්ෂ/ලේකම්,
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
තැ. පෙ. 1764,
නිදහස් මාවත, කොළඹ 7. ටෙලි: 598847

**කුඩා කාර්මික...**

29 වන පිටුවෙන්

ඉතිහාසය පිළිබඳ පර්යේෂණ පුස්තකාල හැර අනෙක් පර්යේෂණ පුස්තකාලවලට වෙනත් පුස්තකාල වර්ගවලට වඩා ක්‍රම පුස්තකාල ද්‍රව්‍ය දිගු කලක් තබා ගැනීමට සිදුවේ. වැදගත් පාඨ ග්‍රන්ථවල මුල් මුද්‍රණ තවදුරටත් අවශ්‍ය වීමට ඉඩ ඇති හෙයින් ඒවා පුස්තකාලයේ වැඩිපුර ප්‍රයෝජනයට නොගැනෙන ස්ථානයක තැන්පත් කර තැබිය යුතුවේ. පොත් ඉවත් කිරීම සම්බන්ධයෙන් විස්තරයක් පසුව කෙරේ. විශේෂ ශුද්ධ විද්‍යා ක්ෂේත්‍රයේ නියැලි පර්යේෂණ ආයතන් වලින් නිකුත්වන කැපී පෙනෙන නිර්මාණ විශේෂයක් නම් පර්යේෂණ වාර්තාය. මෙම ප්‍රකාශන සැපයීම, ලැබීම් වාර්තා කිරීම, ගබඩා කිරීම, පිටපත් නිකුත් කිරීම ආදි කටයුතු කළ යුත්තේ පුස්තකාලය විසිනි. ලිපිවල මුද්‍රිත අතිරේක පිටපත් සඳහා ඇණවුම් ලැබෙන්නේ බොහෝවිට අදල කෘතිය හෝ සංග්‍රහයේ අවසාන ශෝධ්‍ය පත්‍ර සංස්කාරකවරයා වෙත යැවූ පසුවය. පුස්තකාලයාධිපතිවරයා විසින් කර්තෘන් සමඟ සාකච්ඡා කර ඔවුන්ට අවශ්‍ය පිටපත් සංඛ්‍යාව මුද්‍රණ ශිල්පියාට දැන්විය යුතුවේ.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින්, දෙහිවල, දුටුගැමුණු වීදියේ තිසර මුද්‍රණාලයේ මුද්‍රණය කරවන ලදී.

**National Digitization Project**

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/10/10
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : ...............

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ...............

Date : 2017/10/10

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*